# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT
# 2024








බන්ධනාගාර දෙපාර්තමේන්තුව
சிறைச்சாலைகள் திணைக்களம்
DEPARTMENT OF PRISONS

# ආදර්ශ පාඨය

ආරක්ෂාව, රැකවරණය, පුනරුත්ථාපනය

# කාර්යසාධන වාර්තාව 2024

## වැය ශීර්ෂ අංකය - 232

**සම්පාදනය**

සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය

**ප්‍රකාශනය**

බන්ධනාගාර මූලස්ථානය
150
බේස්ලයින් පාර
කොළඹ - 09.
දුරකථනය : 0114 677 177
ෆැක්ස් : 0114 677 180
ඊමේල් : prisons@sltnet.lk
වෙබ් : www.prisons.gov.lk

# 01

## ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය - 01


1.1. හැඳින්වීම 03

1.2. දැක්ම, මෙහෙවර, අරමුණ 04

1.3. ප්‍රධාන කාර්යයන 04

1.4. සංවිධාන ව්‍යුහය 05

1.4.1. කාර්ය මණ්ඩල තොරතුරු-2024 06

1.5. බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන හා එහි ව්‍යාප්තිය 08

1.6. බන්ධනාගාර මූලස්ථානයේ ප්‍රධාන අංශ 10

1.7. බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල 10

1.8. විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු 10


## රැඳවි පරිපාලන තොරතුරු - 11


1.2.1. 2024.01.01 සිට 2024.12.31 දක්වා උසාවි මගින් කෙලින්ම ඇතුලත් වූ රැඳවි සංඛ්‍යාව 13

1.2.2. 2024.12.31 දින උදෑසන විවෘතයට අනුව රැඳවි සංඛ්‍යාව 13

1.2.3. සෑම මසකම අවසන් දින අළුයම විවෘතයට අනුව රැඳවි සංඛ්‍යාව - 2024 15

1.2.4. රැඳවුම් භාරයේ සිටියදී මියගිය නේවාසික තොරතුරු - 2024 15

1.2.5. ජනාධිපති විශේෂ සමාව යටතේ නිදහස් කිරීම් - 2024 15

1.2.6. නිවාස නිවාඩු හා බලපත්‍ර මත මුදාහල නේවාසිකයින් සංඛ්‍යාව - 2024 15

1.2.7. අත්අඩංගුවෙන් පැනයාම්/මිදීයාම් පිළිබඳ විස්තරය - 2024 16

1.2.8. වෘත්තීය පුහුණු පාඨමාලා මූල්‍ය ප්‍රගතිය - 2024 17

1.2.9. බන්ධනාගාර ආයතනයන්හි කර්මාන්ත හා කෘෂිකර්මාන්ත අංශයන්හි මූල්‍ය ප්‍රගතිය 18

1.2.10. හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය විසින් බන්ධනාගාර ආයතන සෝදිසි කිරීමේදී අත්අඩංගුවට ගත් ද්‍රව්‍ය පිළිබඳ වාර්තාව 19


# 02

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම - 21


ප්‍රගතිය හා ඉදිරි දැක්ම 23

බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා සිදු කරන ලද සුවිශේෂී කාර්යයන් 37

# 03

## 2024.12.31 දිනෙන් අවසන් ව වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය - 43


3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 45

3.2. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 46

3.3. මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 47

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන 48

3.4.1. පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය 48

3.4.2. පොත්පත් වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශය 51

3.4.3. වාර්තා කිරීමේ පදනම 54

3.4.4. බැරකම් පිළිබඳ ප්‍රකාශය (I) 55

3.4.5. බැරකම් පිළිබඳ ප්‍රකාශය (II) 60

3.4.6. ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර වලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශය 60

3.4.7. අස්ථානගත වව්චර් පිළිබඳ ප්‍රකාශය 61

3.4.8. 2015.10.23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස් වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2024.12.31 දිනට තත්ව වාර්තාව 62

3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 62

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 62

3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 63

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 63

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව 64


# 04

## කාර්යසාධන දර්ශක - 97


4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 99


# 05

## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය - 101


5.1. හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු 103

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න 104

5.2.1. ඉලක්ක 16.2 සපුරා ගැනීමේ අභියෝග 104

5.2.2. ඉලක්ක 16.6 ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 107


# 06

## මානව සම්පත් පැතිකඩ - 109


6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 111

6.2. සේවක සංඛ්‍යා කළමනාකරණය (කරුණු දැක්වීම) 111

6.3. මානව සම්පත් සංවර්ධනය 112

6.4. ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන් දක්වන දායකත්වය 114


# 07

## අනුකූලතා වාර්තාව -115


7.1. අනුකූලතා වාර්තාව 117





# 01

# ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය


1.1. හැඳින්වීම 03

1.2. දැක්ම, මෙහෙවර, අරමුණ 04

1.3. ප්‍රධාන කාර්යයන 04

1.4. සංවිධාන ව්‍යුහය 05

1.4.1. කාර්ය මණ්ඩල තොරතුරු-2024 06

1.5. බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන හා එහි ව්‍යාප්තිය 08

1.6. බන්ධනාගාර මූලස්ථානයේ ප්‍රධාන අංශ 10

1.7. බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල 10

1.8. විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු 10


වැලිකඩ
1867 - WELIKADA -

## 1.1 හැඳින්වීම

1832 වසරේ දී බ්‍රිතාන්‍යය අධිරාජ්‍යවාදී යුගයේ ලංකාව පාලනය කළ කැමරන් ආණ්ඩුකාරවරයා විසින් හඳුන්වා දෙන ලද අධිකරණ ප්‍රතිසංස්කරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් බන්ධනාගාරය බිහි විය. ඒ අනුව 1844 අංක 18 දරණ නීති හා අධිකරණ ආඥා පනතට අනුව බ්‍රිතාන්‍ය බොස්ටල් ක්‍රමයට අනුරූපව වැලිකඩ බන්ධනාගාරය ගොඩනැගුනි. මෙම සේවාව 1877 අංක 16 දරණ බන්ධනාගාර පනතට අනුව 1905 ජූලි 16 දින සිට බන්ධනාගාර කොමසාරිස්වරයකු යටතේ පාලනය වන වෙනම දෙපාර්තමේන්තුවක් ලෙස ක්‍රමවත් හා විධිමත් විය. සමාජ විකාශනයත් සමඟ මෙම සේවාවේ අවශ්‍යතාව තීව්‍ර විය. එහි ප්‍රතිඵලයක් ලෙස 1875 දී එංගලන්ත බීන් හිල්ඩ් බන්ධනාගාර ආකෘතියට අනුව බෝගම්බර බන්ධනාගාරය ඉදිවිය. මෙලෙස විකාශිත බන්ධනාගාර පද්ධතිය වර්තමාන සමාජ සංකීර්ණත්වය හමුවේ සුවිශේෂී වූත් අත්‍යාවශ්‍ය වූත් ආයතනයක් බවට පත්ව තිබේ. මේ අනුව දිවයින පුරා විසිරී ආරක්ෂිත බන්ධනාගාර 04ක්, රිමාන්ඩ් බන්ධනාගාර 18ක්, තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන 02ක්, වැඩ කඳවුරු 10ක්, විවෘත වැඩ කඳවුරු 02ක්, සිර මැදිරි 23ක් බන්ධනාගාර පාසල් 01ක් ද බන්ධනාගාර අධිකාරීවරුන් යටතේ පාලනය වේ. සිරකරුවන් සහ සැකකරුවන් 28,271ක් පමණ ඔවුන්ගේ රැකවරණය යටතේ සිටී.

2024 වර්ෂයේ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ පාලනය වූ මෙම දෙපාර්තමේන්තුව ප්‍රාරම්භක යුගයේ දී සිරකරුවන්ට ආරක්ෂණය හා රැකවරණය ලබා දුන්නද වර්තමානයේ ඉන් ඔබ්බට යමින් සිරකරුවන් මනා පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කරවන සමාජ ශෝධනාගාරයක් බවට පත්ව ඇත. එහිදී යහපුද්ගල සමාජානුයෝජනාගාරයක් වූ බන්ධනාගාර දෙපාර්තමේන්තුව සිපිරි දැත් සපිරි කරමින් පුනරුත්ථාපනය කර යහපත් පුරවැසියන් ලෙස සමාජ ගත කිරීමට 2024 වසරේ දී ගත් උත්සාහය කාර්යය සාධන වාර්තාව මගින් නිරූපනය කිරීමට උත්සාහ ගෙන ඇත.

> **"**
>
> **මෙම දෙපාර්තමේන්තුව ප්‍රාරම්භක යුගයේ සිරකරුවන්ට ආරක්ෂණය හා රැකවරණය ලබා දුන්නද වර්තමානයේ ඉන් ඔබ්බට යමින් සිරකරුවන් මනා පුනරුත්ථාපන ක්‍රියාවලිකට යොමු කරවන සමාජ ශෝධනාගාරයක් බවට පත් වී ඇත.**

## 1.2 දැක්ම, මෙහෙවර, අරමුණ



### දැක්ම

නේවාසිකයින් පුනරුත්ථාපනය තුළින් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරිම



### මෙහෙවර

ආරක්ෂාව, රැකවරණය, පුනරුත්ථාපනය යන මූලික අරමුණු ඉටුකර ගැනීම උදෙසා නේවාසිකයින් හා බන්ධනාගාර නිලධාරීන් අතර මනා සම්බන්ධතාවයක් නිර්මාණය කරමින් ධනාත්මක චින්තනයක් ගොඩනගා නිලධාරීන්ගේ රැකියා තෘප්තිය වැඩි කිරීම තුළින් සහ සිරකරුවන්ගේ සුභසාධක කටයුතු විධිමත් කිරීම තුළින් ඔවුන්ගේ ශ්‍රම ඵලදායීතාවය රටට වැඩදායී ලෙස යොදාගැනීම



### අරමුණු

- බන්ධනාගාර නේවාසිකයින් විධිමත් පුනරුත්ථාපනය මගින් නීති ගරුක මානව හිතවාදී පුද්ගලයන් බවට පත් කර ශිෂ්ඨ සම්පන්න සමාජයක් බිහි කිරීමට දායක වීම.
- බන්ධනාගාර නිලධාරීන් අභිප්‍රේරණය සහ දෙපාර්තමේන්තු කණ්ඩායම් හැඟීම ගොඩනැගීම

## 1.3 ප්‍රධාන කාර්යයන

1. රට තුළ කවර හෝ අධිකරණයක අධිකාරි බලය යටතේ බන්ධනාගාර ගත කරන ලද හෝ රිමාණ්ඩ් භාරයට පත් කරන ලද සෑම තරාතිරමකම සිරකරුවන් පිළිගැනීම සහ බන්ධනාගාර නීතිරීති වලට අනුකූලව ඔවුන්ගේ ආරක්ෂාව, රැකවරණය, හා පුනරුත්ථාපනය සැලසීම සහ අධිකරණ වලට රිමාණ්ඩ් සිරකරුවන් ඉදිරිපත් කිරීම.
2. සියළුම බන්ධනාගාර සිර කඳවුරු හා චරිත ශෝධනාගාර සම්බන්ධ පොදු විධානය හා මනා පරිපාලනය සැලැස්වීම.
3. සියළුම බන්ධනාගාර සිර කඳවුරු හා චරිත ශෝධනාගාර වල රැඳවියන් සඳහා කාර්මික, කෘෂිකාර්මික, සත්ව පාලනය හා වෘත්තීය පුහුණුව ලබාදීම.
4. සියළුම බන්ධනාගාර සිර කඳවුරු හා චරිත ශෝධනාගාර සඳහා සුභසාධක සේවා සැපයීම.
5. විශෝධන ක්ෂේත්‍රය සවිමත් කිරීමට අවශ්‍ය පුහුණු කිරීම් සඳහා විධිවිධාන සැලසීම.
6. කාලීන අවශ්‍යතාවට ගැලපෙන පරිදි රැඳවියන් පුනරුත්ථාපනය කර යහපත් පුරවැසියන් ලෙස පිටත් වීමට අවශ්‍ය සමාජ පසුබිම සැකසීම.
7. බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අදාළව බන්ධනාගාර තදබදය අවම කිරීම, නවීන තාක්ෂණය හඳුන්වා දීම, භෞතික සම්පත් වැඩිදියුණු කිරීම හා යටිතල පහසුකම් සංවර්ධනය
8. සේවා අංශයන්ට අදාළ පුහුණු හා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම තුළින් මනා පරිචයකින් හා සේවා තෘප්තියකින් යුත් නිලධාරීන් බිහි කිරීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය.
9. රැඳවි පරිපාලන කටයුතු වඩාත් විධිමත්ව හා කාර්යක්ෂමව ඉටු කිරීම උදෙසා රැඳවියන්ගේ තොරතුරු කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීම.

## 1.4. සංවිධාන සටහන

### සංවිධාන ව්‍යුහය - බන්ධනාගාර දෙපාර්තමේන්තුව




| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කෙටි යෙදුම් | | | | | | | | | | | |
| බකොජ | බන්ධනාගාර කොමසාරිස් ජනරාල් | | අ(ක්‍රි) | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) | (ශ්‍රීලක්‍රසේ - I) | සඅ(කෘෂි) | සහකාර අධ්‍යක්ෂ (කෘෂිකර්ම) | පුනි-I | I පෙළ පුනරුත්ථාපන නිලධාරී | ශ්‍රදෘස | ශ්‍රව්‍ය දෘෂ්‍ය සහකාර |
| අතිබකොජ | අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල් | (බන්ධ:සේ) | ග(අ.වි) | ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) | (ශ්‍රීලගසේ - I) | සබඅ | සහකාර බන්ධනාගාර අධිකාරී | පු | පුස්තකාලයාධිපති | කෘඋ | කෘෂි උපදේශක |
| බ.කො (මා.ස.ස) | බන්ධනාගාර කොමසාරිස් (මානව සම්පත් සංවර්ධන) | (ශ්‍රීලපසේ - I) | නි/ස බ.කො | නියෝජ්‍ය/සහකාර බන්ධනාගාර කොමසාරිස් | (ශ්‍රීලපසේ -II/III) | සබඅ(පු) | සහකාර බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන) | වැප | වැඩ පරීක්ෂක | කවැමු | කර්මාන්ත වැඩ මූලික |
| අ(සෞ) | අධ්‍යක්ෂ (සෞඛ්‍ය) | (වෛද්‍යපසේ) | ජ්‍යෙෂ්ඨබඅ | ජ්‍යෙෂ්ඨ බන්ධනාගාර අධිකාරී | | භා.ප | භාෂා පරිවර්ථක | ස.නි | සංවර්ධන නිලධාරී | සැ | සැරයන් |
| බ.කො (පුන) | බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) | (බන්ධ:සේ) | ජ්‍යෙෂ්ඨබඅ ප.වි.පු.ම | ජ්‍යෙෂ්ඨ බන්ධනාගාර අධිකාරී (පුහුණු) | | ප.නි | පරිපාලන නිලධාරී | තොසතාස -II | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර - II ශ්‍රේණිය | කසේනි-II | කලමණාකරණ සේවා නිලධාරී-IIශ්‍රේණිය |
| බ.කො(ක්‍රි) | බන්ධනාගාර කොමසාරිස් (ක්‍රියාකාරී) | (බන්ධ:සේ) | නීනි | නීති නිලධාරී | | ප්‍ර.ජේ | ප්‍රධාන ජේලර් | කසේනි-I | කලමණාකරණ සේවා නිලධාරී -I ශ්‍රේණිය | නි | නියාමක |
| බ.කො (බු.ආ) | බන්ධනාගාර කොමසාරිස් (බුද්ධි හා ආරක්ෂක) | (බන්ධ:සේ) | සඅ(සෞ) | සහකාර අධ්‍යක්ෂ (සෞඛ්‍ය) | | ප්‍රපුනි | ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරී | ජේ-II | II පෙළ ජේලර් | තොසතාස -III | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර - III ශ්‍රේණිය |
| බ.කො (නි.ස.වෘ.පු) | බන්ධනාගාර කොමසාරිස් (නිපුනතා සංවර්ධන හා වෘත්තීය පුහුණු) | (බන්ධ:සේ) | ඉ(සි) | ඉංජිනේරු (සිවිල්) | (ශ්‍රීලඉසේ -II/III) | හෙ.නි (වි.ශ්‍රේ) | හෙද නිලධාරී - අධිශ්‍රේණිය | පුනි-II | II පෙළ පුනරුත්ථාපන නිලධාරී | මෝරි | මෝටර් රියදුරු |
| ග | ප්‍රධාන ගණකාධිකාරී | (ශ්‍රීලගසේ - I) | ඉ(යා) | ඉංජිනේරු (යාන්ත්‍රික) | (ශ්‍රීලඉසේ -II/III) | සං.නි | සංඛ්‍යාලේඛණ නිලධාරී | සැ.ශි | සැලසුම් ශිල්පී (ශ්‍රීලතාසේ - II) | වධක | වධක |
| අ(ඉ) | අධ්‍යක්ෂ (ඉංජිනේරු) | (ශ්‍රීලඉසේ - I) | සඅ/නිඅ(ක්‍ර) | සහ:/නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) | (ශ්‍රීලක්‍රසේ -II/III) | ප්‍රවැප | ප්‍රධාන වැඩ පරීක්ෂක | උවැප | උප වැඩ පරීක්ෂක | කා.කා.ස | කාර්යාල කාර්ය සහයක |
| බ.කො(සැ) | බන්ධනාගාර කොමසාරිස් (සැපයුම්) | (බන්ධ:සේ) | සඅ(තොසතා) | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | (ශ්‍රීලතොසතාසේ -II/III) | ජේ-I | I පෙළ ජේලර් | මසප | මහජන සෞඛ්‍ය පරීක්ෂක | | |

## 1.4.1 කාර්ය මණ්ඩල තොරතුරු (2024.12.31 දිනට)

| අනු අංකය | තනතුර සහ නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | | |
| 01 | බන්ධනාගාර කොමසාරිස් ජනරාල් | 1 | 1 | 0 | 0 |
| 02 | අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල් | 1 | 0 | 1 | 0 |
| 03 | බන්ධනාගාර කොමසාරිස් | 1 | 1 | 0 | 0 |
| 04 | බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) | 5 | 4 | 1 | 0 |
| 05 | අධ්‍යක්ෂ (සැලසුම්) | 1 | 0 | 1 | 0 |
| 06 | අධ්‍යක්ෂ (ඉංජිනේරු) | 1 | 0 | 1 | 0 |
| 07 | ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | 0 | 0 |
| 08 | ස. කොමසාරිස් / නි. කොමසාරිස් | 1 | 0 | 1 | 0 |
| 09 | සහකාර අධ්‍යක්ෂ /නි. අධ්‍යක්ෂ (සැලසුම්) | 1 | 1 | 0 | 0 |
| 10 | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 1 | 1 | 0 | 0 |
| 11 | සහකාර අධ්‍යක්ෂ ( කෘෂිකර්ම ) | 1 | 0 | 1 | 0 |
| 12 | ගණකාධිකාරී | 4 | 2 | 2 | 0 |
| 13 | අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 | 0 |
| 14 | බන්ධනාගාර අධිකාරී (විශේෂ ශ්‍රේණිය) | 7 | 1 | 6 | 0 |
| 15 | බන්ධනාගාර අධිකාරී | 19 | 4 | 15 | 0 |
| 16 | බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන) - පිරිමි | 2 | 2 | 0 | 0 |
| | බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන) - කාන්තා | 1 | 0 | 1 | 0 |
| 17 | සහකාර බන්ධනාගාර අධිකාරී (පිරිමි) | 40 | 16 | 24 | 0 |
| | සහකාර බන්ධනාගාර අධිකාරී (කාන්තා) | 2 | 0 | 2 | 0 |
| 18 | නීති නිලධාරී | 1 | 1 | 0 | 0 |
| 19 | ඉංජිනේරු (සිවිල් ) | 2 | 2 | 0 | 0 |
| 20 | ඉංජිනේරු (යාන්ත්‍රික) | 2 | 1 | 1 | 0 |
| 21 | අධ්‍යක්ෂ (වෛද්‍ය) | 1 | 0 | 1 | 0 |
| 22 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (වෛද්‍ය) | 1 | 1 | 0 | 0 |
| 23 | වෛද්‍ය නිලධාරී | 40 | 57 | 0 | 17 |
| 24 | දන්ත වෛද්‍ය නිලධාරී | 4 | 3 | 1 | 0 |
| | **එකතුව** | **142** | **100** | **59** | **17** |
| | **තෘතීයික මට්ටම** | | | | |
| 25 | පරිපාලන නිලධාරී | 2 | 1 | 1 | 0 |
| 26 | ප්‍රධාන වැඩ පරීක්ෂක | 1 | 0 | 1 | 0 |
| 27 | විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී | 1 | 0 | 1 | 0 |
| 28 | භාෂා පරිවර්තක | 3 | 2 | 1 | 0 |
| 29 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 1 | 1 | 0 | 0 |
| 30 | සංඛ්‍යාලේඛන නිලධාරී | 1 | 1 | 0 | 0 |
| 31 | ප්‍රධාන ජේලර් ( කාන්තා ) | 3 | 1 | 2 | 0 |
| 32 | ප්‍රධාන ජේලර් ( පිරිමි ) | 30 | 29 | 1 | 0 |
| 33 | I පෙළ ජේලර් ( කාන්තා ) | 4 | 3 | 1 | 0 |
| 34 | I පෙළ ජේලර් ( පිරිමි) | 59 | 53 | 6 | 0 |
| 35 | ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරී ( පිරිමි ) | 5 | 2 | 3 | 0 |
| 36 | ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරී (කාන්තා) | 2 | 2 | 0 | 0 |
| 37 | පුනරුත්ථාපන නිලධාරී (I පෙළ) | 11 | 8 | 3 | 0 |
| 38 | පුනරුත්ථාපන නිලධාරී (I පෙළ) - කාන්තා | 2 | 1 | 1 | 0 |
| 39 | ලියාපදිංචි /සහකාර වෛද්‍ය නිලධාරී | 19 | 13 | 6 | 0 |
| 40 | ඖෂධ සංයෝජක ( විශේෂ ශ්‍රේණිය ) | 4 | 0 | 4 | 0 |
| | **එකතුව** | **148** | **117** | **31** | **00** |
| | **ද්විතීයික මට්ටම** | | | | |
| 41 | සංවර්ධන නිලධාරී | 93 | 91 | 2 | 0 |
| | සැලසුම් සහකාර | 1 | 1 | 0 | 0 |
| 42 | උපදේශන නිලධාරී | 7 | 0 | 7 | 0 |
| 43 | වැඩ පරීක්ෂක | 5 | 0 | 5 | 0 |
| 44 | පුස්තකාලාධිපති | 1 | 0 | 1 | 0 |

| අනු අංකය | තනතුර සහ නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | **ද්විතීයික මට්ටම** | | | | |
| 45 | තාක්ෂණ නිලධාරී ( කාර්මික ) | 1 | 0 | 1 | 0 |
| 46 | සැලසුම් ශිල්පී | 2 | 1 | 1 | 0 |
| 47 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 5 | 1 | 4 | 0 |
| 48 | උප වැඩ පරීක්ෂක | 10 | 5 | 5 | 0 |
| 49 | කළමණාකරණ සේවා නිලධාරි | 80 | 43 | 37 | 0 |
| 50 | භාෂණ පරිවර්තක | 2 | 0 | 2 | 0 |
| 51 | කර්මාන්ත වැඩ මූලික | 19 | 16 | 3 | 0 |
| 52 | කර්මාන්ත පරිපාලක | 17 | 15 | 2 | 0 |
| 53 | I පෙළ වෘත්තීය උපදේශක නිලධාරි<br>II පෙළ වෘත්තීය උපදේශක නිලධාරී | 120 | 50 | 70 | 0 |
| 54 | කෘෂි උපදේශක | 19 | 6 | 13 | 0 |
| 55 | කෘෂිකර්ම ඕවර්සියර් | 28 | 0 | 28 | 0 |
| 56 | ශ්‍රව්‍යදෘශ්‍ය සහකාර | 1 | 0 | 1 | 0 |
| 57 | ඖෂධ සංයෝජක ( I, II, III, ශ්‍රේණිය ) | 82 | 52 | 30 | 0 |
| 58 | රසායනාගාර කාර්මික විද්‍යාඥ | 4 | 1 | 3 | 0 |
| 59 | හෙද නිලධාරී (අධි ශ්‍රේණිය) | 8 | 0 | 8 | 0 |
| | හෙද නිලධාරී ( III, II, I ) | 70 | 35 | 35 | 0 |
| 60 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | 4 | 7 | 0 | 3 |
| 61 | II පෙළ පුනරුත්ථාපන නිලධාරී (පිරිමි) | 109 | 87 | 22 | 0 |
| 62 | II පෙළ පුනරුත්ථාපන නිලධාරී (කාන්තා) | 25 | 19 | 6 | 0 |
| 63 | II පෙළ ජේලර් ( කාන්තා) | 30 | 15 | 15 | 0 |
| 64 | II පෙළ ජේලර් ( පිරිමි) | 446 | 326 | 120 | 0 |
| 65 | සරඹ උපදේශක | 1 | 1 | 0 | 0 |
| 66 | සැරයන් (කාන්තා ) | 38 | 20 | 18 | 0 |
| 67 | සැරයන් ( පිරිමි ) | 894 | 556 | 338 | 0 |
| 68 | නියාමක (කාන්තා ) | 594 | 479 | 115 | 0 |
| 69 | නියාමක ( පිරිමි )<br>නියාමක (අනියම්) | 4447 | 3720<br>2 | 725 | 0 |
| | **එකතුව** | **7163** | **5549** | **1617** | **3** |
| | **ප්‍රාථමික මට්ටම** | | | | |
| 70 | ඡායාරූප ශිල්පී | 1 | 0 | 1 | 0 |
| 71 | සංස්කරණ ශිල්පී | 1 | 0 | 1 | 0 |
| 72 | මෝටර් රියදුරු ( දෙපාර්තමේන්තු ගත ) | 222 | 204 | 18 | 0 |
| 73 | මෝටර් රියදුරු ( ඒකාබද්ධ සේවය) | 5 | 2 | 3w | 0 |
| 74 | ගිලන් රථ රියදුරු | 3 | 0 | 3 | 0 |
| 75 | මෝටර් කාර්මික | 10 | 3 | 7 | 0 |
| 76 | මෝටර් කාර්මික ( විදුලි ) | 4 | 1 | 3 | 0 |
| 77 | මෝටර් කාර්මික ( වැද්දුම් ) | 2 | 0 | 2 | 0 |
| 78 | මෝටර් කාර්මික ( පින්තාරු ) | 2 | 0 | 2 | 0 |
| 79 | ට්‍රැක්ටර් රියදුරු | 26 | 16 | 10 | 0 |
| 80 | ත්‍රිවිල් රියදුරු | 8 | 7 | 1 | 0 |
| 81 | කාර්යාල සේවක සේවය | 36 | 23 | 13 | 0 |
| 82 | මුරකරු | 52 | 35 | 17 | 0 |
| 83 | වධක | 2 | 2 | 0 | 0 |
| 84 | කම්කරු | 35 | 16 | 19 | 0 |
| 85 | වතුර පොම්ප ක්‍රියාකරු | 10 | 7 | 3 | 0 |
| | **එකතුව** | **419** | **316** | **103** | **00** |
| | **මුළු එකතුව** | **7872** | **6082** | **1810** | **20** |

## 1.5 ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන හා එහි ව්‍යාප්තිය



1. බන්ධනාගාර මූලස්ථානය
2. පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය

## ආරක්ෂිත බන්ධනාගාර - 04

1. වැලිකඩ
2. බෝගම්බර
3. මහර
4. අඟුණකොලපැලැස්ස

## රිමාන්ඩ් බන්ධනාගාර - 18

1. අනුරාධපුරය
2. කොළඹ
3. කළුතර
4. මීගමුව
5. ගාල්ල
6. නව මැගසින්
7. බදුල්ල
8. මාතර
9. මඩකලපුව
10. කෑගල්ල
11. ත්‍රිකුණාමලය
12. යාපනය
13. කුරුවිට
14. බූස්ස
15. මොණරාගල
16. පොලොන්නරුව
17. වාරියපොල
18. වව්නියාව

## වැඩ කඳවුරු - 10

1. හෝමාගම
2. මීතිරිගල
3. වීරවිල
4. කුරුවිට
5. වාරියපොල
6. හංගිලිපොල
7. කන්දෙවත්ත
8. කඳුරුගස්ආර
9. පිටබැද්දර
10. අඹේපුස්ස

## විවෘත වැඩ කඳවුරු - 02

1. පල්ලෙකැලේ
2. අනුරාධපුර

## තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථාන - 03

1. පල්ලන්සේන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය
2. තල්දෙන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය
3. වටරැක තරුණ වරදකරුවන්ගේ පුහුණු පාසල

## බන්ධනාගාර සිර මැදිරි - 23

1. අම්පාර
2. අවිස්සාවේල්ල
3. බලංගොඩ
4. බලපිටිය
5. හලාවත
6. ඇල්පිටිය
7. ඇඹිලිපිටිය
8. ගම්පහ
9. ගම්පොල
10. හම්බන්තොට
11. හැටන්
12. කල්මුනේ
13. කිලිනොච්චිය
14. කුලියාපිටිය
15. කුරුණෑගල
16. මහව
17. මන්නාරම
18. මාතලේ
19. මුලතිවු
20. නුවරඑළිය
21. පානදුර
22. පේදුරු තුඩුව
23. පුත්තලම

## 1.6 බන්ධනාගාර මූලස්ථානයේ ප්‍රධාන අංශ

1. පාලන අංශය
2. මූල්‍ය අංශය
3. මෙහෙයුම් අංශය
4. පුනරුත්ථාපන හා නිපුණතා සංවර්ධන අංශය
5. ඉංජිනේරු අංශය
6. සැලසුම් හා තොරතුරු තාක්ෂණ අංශය
7. සැපයුම් හා සේවා අංශය
8. මානව සම්පත් අංශය
9. බුද්ධි හා ආරක්ෂණ අංශය
10. අභ්‍යන්තර විගණන අංශය
11. රජයේ විගණන අංශය
12. සංඛ්‍යාලේඛන අංශය
13. කර්මාන්ත අංශය
14. නිලධාරි සුභසාධක අංශය
15. ප්‍රවාහන අංශය
16. නීති අංශය

## 1.7 බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල

☑ රජයේ ඒකාබද්ධ අරමුදල

## 1.8 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු (තිබේ නම්)

☒ නැත



# රැඳවි පරිපාලන තොරතුරු


1.2.1. 2024.01.01 සිට 2024.12.31 දක්වා උසාවි මගින් කෙලින්ම ඇතුලත් වූ රැඳවි සංඛ්‍යාව 13

1.2.2. 2024.12.31 දින උදෑසන විවෘතයට අනුව රැඳවි සංඛ්‍යාව 13

1.2.3. සෑම මසකම අවසන් දින අළුයම විවෘතයට අනුව රැඳවි සංඛ්‍යාව - 2024 15

1.2.4. රැඳවුම් භාරයේ සිටියදී මියගිය නේවාසික තොරතුරු - 2024 15

1.2.5. ජනාධිපති විශේෂ සමාව යටතේ නිදහස් කිරීම් - 2024 15

1.2.6. නිවාස නිවාඩු හා බලපත්‍ර මත මුදාහල නේවාසිකයින් සංඛ්‍යාව - 2024 15

1.2.7. අත්අඩංගුවෙන් පැනයාම්/මිදීයාම් පිළිබඳ විස්තරය - 2024 16

1.2.8. වෘත්තීය පුහුණු පාඨමාලා මූල්‍ය ප්‍රගතිය - 2024 17

1.2.9. බන්ධනාගාර ආයතනයන්හි කර්මාන්ත හා කෘෂිකර්මාන්ත අංශයන්හි මූල්‍ය ප්‍රගතිය 18

1.2.10. හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය විසින් බන්ධනාගාර ආයතන සෝදිසි කිරීමේදී අත්අඩංගුවට ගත් ද්‍රව්‍ය පිළිබඳ වාර්තාව 19

## 1.2.1 2024.01.01 සිට 2024.12.31 දක්වා උසාවි මගින් කෙලින්ම ඇතුලත් වූ රැඳවි සංඛ්‍යාව

**සිර සංඛ්‍යාව**




**සැක සංඛ්‍යාව**




## 1.2.2 2024.12.31 දින උදෑසන විවෘතයට අනුව රැඳවි සංඛ්‍යාව

| 2024 | | | සිරකරුවන් | 2023 | | |
|---|---|---|---|---|---|---|
| පිරිමි | කාන්තා | එකතුව | | පිරිමි | කාන්තා | එකතුව |
| 778 | 18 | 796 | මරණීය දණ්ඩනය නියම වූ (දේශීය) | 731 | 15 | 746 |
| 05 | - | 05 | මරණීය දණ්ඩනය නියම වූ (විදේශීය) | 05 | - | 05 |
| 01 | - | 01 | මරණීය දණ්ඩනය නියම වූ ( ත්‍රස්ත ) | 01 | - | 01 |
| 62 | 07 | 69 | ජීවිතාන්ත සිරකරුවන් (විදේශීය ) | 220 | 22 | 242 |
| 208 | 27 | 235 | ජීවිතාන්ත සිරකරුවන් ( දේශීය ) | 63 | 12 | 75 |
| 03 | - | 03 | ජීවිතාන්ත සිරකරුවන් ( ත්‍රස්ත ) | 02 | - | 02 |
| 7,183 | 131 | 7,314 | සාමාන්‍ය සිරකරුවන් ( දේශීය ) | 7,608 | 124 | 7,732 |
| 89 | 06 | 95 | සාමාන්‍ය සිරකරුවන් ( විදේශීය ) | 10 | - | 10 |
| 01 | - | 01 | සාමාන්‍ය සිරකරුවන් ( ත්‍රස්ත ) | 01 | - | 01 |
| 8 | - | 08 | තරුණ වරදකරුවන් | 12 | - | 12 |
| **8,338** | **189** | **8,527** | **සමස්ථ සිරකරුවන් සංඛ්‍යාව** | **8,653** | **173** | **8,826** |



| 2024 | | | සිරකරුවන් (අභියාචනා) | 2023 | | |
|---|---|---|---|---|---|---|
| පිරිමි | කාන්තා | එකතුව | | පිරිමි | කාන්තා | එකතුව |
| 379 | 08 | 387 | මරණීය දණ්ඩනය නියම වූ (දේශීය) | 432 | 10 | 442 |
| 01 | - | 01 | මරණීය දණ්ඩනය නියම වූ (විදේශීය) | 01 | - | 01 |
| - | - | - | මරණීය දණ්ඩනය නියම වූ ( ත්‍රස්ත ) | - | - | - |
| 75 | 04 | 79 | ජීවිතාන්ත සිරකරුවන් (විදේශීය ) | 87 | 10 | 97 |
| - | - | - | ජීවිතාන්ත සිරකරුවන් ( දේශීය ) | 01 | - | 01 |
| 02 | - | 02 | ජීවිතාන්ත සිරකරුවන් ( ත්‍රස්ත ) | 05 | - | 05 |
| 294 | 03 | 297 | සාමාන්‍ය සිරකරුවන් ( දේශීය ) | 261 | 06 | 267 |
| - | - | - | සාමාන්‍ය සිරකරුවන් ( විදේශීය ) | - | 01 | 01 |
| - | - | - | සාමාන්‍ය සිරකරුවන් ( ත්‍රස්ත ) | - | - | - |
| **751** | **15** | **766** | සමස්ථ අභියාචනා සිරකරුවන් සංඛ්‍යාව | **787** | **27** | **814** |







| 2024 | | | සැකකරුවන් | 2023 | | |
|---|---|---|---|---|---|---|
| පිරිමි | කාන්තා | එකතුව | | පිරිමි | කාන්තා | එකතුව |
| 17,837 | 962 | 18,799 | සැකකරුවන් ( දේශීය ) | 19,921 | 1,080 | 21,001 |
| 140 | 13 | 153 | සැකකරුවන් ( විදේශීය ) | 193 | 07 | 200 |
| 33 | - | 33 | සැකකරුවන් ( ත්‍රස්ත ) | 41 | 01 | 42 |
| **18,010** | **975** | **18,985** | සමස්ථ සැකකරුවන් සංඛ්‍යාව | **20,155** | **1,088** | **21,243** |

| 2024 | | | සමස්ථ රැඳවි සංඛ්‍යාව | 2023 | | |
|---|---|---|---|---|---|---|
| පිරිමි | කාන්තා | එකතුව | | පිරිමි | කාන්තා | එකතුව |
| 18,010 | 975 | 18,985 | සියළුම සැකකරුවන් | 20,155 | 1,088 | 21,243 |
| 9,089 | 204 | 9,293 | සියළුම සිරකරුවන් | 9,440 | 200 | 9,640 |
| **27,099** | **1,179** | **28,278** | එකතුව | **29,595** | **1,288** | **30,883** |




2024




2023

## 1.2.3 සෑම මසකම අවසන් දින අළුයම විචලනයට අනුව රැඳවි සංඛ්‍යාව - 2024




2024 වර්ෂය : A1 - සැක (පිරිමි) A2 - සිර (පිරිමි) A3 - සැක (කාන්තා) A4 - සිර (කාන්තා)
2023 වර්ෂය : B1 - සැක (පිරිමි) B2 - සිර (පිරිමි) B3 - සැක (කාන්තා) B4 - සිර (කාන්තා)

## 1.2.4 රැඳවුම් භාරයේ සිටියදී මියගිය නේවාසික තොරතුරු - 2024

| 2024 | | | මියගිය නේවාසික තොරතුරු | 2023 | | |
|---|---|---|---|---|---|---|
| පිරිමි | කාන්තා | එකතුව | | පිරිමි | කාන්තා | එකතුව |
| 53 | 01 | 54 | සාමාන්‍ය සිර | 71 | 02 | 73 |
| 10 | - | 10 | ම.දැ.නි. සිර | 10 | - | 10 |
| 08 | 02 | 10 | ජීවිතාන්ත සිර | 04 | - | 04 |
| 106 | 04 | 110 | සැකකරුවන් | 119 | 03 | 122 |
| **177** | **06** | **184** | එකතුව | **204** | **05** | **209** |




## 1.2.5 ජනාධිපති විශේෂ සමාව යටතේ නිදහස් කිරීම් - 2024

| 2024 | | | නිදහස් කිරීම | 2023 | | |
|---|---|---|---|---|---|---|
| පිරිමි | කාන්තා | එකතුව | | පිරිමි | කාන්තා | එකතුව |
| 876 | - | 876 | ජාතික නිදහස් දිනය වෙනුවෙන් | 626 | 14 | 640 |
| 922 | - | 922 | සිංහල අළුත් අවුරුදු දිනය වෙනුවෙන් | - | - | - |
| 269 | - | 269 | වෙසක් පොහොය දින වෙනුවෙන් | 1,004 | 08 | 1,012 |
| 289 | - | 289 | පොසොන් පොහොය දින වෙනුවෙන් | 474 | 04 | 478 |
| 358 | - | 358 | සිරකරු දිනය වෙනුවෙන් | 976 | 07 | 983 |
| 389 | - | 389 | නත්තල් දින සමාව | 986 | 15 | 1,001 |
| 02 | - | 02 | ජනාධිපති විශේෂ සමාව (LTTE) | 06 | - | 06 |
| **3,105** | **-** | **3,105** | එකතුව | **4,072** | **48** | **4,120** |




## 1.2.6 නිවාස නිවාඩු හා බලපත්‍ර මත මුදාහල නේවාසිකයින් සංඛ්‍යාව - 2024

| 2024 | මුදා හල නේවාසිකයින් සංඛ්‍යාව | 2023 |
|---|---|---|
| 296 | නිවාස නිවාඩු යවන ලද | 234 |
| 166 | බලපත්‍ර මත මුදා හැරීම් | 125 |
| **462** | එකතුව | **359** |



## 1.2.7 අත්අඩංගුවෙන් පැනයාම්/ මිදියාම් පිළිබඳ විස්තරය - 2024

| පැනයාම් සහ මිදී යෑම් පිළිබඳ විස්තරය | 2024 | 2023 |
|---|---|---|
| මිදී යාම් සිර | 122 | 158 |
| පැනයාම් සිර | 09 | 13 |
| පැනයාම් සැක | 57 | 36 |
| **එකතුව** | **188** | **207** |
| **නැවත අත් අඩංගුවට ගැනීම්** | **65** | **79** |







| අනු අංකය | ආයතනය | මිදී යාම් සිර | | | පැන යාම් සිර | | | | පැනයාම් සැක | | | | පැනගිය සිර සංඛ්‍යාව | පැනගිය සැක සංඛ්‍යාව | මුළු සිර /සැක සංඛ්‍යාව | නැවත අත් අඩංගුවට ගැනීම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | නිවාස නිවාඩු | කඳවුරු සේවයේ යොදවා සිටියදී | ශ්‍රමදාන හා ඝටක සේවයේ දී | රෝහල්වලින් | බන්ධනාගාරයෙන් | අධිකරණ වලින් | ආරක්ෂණ අතරතුර | රෝහල්වලින් | බන්ධනාගාරයෙන් | අධිකරණ වලින් | ආරක්ෂණ අතරතුර | | | | |
| 1 | වැලිකඩ බන්ධනාගාරය | - | - | 07 | - | 01 | - | - | 01 | - | - | - | **08** | **01** | **09** | **01** |
| 2 | මැගසින් බන්ධනාගාරය | - | - | 01 | - | - | - | - | 01 | - | 01 | - | **01** | **02** | **03** | **02** |
| 3 | කොළඹ රිමාණ්ඩ් බන්ධනාගාරය | - | - | - | - | - | - | - | 03 | 01 | - | - | **-** | **04** | **04** | **01** |
| 4 | මහර බන්ධනාගාරය | - | 01 | 02 | - | - | - | - | 03 | - | 05 | - | **03** | **08** | **11** | **04** |
| 5 | නව දුම්බර බන්ධනාගාරය | 01 | - | - | - | - | - | - | 02 | - | 03 | 04 | **01** | **09** | **10** | **03** |
| 6 | අනුරාධපුර බන්ධනාගාරය | - | 10 | - | - | - | - | - | 01 | - | - | - | **10** | **01** | **11** | **02** |
| 7 | බදුල්ල බන්ධනාගාරය | - | - | 01 | - | - | - | - | - | - | - | - | **01** | **-** | **01** | **-** |
| 8 | බූස්ස බන්ධනාගාරය | - | - | 03 | - | - | - | - | - | - | - | - | **03** | **-** | **03** | **03** |
| 9 | ගාල්ල බන්ධනාගාරය | - | 01 | 01 | - | - | - | - | 01 | - | - | - | **02** | **01** | **03** | **-** |
| 10 | මාතර බන්ධනාගාරය | - | 02 | 01 | - | - | - | - | 01 | - | 04 | - | **03** | **05** | **08** | **07** |
| 11 | අඟුණ/පැලැස්ස බන්ධනාගාරය | - | 01 | 05 | - | - | - | - | 04 | - | - | - | **06** | **04** | **10** | **06** |
| 12 | මඩකළපුව බන්ධනාගාරය | 01 | - | - | 01 | - | - | - | 01 | 01 | 03 | - | **02** | **05** | **07** | **02** |
| 13 | මීගමුව බන්ධනාගාරය | - | - | 01 | - | - | - | - | 01 | - | - | - | **01** | **01** | **02** | **01** |
| 14 | පල්ලන්සේන ත.ව.වි. මධ්‍යස්ථානය | - | 05 | - | - | - | - | - | - | - | - | - | **05** | **-** | **05** | **-** |
| 15 | කළුතර බන්ධනාගාරය | - | - | 03 | - | - | - | - | 01 | - | - | - | **03** | **01** | **04** | **03** |
| 16 | පල්ලේකැලේ විවෘත වැඩ කඳවුර | - | 17 | 02 | - | 02 | - | - | - | - | - | - | **21** | **-** | **21** | **04** |
| 17 | තල්දෙන ත.ව.වි.මධ්‍යස්ථානය | - | 16 | 01 | - | - | - | - | - | - | - | - | **17** | **-** | **17** | **05** |
| 18 | ත්‍රිකුණාමලය බන්ධනාගාරය | - | - | - | - | - | - | - | 01 | - | - | 01 | **-** | **02** | **02** | **01** |
| 19 | වීරවිල වැඩ කඳවුර | - | 11 | - | - | 02 | - | - | - | - | - | - | **13** | **-** | **13** | **03** |
| 20 | පොළොන්නරුව බන්ධනාගාරය | - | - | - | - | - | - | - | - | - | 02 | - | **-** | **02** | **02** | **02** |
| 21 | වාරියපොල බන්ධනාගාරය | - | 02 | 01 | - | - | - | - | 01 | - | 02 | - | **03** | **03** | **06** | **04** |
| 22 | මොණරාගල බන්ධනාගාරය | - | - | 04 | - | - | - | - | - | - | 01 | - | **04** | **01** | **05** | **01** |
| 23 | වටරැක වැඩ කඳවුර | - | 01 | - | 01 | - | - | - | - | - | - | - | **02** | **-** | **02** | **-** |
| 24 | වවුනියාව බන්ධනාගාරය | - | 01 | 01 | - | 01 | - | - | 02 | - | - | - | **03** | **02** | **05** | **02** |
| 25 | අඹේපුස්ස බන්ධනාගාරය | - | 02 | - | - | - | - | - | - | - | - | - | **02** | **-** | **02** | **01** |
| 26 | යාපනය බන්ධනාගාරය | - | - | - | - | - | - | - | 02 | - | 01 | - | **-** | **03** | **03** | **01** |
| 27 | කෑගල්ල බන්ධනාගාරය | - | - | - | 01 | - | - | - | - | - | - | - | **01** | **-** | **01** | **01** |
| 28 | කුරුවිට බන්ධනාගාරය | - | 16 | - | - | - | - | - | - | - | - | 02 | **16** | **02** | **18** | **05** |
| | **එකතුව** | **02** | **86** | **34** | **03** | **06** | **-** | **-** | **26** | **02** | **22** | **07** | **131** | **57** | **188** | **65** |

## 1.2.8 වෘත්තීය පුහුණු පාඨමාලා මූල්‍ය ප්‍රගතිය - 2024

| අනු අංකය | බන්ධනාගාර ආයතනය | පාඨමාලා සංඛ්‍යාව | ක්‍රියාත්මක පාඨමාලා /පුහුණු වැඩසටහන් | වෙන්කළ ප්‍රතිපාදන (රු) | වියදම (රු) |
|---|---|---|---|---|---|
| 1 | වැලිකඩ බන්ධනාගාරය | 10 | කරණවෑම්, සංගීත, ඇළුමිනියම් පිරි සැකසුම්, අඩු වියදම් සිවිලිං, බාලදක්ෂ, ඉංග්‍රීසි භාෂා පාඨමාලාව, නැටුම් හා සංගීත (කාන්තා අංශය) | 706,089.84 | 703,967.25 |
| 2 | නව දුම්බර බන්ධනාගාරය | 18 | පැස්සුම්, වඩු, ගෘහස්ත විදුලි කාර්මික, කරණවෑම්, අත්කම් නිර්මාණ (කාන්තා), බාලදක්ෂ, උපදේශන, ආගමික, සෞඛ්‍ය, ක්‍රීඩා, රූපලාවන්‍ය හා මැහුම් | 2,376,510.16 | 2,376,510.16 |
| 3 | මහර බන්ධනාගාරය | 14 | කරුණවෑම්, වඩු, නැටුම්, පෙදරේරු, බාල දක්ෂ, සංගීත චිකිත්සා, ධනාත්මක ප්‍රවේශ . මානසික සෞඛ්‍ය, උපදේශන, චිකිත්සා, රැකියා ප්‍රවර්ධන | 533,018.00 | 533,018.00 |
| 4 | අඟුණ/පැලැස්ස බන්ධ.ය | 05 | මැහුම්, පෙදරේරු හා බාලදක්ෂ | 85,000.00 | 84,640.00 |
| 5 | තල්දෙන ත.ව.වි.ම. | 15 | ගෘහස්ත විදුලි කාර්මික, කරණ වෑම්, පරිගනක, බාල දක්ෂ, මානසික සංවර්ධන, මත් නිවාරණ හා මැහුම් | 433,400.00 | 433,400.00 |
| 6 | පල්ලේකැලේ බන්ධනාගාරය | 12 | බේකරි, වඩු, පෙදරේරු, පැස්සුම්, ගෘහස්ථ විදුලි කාර්මික, බාලදක්ෂ, මත් නිවාරණ, සෞඛ්‍ය, රැකියා ප්‍රවර්ධන, ක්‍රීඩා හා මානසික සෞඛ්‍ය | 1,610,000.00 | 1,586,950.00 |
| 7 | අඹේපුස්ස බන්ධනාගාරය | 13 | පැස්සුම්, විදුලි කාර්මික, වඩු, සාක්ෂරතා, Art Therapy, උපදේශන, අත්කම් හා ස්වයං රැකියා මාර්ගෝපදේශනය | 782,000.00 | 670,000.00 |
| 8 | වීරවිල එළිමහන් සිර කඳවුර | 13 | මැහුම්, ගෘහස්ත විදුලි කාර්මික, විදුලි මෝටර් එතුම් , වඩු , සාක්ෂරතා, කරණ වෑම්, නායකත්ව පුහුණු, මත් නිවාරණ, ක්‍රීඩා, සංස්කෘතික හා බාලදක්ෂ | 920,000.00 | 918,480.00 |
| 9 | අනුරාධපුර බන්ධනාගාරය | 15 | වඩු, උද්‍යාන අලංකරණ, කරණ වෑම්, බාල දක්ෂ, මත් නිවාරණ, නායකත්ව පුහුණු, මනෝ උපදේශනය, සංගීත චිකිත්සා, මානසික සංවර්ධන, ආතති කළමණාකරණ, ආගමික හා ආධ්‍යාත්මික, සෞඛ්‍ය හා විනෝදාස්වාද වැඩසටහන් | 345,000.00 | 344,110.00 |
| 10 | කන්දෙවත්ත (මහර) | 10 | කරණවෑම්, මත් නිවාරණ, පෞර්ෂ සංවර්ධන, මානසික සංවර්ධන හා ක්‍රීඩා | 148,982.00 | 148,982.00 |
| 11 | වටරැක වැඩ කඳවුර | 04 | ගෘහස්ත විදුලි කාර්මික, කරණවෑම්, අහාර සැකසුම්, බාලදක්ෂ, | 125,000.00 | 118,510.00 |
| 12 | කුරුවිට බන්ධනාගාරය | 03 | මැහුම් හා අත්කම්, කාන්තා යට ඇඳුම් නිශ්පාදන, බාලදක්ෂ | 75,000.00 | 75,000.00 |
| 13 | වාරියපොල බන්ධනාගාරය | 02 | ඇළුමිනියම්, පිරිසැකසුම් හා බාලදක්ෂ පුහුණු | 85,000.00 | 85,000.00 |
| 14 | ගාල්ල බන්ධනාගාරය | 05 | රූපලාවන්‍ය, සාක්ෂරතා හා බාලදක්ෂ පුහුණු | 40,000.00 | 39,367.00 |
| 15 | මාතර බන්ධනාගාරය | 05 | කරණවෑම්, විවිධ අත්කම්, සපත්තු නිශ්පාදන, බාලදක්ෂ | 80,000.00 | 79,523.00 |
| 16 | මීගමුව බන්ධනාගාරය | 03 | විසිතුරු භාණ්ඩ නිශ්පාදනය,මැහුම් ගෙතුම්, බාලදක්ෂ පුහුණු | 65,000.00 | 64,950.00 |
| 17 | පොළොන්නරුව බන්ධ.ය | 04 | කරණවෑම්, අඩු වියදම් සිවිලිං හා බාලදක්ෂ පුහුණු | 55,000.00 | 54,980.00 |
| 18 | මැගසින් බන්ධනාගාරය | 03 | කරණවෑම් හා බාලදක්ෂ පුහුණු | 105,000.00 | 104,995.50 |
| 19 | බදුල්ල බන්ධනාගාරය | 05 | ගෘහස්ත විදුලි කාර්මික, විවිධ අත්කම්, බාලදක්ෂ පුහුණු පාඨමාලාව | 155,000.00 | 154,535.00 |
| 20 | කො.රි. බන්ධනාගාරය | 03 | කරණවෑම් හා බාලදක්ෂ පුහුණු | 79,000.00 | 79,000.00 |
| 21 | කෑගල්ල බන්ධනාගාරය | 03 | කරණවෑම් හා බාලදක්ෂ පුහුණු | 65,000.00 | 65,000.00 |
| 22 | කළුතර බන්ධනාගාරය | 05 | වඩු පාඨමාලාව,මහුම් හා බාල දක්ෂ පුහුණු | 635,000.00 | 633,085.00 |
| 23 | මොණරාගල බන්ධ.ය | 02 | කරණවෑම් හා බාලදක්ෂ පුහුණු | 35,000.00 | 34,880.00 |
| 24 | කඳුරුගස්ආර | 04 | පෙදරේරු පාඨමාලාව හා ඉදල් කොසු නිශ්පාදන පාඨමාලාව | 96,000.00 | 94,040.00 |
| 25 | ත්‍රිකුණාමළය බන්ධ.ය | 03 | කරණවෑම් හා බාල දක්ෂ පුහුණු | 55,000.00 | 55,000.00 |
| 26 | මඩකළපුව බන්ධනාගාරය | 05 | මැහුම්, කරණවෑම් හා බාල දක්ෂ පුහුණු | 115,000.00 | 109,975.00 |
| 27 | වවුනියා බන්ධනාගාරය | 03 | කරණවෑම් හා බාල දක්ෂ පුහුණු | 55,000.00 | 55,000.00 |
| 28 | යාපනය බන්ධනාගාරය | 09 | කරණවෑම් , සබන් නිශ්පාදන, තල් කොළ ආශ්‍රිත නිර්මාණ, පොල් කටු ආශ්‍රිත නිර්මාණ, සුභ පැතුම් පත් නිර්මාණය හා බාල දක්ෂ පුහුණු | 140,000.00 | 140,000.00 |
| **එකතුව** | | **196** | | **10,000,000.00** | **9,842,897.91** |

## 1.2.9 බන්ධනාගාර ආයතනයන්හි කර්මාන්ත හා කෘෂිකර්මාන්ත අංශයන්හි මූල්‍ය ප්‍රගතිය

| කර්මාන්ත හා කෘෂි කර්මාන්ත ආදායම සහ වියදම | 2024 | 2023 |
|---|---|---|
| සත්‍ය වියදම | 160,075,039.02 | 137,609,307.00 |
| සත්‍ය ආදායම | 316,221,643.84 | 253,730,905.00 |




| අනු අංකය | ආයතනයේ නම | දැනට ක්‍රියාත්මක කර්මාන්ත හා කෘෂි කර්මාන්තයේ නම | 2024.12.31 දිනට (සත්‍ය) | |
|---|---|---|---|---|
| | | | වියදම | ආදායම |
| 1 | වටරැක වැඩ කඳවුර | කෘෂිකර්මාන්තය, බ්ලොක් ගල්, කොසු, ඉදල් | 1,649,805.00 | 8,470,490.26 |
| 2 | මහර බන්ධනාගාරය | කෘෂිකර්මාන්තය, මැහුම්, රජක, කම්හල්, පොල්කටු අඟුරු, වඩු, කොසු, ඉදල්, පේෂකර්ම, සබන්, පොල්තෙල් | 4,910,677.85 | 21,967,439.56 |
| 3 | පල්ලන්සේන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය | කෘෂිකර්මාන්තය, වඩු, බේකරි, කොහු මෝල, කොසු, ඉදල්, පේෂකර්ම, මැහුම්, කම්හල් | 9,371,876.18 | 20,464,916.13 |
| 4 | නව දුම්බර බන්ධනාගාරය | වඩු,මැහුම්, පේෂකර්ම, වැද්දුම්, පැස්සුම්, කොසු, ඉදල්, රජක | 6,569,834.00 | 10,621,874.25 |
| 5 | පල්ලෙකැලේ විවෘත වැඩ කඳවුර | කෘෂිකර්මාන්තය, සත්ව පාලනය, බේකරි, මැහුම්, සබන්, දෝවනාගාර, ගඩොල්, වඩු, වැද්දුම් හා පැස්සුම්, මෝටර් ගරාජය, කොසු, ඉදල්, පේෂකර්ම | 22,233,939.35 | 47,998,328.75 |
| 6 | අනුරාධපුර බන්ධනාගාරය | කෘෂිකර්මාන්තය, බේකරි, කම්හල්, වඩු, කොසු, ඉදල්, මැහුම්, පේෂකර්ම, රජක | 23,601,234.88 | 38,643,240.13 |
| 7 | බදුල්ල බන්ධනාගාරය | රජක අංශය | 38,500.00 | 155,394.00 |
| 8 | වීරවිල වැඩ කඳවුර | කෘෂිකර්මාන්තය, බේකරි | 5,299,825.29 | 13,531,105.56 |
| 9 | වැලිකඩ බන්ධනාගාරය | කම්හල්, වඩු, කොසු, ඉදල්, රජක, සබන්, මැහුම්, මුද්‍රණ, පේෂකර්ම, බේකරි | 33,040,832.70 | 54,811,959.39 |
| 10 | තල්දෙන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය | කෘෂිකර්මාන්තය, සත්වපාලනය, මේසන්, ලිපි කවර, ගඩොල්, මැහුම්, කොසු, ඉදල්, කම්හල්, බේකරි, වඩු, රජක | 20,890,710.95 | 34,191,488.19 |
| 11 | කුරුවිට බන්ධනාගාරය | කෘෂිකර්මාන්තය, බ්ලොක් ගල්, කම්හල් | 4,621,272.50 | 12,315,195.57 |
| 12 | බූස්ස බන්ධනාගාරය | කෘෂිකර්මාන්තය, බේකරි | 10,699,410.57 | 12,744,870.57 |
| 13 | වාරියපොල බන්ධනාගාරය | කෘෂිකර්මාන්තය, බ්ලොක් ගල් | 2,000,000.00 | 13,832,975.56 |
| 14 | අඟුණකොළපැලැස්ස බන්ධනාගාරය | කෘෂිකර්මාන්තය, බේකරි, වාහන සේවා | 2,876,647.00 | 11,101,767.50 |
| 15 | කොළඹ රිමාණ්ඩ් බන්ධනාගාරය | මෝටර් ගරාජය | 10,719,118.75 | 10,847,350.06 |
| 16 | මාතර බන්ධනාගාරය | කෘෂිකර්මාන්තය | 304,494.00 | 1,091,594.76 |
| 17 | මඩකළපුව බන්ධනාගාරය | කෘෂිකර්මාන්තය | 1,200,000.00 | 2,877,494.60 |
| 18 | ගාල්ල බන්ධනාගාරය | කෘෂිකර්මාන්තය | 46,860.00 | 554,159.00 |
| | | එකතුව | **160,075,039.02** | **316,221,643.84** |

## 1.2.10 හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය විසින් බන්ධනාගාර ආයතන සෝදිසි කිරීමේදී අත්අඩංගුවට ගත්ද්‍රව්‍ය පිළිබඳ වාර්තාව

| | බන්ධනාගාර ආයතනය | ජංගම දුරකථන | සිම් කාඩ්පත් | බැටරි | චාජර් | හෙරොයින් | | ගංජා (ග්‍රෑම්) | අයිස් (ග්‍රෑම්) | චරස් ග්‍රෑම් | මත් පෙති | දුම්කොල | | මුදල් (රු) | කාඩ් රීඩර් | හෑන්ඩ්ස් ෆ්‍රී | ඩේටා කේබල් | මෙමරි කාඩ් | පෙන්ඩ්‍රයිව | ලයිටර් | සිගරට | වෙනත් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ග්‍රෑම් | පැකට | | | | | කොළ | ග්‍රෑම් | | | | | | | | | |
| 1 | වැලිකඩ | 18 | 19 | 11 | 01 | - | 03 | 10000 | පැ1/4539 | - | 02 | 57 | - | 2,500.00 | - | - | - | - | 03 | 10 | - | බීඩි - 4 |
| 2 | වැලිකඩ කාන්තා | 08 | 04 | 49 | - | - | 01 | 1000 | - | - | - | 03 | - | - | - | 01 | - | - | - | 01 | - | - |
| 3 | වැලිකඩ රෝහල | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 4 | අඟුණකොළපැලැස්ස | 20 | 20 | 13 | 01 | - | 01 | 2000 | පැ8/350 | - | - | 04 | - | - | - | - | 03 | 01 | - | 06 | - | දුම්කොළ සුරුට්ටු - 802 |
| 5 | මහර | 04 | 06 | 05 | 01 | - | - | - | පැ-1 | - | - | 80 | - | - | - | - | 03 | 01 | - | 03 | - | බීඩි - 20 |
| 6 | දුම්බර | 19 | 18 | 27 | 08 | 2850.99 | 15 | - | පැ-3 | - | - | 87 | - | 50 | - | 02 | 02 | 01 | - | 33 | - | බීඩි - 65 / මාල - 1 /ඇෂ් - පැ3 |
| 7 | මැගසින් | 98 | 99 | 81 | 10 | - | 24 | 3000 | පැ25/6g | - | 02 | 186 | - | 25,020.00 | 15 | 25 | 25 | 04 | 02 | 20 | - | බීඩි - 40 / මුදු - 1 |
| 8 | කොළඹ රිමාන්ඩ් | 83 | 66 | 66 | 11 | 560 | 31 | පැ6/ 6000 | පැ746 | පැ- 48 | 02 | 245 | - | 5,140.00 | - | 03 | 09 | 02 | 03 | 08 | - | ඇෂ් 183mg, පැ16, බීඩි - 3, ස්මාර්ට් වොච් - 3, වාජර් - 1 |
| 9 | මීගමුව | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 10 | කළුතර | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 11 | අනුරාධපුරය | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 12 | කෑගල්ල | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 09 | - | - |
| 13 | වාරියපොල | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| 14 | ගාල්ල | 52 | 58 | 55 | 29 | - | 01 | - | පැ-1 | - | - | 21 | - | 380.00 | - | 12 | 14 | 02 | 01 | 15 | - | - |
| 15 | බූස්ස | 04 | 01 | 01 | 04 | - | - | - | - | - | - | - | - | - | 01 | 06 | 04 | 01 | 01 | 05 | - | - |
| 16 | වෙල්ලිමුරපොල | - | - | - | - | 3310 | - | - | පැ-5 | - | - | - | 5 | - | - | - | - | - | - | - | - | බීඩි මිටි - 4 |
| 17 | මාතර | 19 | 09 | 18 | 03 | - | - | - | පැ-4 | - | - | - | - | - | - | - | - | - | - | 01 | - | - |
| | **එකතුව** | **325** | **340** | **366** | **69** | **6720.99** | **173** | **පැ6/ 22000** | **පැ105/ 11641** | **පැ 48** | **14** | **738** | **05** | **33,090.00** | **16** | **55** | **70** | **12** | **10** | **117** | **-** | - |


GLOBAL

# 02

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම



## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### ජයග්‍රහණ -

- බන්ධනාගාර දෙපාර්තමේන්තු වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2023; ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (The Institute of Charted Accountants of Sri Lanka) හා ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමය (Association of Public Finance Accountants of Sri Lanka) ඒකාබද්ධව වාර්ෂිකව සිදුකරනු ලබන කාර්ය සාධන වාර්තා ඇගයීමේදී රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තු කාණ්ඩයේ කුසලතා සම්මානයෙන් 2024.12.02 දින පැවති සම්මාන ප්‍රධානෝත්සවයේදී පිදුම් ලැබීම.




- ජාතික ප්‍රතිපත්ති රාමුව, තිරසාර සංවර්ධන ඉලක්ක, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ හඳුනාගෙන ඇති ප්‍රමුඛතාවන්ට අනුකූල වන පරිදි බන්ධනාගාර දෙපාර්තමේන්තු ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සඳහා **"A Right Based Correctional System for a Safer Society"** යන තේමාව යටතේ 2021-2025 යන කාල පරිච්ඡේදය පදනම් කර ගනිමින් ගරු. අධිකරණ අමාත්‍යතුමන් පුළුල් වූ ක්ෂේත්‍ර - 09 ක් ඔස්සේ ක්‍රියාත්මක කිරිමට අනුමැතිය ලබා දුන් පස් අවුරුදු සැලැස්ම ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තෙවසරක කාල පරිච්ඡේදය තුළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා අනෙකුත් අන්තර් ජාතික සංවිධානයන්හි පරිත්‍යාග මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ සිදුකිරීමේ ක්‍රියාවලියේ අත්පත් කර ගෙන පවතින ප්‍රගතිය පහත පරිදි වේ.

### බන්ධනාගාර තදබදය අවම කිරීම හා නේවාසික පහසුකම් වැඩිදියුණු කිරීම

- කොළඹ බන්ධනාගාර සංකීර්ණය (වැලිකඩ බන්ධනාගාරය, කොළඹ රිමාණ්ඩ් බන්ධනාගාරය, නව මැගසින් බන්ධනාගාරය හා කාන්තා අංශය) බන්ධනාගාර රෝහල, පර්යේෂණ විශෝධන හා පුහුණු මධ්‍යස්ථානය හොරණ මිල්ලෑව ප්‍රදේශයටත් බන්ධනාගාර මූලස්ථානය බත්තරමුල්ල ප්‍රදේශයට හා බන්ධනාගාර මූලස්ථාන නිල නිවාස මාලඹේ ප්‍රදේශයට විතැන් කිරීම සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය හා එක්ව අවශ්‍යතා හඳුනාගෙන සැලසුම් හා නිර්මාණ කටයුතු සිදු කර ඇති අතර අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතීන් ප්‍රකාරව මූලික අවශ්‍යතා සියල්ල සපුරා ගැනීමෙන් අනතුරුව එහි ප්‍රසම්පාදන හා අනෙකුත් ඉදිරි කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදුකිරීම ආරම්භ කරන ලදී. මුදල් අමාත්‍යාංශ 26.04.2022 දිනැති චක්‍රලේඛ අංක 3/2022 ප්‍රකාරව ඉදිරියට ගෙන යාම තාවකාලිකව අත්හිටුවා පැවති මෙම ව්‍යාපෘතිය 2023 වසරේදී නැවත ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව පිළිබඳ ගරු. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමන්ගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා කිරීමට කටයුතු කල අතර එහිදී 2021 වසරේදී බන්ධනාගාර සංකීර්ණය හොරණ ඉදිකිරීමට අදාළව සකස්කල ඇස්තමේන්තු වටිනාකම මේ වනවිට ඉහළ ගොස් ඇති බවත් එය බොරැල්ල බන්ධනාගාර සංකීර්ණය පිහිටි භූමිය අයෝජනය මගින් සපුරා ගත නොහැකි බවත් නාගරික සංවර්ධන අධිකාරිය මගින් දැනුවත් කරන ලදී.

ඒ අනුව, ඔවුන් විසින් යෝජිත විකල්ප ක්‍රමවේද සිදුකිරීමට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව අධ්‍යනය කිරීමටත් බොරැල්ල පිහිටි බන්ධනාගාර සංකීර්ණ භූමිය තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කර ඒ සඳහා වර්තමානයේ පවතින තක්සේරු වටිනාකම ලබා ගැනීමටත් ගරු. රාජ්‍ය අමාත්‍යතුමන් විසින් උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් තක්සේරු වටිනාකම ලබා ගැනීමට ඉල්ලුම් කර ලබා ගන්නා ලදී.

- පල්ලේකැලේ, නව දුම්බර බන්ධනාගාරයේ නිල නිවාස ඉදිකිරීම් කටයුතු 99.7%ක භෞතික ප්‍රගතියක් අත්පත් කර ඇත. තවද මෙම ව්‍යාපෘතියට අදාළ ජල ටැංකිය හා ඒ ආශ්‍රිත ජල සැපයුම් ලබාදීමට අවශ්‍ය කටයුතු නිම කිරීම සඳහා 2023 වර්ෂයේ සකස් කල රුපියල් මිලියන 164.92ක නව ඇස්තමේන්තුව අනුව අමතර වියදමට ආදාල රු.මිලියන 71.88 සඳහා අනුමැතිය හා 2024 වර්ෂයට වෙන්වූ ප්‍රතිපාදන මගින් ජල ටැංකිය ඉදිකිරීමේ හා ඒ ආශ්‍රිත



ජල සැපයුම් කටයුතු සඳහා ගෙවීම් කළමනාකරණය කර ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අංක:අමප/24/0409/614/019 හා 26.03.2024 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව 2024 වර්ෂයට වෙන්වූ රු. මිලියන 250.0 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 209.65ක් එනම් 84% පමණ උපයෝජනයට කටයුතු කර ඇත.

තවද, මෙම ව්‍යාපෘතියේ අත්‍යාවශ්‍ය ඉතිරි වැඩ අවසන් කිරිම සඳහා 2025-2028 කාල රාමුව තුළ අය වැය මගින් කොටස් වශයෙන් රු.මිලියන 1782ක ප්‍රතිපාදන වෙන් කර ගැනීම, ඒ යටතේ උපරිම ආරක්ෂිත අංශය, තරුණ වරදකරුවන්ගේ රැඳවුම් ගොඩනැගිල්ල (අංශ 02),රැඳවි ගොඩනැගිල්ල (අංශ 03), රැඳවි ගොඩනැගිල්ල (අංශ 05), ශරීර සුවතා හා විනෝද මධ්‍යස්ථානය, ජල ටැංකිය හා බාහිර කාණු පද්ධතිය ඉදිකිරීම, අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම යන ඉදිකිරීම් ක්‍රියාකාරි සැලැස්ම ප්‍රකාරව 2025-2028 ඇතුළත ඉදිකිරීම හා ව්‍යාපෘති කාලය 2028.12.31 දක්වා දීර්ඝ කිරීමට හා සියළුම ඉදිකිරිම් මේ වන විටත් ක්‍රියාත්මක ආකාරයට ඉංජිනේරු උපදේශණ ආයතනයේ උපදේශකත්වය යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් ඉටුකිරිම යන කරුණු සඳහා වන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව 2024.12.30 දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබී ය.

- 2020 වසරේ ඉදිකිරීම් ආරම්භ කරන ලද පල්ලන්සේන බන්ධනාගාරයේ සිර ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු මේවන විට 98.5%ක භෞතික ප්‍රගතියක් අත්කර ගෙන ඇති අතර එහි මල අපවහන පද්ධතියේ ඉදිකිරිම සඳහා වන කොන්ත්‍රාත්තුවට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී.

- ගම්පොල සිර මැදිරියේ ඉදිකිරීම් කටයුතු 2023 වසරේ අගභාගයේදී ආරම්භ කිරීමට කටයුතු කරන ලද අතර 2024 වසරේ දී රු.මි.7.56 ක පිරිවැයක් යටතේ 50% ක ඉදිකිරීම් කටයුතු නිම කිරීමට හැකියාව ලැබුනි. මෙම ඉදිකිරීම සිර ශ්‍රමය යටතේ සිදු කරනු ලබන අතර 2025 වසරේදී නිම කිරීමට අපේක්ෂිත ය.





- මහර බන්ධනාගාරයේ 2020 වසරේ ඇතිවූ කැරැල්ල මගින් විනාශ වූ පරිපාලන ගොඩනැගිල්ල හා ගබඩාව රු.මිලියන 316.0ක මුළු පිරිවැය අස්තමේන්තුවක් යටතේ ඉදිකිරිම සඳහා අවශ්‍ය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තු එකඟතාවය හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2024 වසර සඳහා වෙන් වූ ප්‍රතිපාදන සීමාව තුල රු.මි.17.68ක වියදමක් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර;එහි ගබඩාව ඉදිකිරීම් කටයුතු ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන ආයතනය (NERDC) වෙත සෘජු කොන්ත්‍රාත් ක්‍රමවේදය ප්‍රදානය කර ඇත. එමෙන්ම පරිපාලන ගොඩනැගිල්ලට අදාලව සැලැසුම් හා නිර්මාණ කිරිම් කටයුතු අවසන් අදියරේ සිදුකරමින් ඇත.

- අය වැය මගින් නේවාසික සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන භාවිතයෙන් බන්ධනාගාර ආයතන මට්ටමින් නේවාසිකයන් සඳහා වැසිකිළි ඉදිකිරීම, අළුත්වැඩියා කිරීම, ආබාධිත වැසිකිළි ඉදිකිරීම, බන්ධනාගාර ආයතන වල මුළුතන්ගෙවල් පිළිසකර කිරීම , නාන ස්ථාන වැඩි දියුණු කිරීම, ජල පහසුකම් ලබාදීම, සිර වාට්ටු වල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම අදී කටයුතු රාශියක් සිදු කරන ලදී.

එමෙන්ම; රු.මිලියන 23.41 ක පිරිවැයක් යටතේ නව දුම්බර මල අපවහන පද්ධතිය අළුත්වැඩියා කිරීමේ කටයුතු හා රු.මිලියන 18.61ක පිරිවැයක් යටතේ බූස්ස මල අපවහන පද්ධති අළුත්වැඩියා කිරීමේ කටයුතු සිදු කිරීමට කටයුතු කරමින් පවතී.

තවද, පොලොන්නරුව, කුරුවිට, මීගමුව හා වාරියපොල බන්ධනාගාර ආයතකයන්හි මල හා අප ජල පද්ධති ඉදිකිරීමේ මූලික සැලැසුම් කටයුතු සිදුකිරීමට මෙම වසරේ කටයුතු කරන ලදී.

- වැලිකඩ බන්ධනාගාරයේ වැපල් ගොඩනැගිල්ලේ "සී" අංශයේ වහල අළුත්වැඩියා කටයුතු මෙම වසරේ සිදුකිරීමට කටයුතු කරන ලදී

- පල්ලේකැලේ එළිමහන් සිර කඳවුරේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය නවීකරණය කිරීම රු.මිලියන 4.91ක පිරිවැයක් යටතේ සිදුකිරීමට කටයුතු කිරීම.





- නායයාම හේතුවෙන් අළුත්වැඩියා කලයුතු තත්වයට පත්වූ කෑගල්ල රිමාණ්ඩ් බන්ධනාගාර තාප්පයේ අළුත්වැඩියා කටයුතු මෙම වසරේ ආරම්භ කරන ලදී. ඒ සඳහා රු.මිලියන 7.13ක පිරිවැයක් මෙම වසරේ දරණ ලද අතර අළුත්වැඩියා කටයුතු 2025 වසරේ නිම කිරීමට නියමිතය.

- වැලිකඩ බන්ධනාගාරයේ මුළුතැන්ගෙයි වහල අළුත්වැඩියා කටයුතු මෙම වසරේ රු.මිලියන 9.42ක පිරිවැයක් යටතේ අළුත්වැඩියා කිරීමට හැකියාව ලැබිනි. මෙම ව්‍යාපෘතියේ ඉතිරි අළුත්වැඩියා කටයුතු 2025 වසරේ ජනවාරි මාසයේදී නිම කිරීමට අපේක්ෂිතය.

- දර පිරිමැසුම්දායී උදුන් නර්ඩ් තාක්ෂණය ඔස්සේ සැකසීමේ නියමු ව්‍යාපෘතියක් අනුරාධපුර හා පල්ලන්සේන බන්ධනාගාර ආයතනයන්හි සිදු කිරීමට කටයුතු කිරීම. මේ සඳහා රු.මිලියන 5.4ක පිරිවැයක් දරා ඇති අතර එමගින් දර පරිභෝජනය අඩු කිරීමට හැකියාව ලැබෙනු ඇත. එම ව්‍යාපෘතියේ සාර්ථකත්වය මත මෙම උදුන් ඉදිරියේදී අනෙකුත් බන්ධනාගාර ආයතන සඳහාද ක්‍රමිකව හඳුන්වාදීමට නියමිතය.

## බන්ධනාගාර කළමනාකරණ ප්‍රතිසංස්කරණ

- ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතුව විධිමත් සේවා ව්‍යවස්ථාවක් නොමැතිවීම හේතුවෙන් බඳවා ගැනීම්, පුහුණු කිරීම්, උසස් කිරීම් ආදිය සිදු කිරීමේදී විවිධ ගැටළු වලට මුහුණ දෙන අවස්ථා පවතී.එමෙන්ම කලාපීය බොහොමයක් රටවල් බන්ධනාගාර සේවය විශෝධන සේවාව බවට පරිවර්තනය කර ඇති අවධියක **"Leaders in Corrections"** යන තේමාව ඔස්සේ ශ්‍රී ලංකා බන්ධනාගාර සේවයද විශෝධන සේවාව බවට පත්කර එහි වෘත්තීමයභාවය පවත්වා ගැනීමට අවශ්‍ය කෙටුම්පත් කරන ලද සේවා ව්‍යවස්ථාවේ සංශෝධන ඊට අදාළව පත් කල කමිටුව මගින් නැවත සමාලෝචනය කල යුතුව පවතී. මීට අදාළව තනතුරු 21කට අදාළ බඳවා ගැනීම් පටිපාටි සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. එමෙන්ම, තනතුරු 02ට අදාළ බඳවා ගැනීමේ පටිපාටි සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභා අනුමැතිය ලබා ගැනීම සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. තවත් තනතුරු 07කට අදාළ බඳවා ගැනීම් පටිපාටි සකස් කිරීමට පත්කරන ලද කමිටු සමග සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.

## බන්ධනාගාර කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධනය

- කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය පිළිබඳ තෙවසරක උපාධිය හැදෑරීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අයදුම්කරන ලද නිලධාරීන් අතුරින් නිලධාරීන් සිව්දෙනෙකු උපාධිය හැදෑරීමේ කටයුතු ආරම්භ කර ඇත. මෙමගින් දැණුමෙන් සන්නද්ධ නිලධාරීන් ලෙස දෙපාර්තමේන්තුවේ දෙවන පෙළ නිලධාරීන් ශක්තිමත් කිරීමට අපේක්ෂිතය.

- බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය තුළ ඉතා වැදගත් ක්ෂේත්‍රයක් වන සමාජ වැඩ පිළිබඳ දැණුම වර්ධනය කිරීමටත් ඒ ඔස්සේ අනෙකුත් නිලධාරීන්ටද දැණුම බෙදා දීමට හැකියාව පවතින සමාජ සංවර්ධන ආයතනයේ සමාජ වැඩ පිළිබඳ වසරක ශාස්ත්‍රපති උපාධිය හැදෑරීමේ අවස්ථාව සහකාර බන්ධනාගාර අධිකාරීවරුන් 12 දෙනෙකු වෙත ලබා දීමට කටයුතු කර ඇත.

- බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු වල කටයුතු වඩාත් නිරවද්‍ය ලෙස සිදු කිරීම පිළිබඳ දැනුවත් වීම සඳහා සැපයුම් හා සේවා අංශයේ නිලධාරීන් සිව්දෙනකු සඳහා දින 10ක ප්‍රසම්පාදනය පිළිබඳ පුහුණුවක් නිපුණතා සංවර්ධන ආයතනයේ ලබා දීමටත් අවශ්‍ය කටයුතු සිදුකරන ලදී.

- බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ගේ පරිසාධන මට්ටම ඉහළ දැමීමේ අරමුණ ඇතිව කැළණිය විශ්ව විද්‍යාලය සමග සංවිධානය කරනු ලබන වසර 01ක විශෝධනය හා පුනරුත්ථාපන ඩිප්ලෝමාව සඳහා නිලධාරීන් 39 දෙනෙකු හා වසර 01ක විශෝධනය හා පුනරුත්ථාපනය උසස් ඩිප්ලෝමාව සඳහා නිලධාරීන් 40ක්ද යොමු කර ඇත.

- බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන් 24 දෙනකු සඳහා පරිගණක දෘඩකාංග පුහුණුවක් රජයේ මුද්‍රණාල පුහුණු පාසැල මගින් ලබා දෙන ලදී.

- උසස්වීම් ලද සහකාර බන්ධනාගාර අධිකාරීන් 16 දෙනකු සඳහා දින 14ක පුහුණු වැඩසටහනක් අගුණකොළපැලැස්ස බන්ධනාගාර පුහුණු පාසලේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කරනු ලැබිය.

- උසස් වීම් ලද I පෙළ ජේලර් නිලධාරීන් 36 දෙනකු සඳහා සති 03ක පුහුණු වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කර ඇත.

- උසස් වීම් ලද II පෙළ ජේලර් නිලධාරීන් 15 දෙනකු සඳහා දින30ක පුහුණු වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කර ඇත.

- උසස්වීම් ලද සැරයන් නිලධාරීන් 35 දෙනෙකු සඳහා දින 21ක පුහුණුවක් ලබා දීමට කටයුතු කරන ලදී.

- උසස්වීම් ලද සහකාර බන්ධනාගාර අධිකාරී (වැඩ ආවරණ) නිලධාරීන් 10 දෙනකු සඳහා දින 03ක පුහුණු වැඩසටහනක් සංවිධානය කරනු ලැබිය.

- බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා බඳවා ගත් ආධුනික රියදුරු නිලධාරීන් 06 දෙනකු සඳහා දින 14ක පුහුණු පාඨමාලාවක් සංවිධානය කිරීමට කටයුතු කරන ලදී.

- බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු මෝටර් රථ රියදුරන් 75 දෙනකු සඳහා දින 02ක පුහුණු වැඩ සටහනක් මගින් සිය රාජකාරි සිදුකිරීමේදී අවශ්‍ය වන මූලික හා ප්‍රායෝගික දැණුම පිළිබඳ අවබෝධයක් ලබා දීම සිදු කිරීම.

- බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරනු ලබන සංඛ්‍යාන හා දත්ත ක්‍රමවත්ව හා නිරවද්‍ය ලෙස සකස්කර ගැනීමේ අරමුණ ඇතිව බන්ධනාගාර ආයතනයන්හි සංඛ්‍යාන හා දත්ත සකස් කිරීමේ නිලධාරීන් 60 දෙනකු සඳහා දිනක පුහුණුවක් ලබා දීම.

- බන්ධනාගාර දෙපාර්තමේන්තු සංවර්ධන හා කළමණාකරන සේවා නිලධාරීන් 100 දෙනකු සඳහා රාජකාරී සිදුකිරිමට අවශ්‍ය මූලික හා ප්‍රායෝගික දැණුම ලබා දීම.

- බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කර්මාන්ත අංශයේ සේවයේ නියුතු නිලධාරීන් 110 දෙනෙකු උදෙසා දින 03ක පාඨමාලා 02ක් ලෙස දැණුම යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම.

- බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නියාමක නිලධාරීන් 876ක් සඳහා දින 03 බැගින් වන පාඨමාලා 11 සංවිධානය කර ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

- II පෙළ ජේලර් නිලධාරීන් 188 දෙනෙකු ධාරිතා සංවර්ධනය සඳහා වැඩමුළු 03ක් සංවිධානය කරන ලද අතර එමගින් ජේලර් නිලධාරීන්ගේ දැණුම, ආකල්ප, කුසලතා වර්ධනය සිදුකර වඩාත් ඵලදායී සේවාවක් ලබා ගැනීමට අපේක්ෂිතය.

- බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කෘෂිකාර්මික අංශයේ සේවයේ නියුතු නිලධාරීන් 50 දෙනකු සඳහා දින 03ක පුහුණුවක් ලබා දීමට කටයුතු කිරීම.

- බන්ධනාගාර සැරයන් නිලධාරීන් 255 දෙදෙනෙකු සඳහා දින 03ක ධාරිතා සංවර්ධන පුහුණුවක්ද පුනරුත්ථාපන නිලධාරීන් 100 දෙනකු සඳහා දින 03ක උපදේශණය සම්බන්ධ පුහුණුවක්ද ලබා දීමට කටයුතු කර ඇත.

- බන්ධනාගාර පොර්තමේන්තුවේ කම්කරු, මුරකරු හා කාර්යාල කාර්ය සහායක සේවයේ නිලධාරින් 59ක් සඳහා දින 03ක පුහුණුවක් අඟුණකොළපැලැස්ස පුහුණු පාසැලේදී ලබා දිමට කටයුතු සිදුකිරිම.

- බන්ධනාගාර දෙපාර්තමේන්තු මාණ්ඩලික ලිපිකරු අංශයේ නිලධාරීන් 80 දෙදෙනකු සඳහා දින 03ක පුහුණු වැඩසටහනක්ද රියදුරන් 30 දෙනෙකු සඳහා මාස 03ක දමිළ භාෂා පුහුණු වැඩසටහනද 2024 වසරේ සංවිධානය කිරීමට කටයුතු කර ඇත.

- 2024 වසරේ සිංගප්පූරුවේ පැවති අන්තර්ජාතික විශෝධන හා බන්ධනාගාර සංගමයේ සම්මන්ත්‍රණය සඳහා ශ්‍රී ලංකාවේ බන්ධනාගාර දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරීන් දෙදෙනකු සහභාගී කරවීමට කටයුතු කරන ලදී. මෙහිදී අන්තර්ජාතිකව විශෝධන හා බන්ධනාගාර සේවයේ නව ප්‍රවණතා හා යහපත් භාවිතයන් පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීමට හැකියාව විවර වේ. මෙම නිලධාරීන් සහභාගී කරවීමට අදාල මූල්‍ය දායකත්වය UNODC ආයතනය විසින් දරනු ලැබිය.

HONG KONG, CHINA 中國香港 42nd APCCA

- 2024 වසරේ හොංකොංහි පැවති ආසියානු පැසිෆික් කාලාපීය විශෝධන පරිපාලකයන්ගේ සම්මන්ත්‍රණය සඳහා ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරියකු සහභාගීවූ අතර එමගින් කලාපීය රටවල විශෝධන පරිපාලනයේ විවිධවූ මාන පිළිබඳ දැනුම හා අත්දැකීම් බෙදා ගැනීමට හැකියාව විවර වේ.

- තායිලන්තයේ පැවති ආසියානු පැසිෆික් කලාපීය රටවල බැංකොක් රීතීන් උසස් ලෙස භාවිතය පිළිබඳ උපදේශකත්ව සාකච්ඡාව සඳහාද ශ්‍රී ලංකාව නියෝජනය කරමින් එක් නිලධාරියකු සහභාගී විය. මෙම නිලධාරියා සහභාගී කරවීමට අදාල මූල්‍ය දායකත්වය UNODC ආයතනය විසින් දරනු ලැබිය.

- ජයිකා ආධාර යටතේ ජපානයේ පැවති ජයිකා දැනුම සම නිර්මාණ වැඩසටහන සඳහා ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව නියෝජනය කරමින්ද නිලධාරියකු සහභාගී වූ අතර එමගින් දැණුම ආකල්ප හා කුසලතා සංවර්ධනය මෙන්ම ලබා ගත් දැණුම හා දැණුම බෙදා හැරීමේ ශිල්පීය ක්‍රම නිලධාරීන් පුහුණු කිරීමේ කටයුතු සඳහාද යොදා ගත හැකි වීම.

- මාලදිවයිනේ පැවති විද්‍යුත් සාක්ෂි පිළිබඳ කලාපීය සාකච්ඡාව සඳහා ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවද නියෝජනය කරමින් එක් නිලධාරියකු සහභාගී විය.



- වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්ම තුලින් වෙන්වන ප්‍රතිපාදන වලට අමතරව UNODCයන ආයතන හා එක්ව පහත පුහුණු වැඩමුළු පැවැත්වීමට කටයුතු සිදුකිරීම.

i. ගතික ආරක්ෂාව (Dynamic Security) සම්බන්ධව දින 05ක පුහුණු වැඩසටහන සඳහා සියළුම නිලයන් ආවරණය වන පරිදි කණ්ඩායම් 02ක් ලෙස බන්ධනාගාර දෙපාර්තමේන්තු නිලධාරීන් 41 දෙනකු සහභාගී කිරීමට කටයුතු කර ඇත.

ii. උසස් ගතික ආරක්ෂාව (Advanced Dynamic Security) සම්බන්ධ දින 05ක පුහුණු වැඩ සටහන සඳහා නිලධාරින් 19 දෙනකු සහභාගි කරවන ලදී.

iii. තොරතුරු තාක්ෂණ හා සන්නිවේදනය (ICT Training) සම්බන්ධ එක් දින පුහුණුව සඳහා වන දෙවන කණ්ඩායම් ලෙස නිලධාරීන් 20 දෙනකු මොරටුව විශ්ව විද්‍යාලය සමග සංවිධානය කරන ලද වැඩසටහනට සහභාගී කරවනු ලැබිය.



### බන්ධනාගාර අණපනත් ප්‍රතිසංස්කරණය

ශ්‍රී ලංකා බන්ධනාගාර ආඥා පනත (54 අධිකාරය) 94 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන රීතීන් (1920 මාර්තු මස 19 දින අංක 7093 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ රීති) තව දුරටත් 2022.07.12 දිනැති අංක :2288/15 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත 80 වන රීතිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී හඳුනාගත් ඇතැම් කරුණු හේතුවෙන් නැවත සංශෝධනය කිරීම සඳහා අවධානය යොමුව ඇත.

නීති කෙටුම්පත් සම්පාදක විසින් කෙටුම්පත් කරන ලද පනත සඳහා ගරු. නීතිපතිතුමන් විසින් ලබා දී ඇති නිරීක්ෂණ හා කෙටුම්පත මේ වන විට බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් සමාලෝචනය කිරීමට කටයුතු කරමින් ඇති අතර ඊට අදාළ බන්ධනාගාර දෙපාර්තමේන්තු නිරීක්ෂණ අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වෙත යොමු කිරීමට නියමිතය.

වර්තමානයේදී දණ්ඩන ප්‍රතිපත්තිය, නිවාස අඩස්සිය වැනි නව සංකල්ප නීතියට ඇතුලත් කිරීම සඳහා වන කමිටු කිහිපයක් පත් කර එහි ඉදිරි කටයුතු සිදුකරන ලදී. ඒ අනුව නිවාස අඩස්සිය යන සංකල්පයට අදාළ කමිටු නිර්දේශ සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතීන් ප්‍රකාරව නීති කෙටුම්පත් සම්පාදක විසින් ඊට අවශ්‍ය නව නීති සම්පාදනය කර ඇත.

### බන්ධනාගාර ආරක්ෂක ක්‍රියාවලිය විධිමත් කිරීම

බන්ධනාගාර ආයතන වල ආරක්ෂිත කැමරා පද්ධතියක් ස්ථාපනය කිරීම බන්ධනාගාර ආයතන තුළ හා පිටත ආරක්ෂාව තර කිරීමත් බන්ධනාගාර වල එදිනෙදා කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය පහසු කිරීමත් හා ආයතන තුළ හා පිටත සිදුවිය හැකි අක්‍රමිකතා අවම කිරීමට ඉතා වැදගත්වේ. ඒ අනුව කොළඹ බන්ධනාගාර සංකීර්ණය එනම් වැලිකඩ, නව මැගසින්, කොළඹ රිමාණ්ඩ්, කාන්තා අංශය හා බන්ධනාගාර රෝහලේ ආරක්ෂිත කැමරා පද්ධති ස්ථාපනය කිරීමේ කටයුතු හා හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා කාර්යාලයේ එහි මෙහෙයුම් මැදිරිය ස්ථාපනය කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම 2023 වසරේ මුල් භාගයේදී අවසන් කරන ලද අතර එය වසරක කාලයක් ක්‍රියාත්මක කිරීමෙන් පසු එහි ක්‍රියාකාරිත්වය සම්බන්ධව වාර්තාවක් ලබා ගැනීමටත් එහි හඳුනාගන්නා ලද නිවැරදි කිරීම් කටයුතු සිදු කරන ලදී.

අධිකරණ කටයුතු සඳහා රැඳවියන් බන්ධනාගාරය තුළ සිටම අන්තර්ජාලය ඔස්සේ ඉදිරිපත් කිරීමේ හැකියාව සහිත Virtual Courts ව්‍යාපෘතිය දකුණු පාළාත් බන්ධනාගාර වල ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පරිඝණක පහසුකම් UNODC ආයතනය විසින් සපයනු ලැබිය. ඊට අදාළ ඉදිකිරීම් කටයුතු සිදු කරන ලද අතර ඊට අවශ්‍ය ඩිජිටල් තිර, ගෘහභාණ්ඩ ඇතුළු සියළුම උපකරණ ලබා දීමද සිදුවිය. අඟුණකොළපැලැස්ස බන්ධනාගාරයට අදාළ Virtual Courts ඉදිකිරීම 2024 වසර තුළ නිම කිරීමට කටයුතු කරන ලද අතර ගාල්ල හා කළුතර බන්ධනාගාරයන්හි ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී. විශේෂ ගණයේ රැඳවියන් හට බන්ධනාගාරයෙන් පිටතදී ප්‍රහාරයන්ට ලක්වීම වලක්වා ගැනීම, අධිකරණ කටයුතු වඩාත් ක්‍රමවත්ව හා අවම පිරිවැයක් යටතේ සිදුකිරීමට හැකිවීම, අධිකරණ ආරක්ෂණ කටයුතු සඳහා යොදවන වන මානව සම්පත අවම වීම යන සියළුම කරුණු වලට මෙමගින් යම් විසඳුමක් ලැබේ. එමෙන්ම බන්ධනාගාර තුලට තහනම් ද්‍රව්‍ය ඇතුළුවීම අවම කර ගැනීමටද මෙම ක්‍රමවේදය තුළින් හැකියාව ලැබී ඇත.








බන්ධනාගාර ආයතන වල ප්‍රයෝජනය සඳහා CCTV කැමරා කිහිපයක්, ජීවමිතික ඇඟිලි සලකුණු ස්කෑනර් යන්ත්‍රයක් හා මෙටල් ඩිටෙක්ටර් උපකරණයක් UNODC ආයතනය විසින් ලබා දෙන ලදී.

බන්ධනාගාර ආයතනයන්හි ආරක්ෂක ක්‍රියාවලි වඩිමත් කිරිම සඳහා 2024 වසර තුළ මිමී.09 පිස්ටල් 10ක් , රිස්ට් කෆ් 750ක් මිලදී ගැනීමට කටයුතු කර ඇත. එමෙන්ම කැරළි මර්ධන බැටන් 500ක් හා යුගල අත් මාංචු 400ක් මිලදී ගැනීමට අදාළ ඇණවුම් 2024 වර්ෂයේ ප්‍රදානය කර ඇති අතර ඊට අදාළ භාණ්ඩ 2025 වසරේ ලැබීමට නියමිතය.

බූස්ස අධි ආරකෂිත බන්ධනාගාරය හා මීගමුව යන බන්ධනාගාර ආයතන වල පුද්ගල පරීක්ෂා කිරිමේ ස්කෑන් යන්ත්‍ර 02ක අළුත්වැඩියා කිරීමට කටයුතු කරන ලද අතර බූස්ස අධි ආරක්ෂිත බන්ධනාගාරයට අයත් ආරක්ෂිත කැමරා පද්ධතිය වැඩිදියුණු කිරිමටද කටයුතු කරන ලදී.

### බන්ධනාගාර සෞඛ්‍ය සේවය විධිමත් කිරීම

බන්ධනාගාර නේවාසිකයින් සෞඛ්‍ය තත්වය ඉහල නැංවිම යටතේ තෙවන වරටත් ඇසේ සුද ඉවත් කිරීමේ අක්ෂි ශල්‍ය කඳවුරක් මෙම වසර තුළද බන්ධනාගාර රෝහලේ දී සිදුකිරිමට කටයුතු කරන ලද අතර ඒ යටතේ නේවාසිකයින් 50කගේ ඇසේ සුද ඉවත් කිරීමට කටයුතු කරන ලද අතර ඊට ජාතික අක්ෂි රෝහලේ වෛද්‍ය හා හෙද කර්ය මණ්ඩලයද සිය පූර්ණ සහයෝගය ලබා දෙන ලදී.





HIV/AIDS පිළිබඳ පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහනක් ජාතික ඒඩ්ස් මර්ධන ඒකකය හා එක්ව සංවිධානය කරන ලද අතර එමගින් බන්ධනාගාර ආයතනයන්හි නිලධාරීන් මගින් නේවාසිකයින් දැනුවත් කිරීමට අපේක්ෂා කරනු ලබයි. එමෙන්ම මෙම වැඩසටහනේ ප්‍රගතිය බන්ධනාගාර මූලස්ථානයේදී සමාලෝචනය කිරීමටද කටයුතු කරනු ලබයි.






වැලිකඩ බන්ධනාගාර නේවාසිකයින්ගේ අක්ෂි පරීක්ෂාවක් සිදුකර ඇස් කණ්නාඩි ලබා දීමේ වැඩසටහනක් විදේශීය පරිත්‍යාගශීලීන්ගේ සහභාගිත්වය යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.





## රැඳවි විශෝධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම හා ශ්‍රම බලකායේ ඵලදායී භාවිතය සඳහා වන ක්‍රියාමාර්ග

- වීරවිල මත්ද්‍රව්‍ය ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයයේ රඳවා ඇති නේවාසිකයින්ගේ වෘත්තීය අධ්‍යාපන මට්ටම ඉහල නැංවීම සඳහා වෘත්තීය පුහුණු ගොඩනැගිල්ල ඉදිකිරීමට කටයුතු කරනු ලබන අතර එහි ඇළුමිනියම් දොර, ජනෙල් ඉදිකිරීම් කටයුතු මෙම වසරේ කොන්ත්‍රාත් පදනම මත සිදු කරන ලද අතර නිලධාරීන්, නේවාසිකයින් හා වීරවිල කඳවුරේ වගාවන් සඳහා පැවති වන අලි තර්ජනයට විසඳුමක් ලෙස ජාතික ඉංජිනේරු පර්යේෂණ සංවර්ධන ආයතනය සමග ඒකාබද්ධව විදුලි වැට සකස් කිරීමට කටයුතු කර ඇත. එබැවින් එහි රැඳවි විශෝධන ක්‍රියාවලිය සිදු කිරිමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට කටයුතු කර ඇත. තවද නේවාසික ශ්‍රමය යොදවා ගෙන කෘෂිකාර්මික කටයුතු සාර්ථකව සිදු කිරීමට හැකි වන පරිදි වන අලි තර්ජනයටද විසඳුමක් ලබා දී ඇත.

- බන්ධනාගාරගත සිරකරුවන්ගේ සුභසාධන කටයුතු වඩාත් විධිමත් කරමින් ආරක්ෂාව, රැකවරණය ලබාදෙමින්, යහපත් පුරවැසියන් ලෙස පුනරුත්ථාපනය කර සමාජගත කිරීම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ සාක්ෂාත් කරමින් 26 වන සිරකරු දිනය නිමිත්තෙන් දිවයිනපුරා විසිරී ඇති බන්ධනාගාර ආයතන තුළ රැඳවියන්ගේ කායික, මානසික හා ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීම අරමුණින් සර්ව ආගමික වැඩසටහන්, සෞඛ්‍යය වැඩසටහන්, ක්‍රීඩා හා පෞරුෂත්ව වැඩසටහන්, පවුල් හමු වැඩසටහන් මෙන්ම මත්ද්‍රව්‍යය නිවාරණ වැඩසටහන් වැනි වැඩසටහන් රාශියක් සිරකරු සුභසාධක සංගමයේ ප්‍රාදේශීය උපකමිටු අනුග්‍රාහකත්වයෙන් පවත්වන ලදි.මෙහිදී බලපත්‍රමත නිදහස් වූ රැඳවියන්ගේ ඉදිරි අනාගත සුභසිද්ධිය උදෙසා වෘත්තීය උපකරණ කට්ටල, පෙදරේරු කට්ටල, කරණවැම් කට්ටල හා ශිෂ්‍යත්ව ප්‍රදානයක් සිදුකරන ලදී.

- ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය විසින් සංවිධානය කරනු ලැබූ ජාතික බාලදක්ෂ සම්මාන උලලේදී බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් නේවාසික බාලදක්ෂ කටයුතු නගාසිටුවීම සඳහා සිදුකරන ලද සේවාව ඇගයීම වෙනුවෙන් සම්මානයට පාත්‍රවීම සිදුවිය. බන්ධනාගාර ආයතනයන්හි නේවාසිකයින් උදෙසා සිදුකරනු ලබන බාලදක්ෂ කටයුතු මගින් පෞර්ෂය සංවර්ධනය, නායකත්ව සංවර්ධනය, කණ්ඩායම් හැඟීම, අධ්‍යාත්මික සංවර්ධනය, චිත්තාවේග පාලනය හා ශාරීරික යෝග්‍යතාව හා ගුණාංග සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන අතර පුනරුත්ථාපන ක්‍රියාවලියේ එක් මානයක් ලෙස එය ක්‍රියාත්මක කෙරේ.






- UNODC ආයතනය මගින් පල්ලේකැලේ සිර කඳවුරේ බේකරි පාසැලක් ස්ථාපනය සඳහා ලබා දෙන උපකරණ භාවිතය සඳහා අවශ්‍ය ගොඩනැගිලි අවශ්‍යතාව 2024 වසරේදී සම්පූර්ණ කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව බේකරි පාසැල ආරම්භ කිරීමට කටයුතු කර ඇති අතර බේකරි නිශ්පාදන පිළිබඳ පුහුණු පාඨමාලාවක් නේවාසිකයින්ට ලබා දෙන අතර, ඉදිරියේදී මෙම පාඨමාලාව සහතිකපත්‍ර පාඨමාලාවක් ලෙස නේවාසිකයින් වෙනුවෙන් ලබාදීමටද කටයුතු සිදු කරමින් පවති. මෙමගින් නිශ්පාදනය සිදුකරනු ලබන බේකරි ආහාර නේවාසිකයින්ගේ පරිභෝජනයටත්, ප්‍රාදේශීයව අලෙවි කිරීමටත් කටයුතු සූදානම් කර ඇත.







## e - බන්ධනාගාර සංකල්පය ක්‍රියාත්මක කිරීම

රැඳවි තොරතුරු කළමනාකරණ පද්ධතිය(PIMS) සියළු ආයතන තුල ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබෙන අතර එමගින් රැඳවියකු ඇතුලත්වීමේ සිට නිදහස් වීම දක්වා මෙතෙක් ගොනු මගින් කළමනාකරණය කරන ලද තොරතුරු පරිඝණක ගත කිරීමට හැකි වනු ඇත. මෙම පද්ධතිය දිවයින පුරා බන්ධනාගාර ආයතන වල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිඝණක 133ක් මෙම වසර තුල සපයා දීමට කටයුතු කරන ලදි.



මෙම පද්ධතිය භාවිතයෙන් ඇතුලත්වීම්, සිර ලියාපදිංචිය, සිර මාරු, වාට්ටුගත කිරීම, නිදහස් කිරීම්,ගේට්ටු ඇතුලත් කිරීම්, පිටත් කිරීම්, අමුත්තන් කලමණාකරනය හා නේවාසිකයින්ගේ නඩු කටයුතු කලමණාකරනය වැනි කටයුතු මේ වන විට බන්ධනාගාර ආයතන මට්ටමින් සිදුකරන අතර පුනරුත්ථාපන හා කර්මාන්ත කටයුතු වල දත්ත ඇතුලත් කිරීම් සඳහා වන පුහුණුවද ලබා දීමට මෙම වසරේ කටයුතු කරන ලදී. එමගින් එම අංශ දෙකේ කටයුතු ද ඉදිරියේදී මෙම පද්ධතිය ඔස්සේ සිදු කිරීමට අපේක්ෂිත ය.

### බන්ධනාගාර කාර්ය මණ්ඩල පහසුකම් වැඩි දියුණු කිරීම, ඔවුන්ගේ සුභසාධන කටයුතු වැඩි දියුණු කිරීම හා ක්‍රීඩා කුසලතා නගා සිටුවීම

කොළඹ බන්ධනාගාර පරිශ්‍රයේ අළුත්වැඩියා කල යුතු තත්වයේ පැවති තුන් මහල් නිල නිවාසයේ අළුත්වැඩියා කටයුතු 2023 වසරේ ආරම්භ කරන ලද අතර එය 2024 වර්ෂයේදී රු.මිලියන 23.34 ක පිරිවැයක් දරා නිම කිරීමට කටයුතු කර ඇත. එමෙන්ම එහි ප්‍රතිලාභීන් වෙත භාර දීමද මෙම වසරේ සිදුකරන ලදී



හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකා නිලධාරීන් සඳහා වන නව බැරැක්කයේ ඉදිකිරීම් කටයුතු මෙම වසරේ 2023 වසරේ ආරම්භ කරන ලද අතර නර්ඩ් තාක්ෂණය භාවිතයෙන් කරන ලද මෙම බැරැක්කයේ ඉදිකිරීම් කටයුතු 2024 වසරේ රු.මිලියන 9.64ක පිරිවැයක් යටතේ නිම කිරීමට කටයුතු සිදු කරන ලදී. මෙහි වැසිකිළි පද්ධතියේ ඉදිකිරීම් කටයුතු සිර ශ්‍රමය යටතේ සිදුකරමින් පවතී.



ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව වර්ෂ 1905 ජූලි මස 16 වන දින ස්වාධීන දෙපාර්තමේන්තුවක් ලෙස ආරම්භ කර වසර 119 ක අභිමානවත් සංවත්සරය සැමරීමට සමගාමීව බන්ධනාගාර සේවයේ යෙදී සිටියදී තම ජීවිතය රාජකාරිය වෙනුවෙන් පරිත්‍යාග කළ උදාර බන්ධනාගාර නිළධාරීන් 16 දෙනෙකු අනුස්මරණය කරමින් ඔවුන්වෙත පුෂ්පෝපහාර පැවැත්වීමේ උත්සවය වැලිකඩ බන්ධනාගාරය ඉදිරිපිට ඇති නිළධාරී අනුස්මරණ ස්මාරකය අසලදී පැවැත්වීමට කටයුතු කිරීම

ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව ආරම්භ කර වසර 119 ක අභිමානවත් සංවත්සරය සැමරීම වෙනුවෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුවට විවිධ ක්ෂේත්‍ර ඔස්සේ විශිෂ්ඨ සේවාවක් කල බන්ධනාගාර නිලධාරීන් වෙනුවෙන් සේවා ඇගයීමේ උත්සවයක් අගුණකොලපැලැස්ස බන්ධනාගාර ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට කටයුතු කර ඇත. එමගින් නිලධාරීන්ගේ කැපවීම, දක්ෂතා හා කුසලතා ඇගයීම තුළින් අභිප්‍රේරණය වීමට හේතු වේ









බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පැවති පහත තනතුරු වල පුරප්පාඩු 2024 වසර තුළ සම්පූර්ණ කිරීමට හැකි විය.

i. බන්ධනාගාර කොමසාරිස් (මානව සම්පත්) - 01
ii. ගණකාධිකාරී - 01
iii. තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිලධාරී - 01
iv. තොරතුරු සන්නිවේදන තාක්ෂණික සහකාර - 02
v. බන්ධනාගාර නියාමක - 172
vi. මුරකරු - 01

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පැවති පහත තනතුරු වල උසස්වීම් පිරිනැමීමටද 2024 වසර තුළ හැකි විය.

i. බන්ධනාගාර කොමසාරිස් - 04
ii. විශේෂ ශ්‍රේණියේ බන්ධනාගාර අධිකාරී - 06
iii. බන්ධනාගාර අධිකාරී - 05
iv. ප්‍රධාන පුනරුත්ථාපන නිලධාරී - 03
v. ප්‍රධාන ජේලර් - 01
vi. I පෙළ පුනරුත්ථාපන නිලධාරී - 05
vii. I පෙළ ජේලර් - 31
viii. II පෙළ ජේලර් - 15

වර්තමානයට සරිලන ලෙස යාවත්කාලීන නොවූ බන්ධනාගාර නිලධාරීන්ගේ දීමනා මෙම වසර තුළ වැඩි කර ගැනීමට හැකියාව විවිර විය. ඒ යටතේ මෙතෙක් ගෙවීම් කරන ලද යහපත් කල් ක්‍රියා දීමනාව රු.500/- සිට රු.2000/- දක්වාද අවදානම් දීමනාව රු.1500/- සිට රු.8000/- දක්වාද සෞඛ්‍ය ආරක්ෂිත දීමනාව රු.750/- සිට රු.3000/- දක්වා රු.10,250/- දීමනා වැටුපට සමගාමීව ලබා දීමට කටයුතු කිරීමට හැකිවීම.එමගින් බන්ධනාගාර නිලධාරීන්ගේ දීමනා රු.13,000/- දක්වා වැඩි කර ගැනීමට 2024 වසරේදී හැකි වීම.

අඟුණකොළපැලැස්ස බන්ධනාගාර පරිශ්‍රයේ ඉදිකරන ලද නව ටෙනිස් ක්‍රීඩා පිටිය විවෘත කරමින් මෙම වසරේ අන්තර් බන්ධනාගාර ටෙනිස් තරඟාවලිය බන්ධනාගාර ආයතන 15ක ක්‍රීඩක ක්‍රීඩිකාවන් 115ක පමණ සහභාගීත්වයෙන් අති උත්කර්ශවත් අන්දමින් පැවැත්වීමට කටයුතු සිදුකිරීම.









ශ්‍රී ලංකා කරාතේ දෝ සංගමය හා ක්‍රීඩා අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද ජාතික කරාතේ ශූරතාවලියේදී අවුරුදු 46-50 (පිරිමි) කිලෝග්‍රෑම් 85ට වැඩි කලුපටි කාණ්ඩයේ කතා සහ කුමි යන ඉසව් නියෝජනය කරමින් සහභාගී වූ බන්ධනාගාර නිලධාරීන් හට රිදී පදක්කම් දිත්වයක් දිනා ගනිමින් බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත කීර්තියක් ලබා දීමට එම නිලධාරීන්ට හැකිවීම.

පල්ලේකැලේ හා කොළඹ බන්ධනාගාර සංකීර්ණයේ නිලධාරීන් හට ටෙනිස් ක්‍රීඩාවෙන් සිය ක්‍රීඩා කෞෂල්‍යා වැඩි දියුණු කරගත හැකි වනසේ ටෙනිස් ක්‍රීඩා පිටි සකසා විවෘත කිරීමට කටයුතු කිරීමත් ටෙනිස් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍යා උපකරණ පරිත්‍යාගයන් භාර ගැනීමත් මෙම වසරේ සිදුවිය. මෙමගින් බන්ධනාගාර නිලධාරීන් අතර ටෙනිස් ක්‍රීඩාව ප්‍රචලිත කර එමගින් දක්ෂතා සහිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික තලය දක්වා රැගෙන යාම අරමුණුවිය.





### අභියෝග -

බන්ධනාගාර තදබදයට යොජිත විසඳුම් පිළිබඳව සකසන ලද යෝජනාවලියේ සඳහන් කෙටිකාලීන සැලසුම් බොහොමයක් අත්පත් කර ඇති අතර නීතිමය රාමුව තුල සිදුකිරීමට හඳුනාගෙන ඇති මධ්‍ය කාලීන සැලසුම් හා නව ඉදිකිරීම් මගින් අන්තර්ජාතික ප්‍රමිතීන්ට සරිලන පරිදි ධාරිතාව පුළුල් කිරීමට හඳුනාගෙන පවතින යටිතල පහසුකම් සංවර්ධනයන් ඇතුලත් දිගු කාලීන සැලසුම් ක්‍රියාවට නැංවීම. බන්ධනාගාර තදබදය හේතුවෙන් නේවාසිකයින් නිසි පරිදි වර්ගීකරණය කර අවම ප්‍රමිතීන් යටතේ රඳවා තැබීමට ඇතැම් බන්ධනාගාර ආයතන වල නොහැකිවීම.

- අධික රිමාණ්ඩ් නේවාසිකයින් ප්‍රමාණය හේතුවෙන් අපේක්ෂිත පරිදි පුනරුත්ථාපන කටයුතු සිදු කිරීමට බාධා වීම. එමෙන්ම බන්ධනාගාර ගත වූවන්ගෙන් මත්ද්‍රව්‍ය භාවිතා කරන නේවාසිකයින් ප්‍රමාණය වැඩිවීම මත ඔවුන්ට අවශ්‍ය ප්‍රතිකාරාත්මක හා පුනරුත්ථාපන ක්‍රියාවලිය අනෙකුත් රැඳවියන් සමග සිදුකිරීමට අපහසුවීම.

- බන්ධනාගාර තදබදය හා බන්ධනාගාර අශ්‍රිත පැන නගින බන්ධනාගාර දෙපාර්තමේන්තු මට්ටමින් විසඳා ගත නොහැකි එහෙත්, බන්ධනාගාර පරිපාලනයට හා කළමනාකරනයට මෙන්ම ජාතික ආරක්ෂාවට සෘජුව අදාළවන ගැටළු ආමන්ත්‍රණය කිරිම සඳහා ඊට අදාල සියළුම පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණයක් අවශ්‍ය වීම.

- දීර්ඝ කාලීනව රඳවා තබා සිටින සිරකරුවන්,ජීවිතාන්ත හා මරණීය දණ්ඩන සිරකරුවන් සඳහා සමා ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වීම. එසේ නොමැති වීම මත ඔවුන් තුල අපේක්ෂාවක් නොමැති වීම මත ඔවුන් තුල ගොඩනැගී ඇති නොසන්සුන්තාව හා එමගින් නිලධාරීන් වෙත පවතින පීඩනය.

- බන්ධනාගාර ආයතන බොහොමයක පවතින යටිතල පහසුකම් ඉපැරණි වීම හා එය අළුත්වැඩියා කල නොහැකි තත්වයේ වීම. නවීන තාක්ෂණික මෙවලම් භාවිතයට ගැනීමට මෙම ඉදිකිරීම් තුළ නොහැකි වීමත් යටිතල පහසුකම් පුළුල් කිරිමට අවශ්‍ය භූමියේ ඉඩකඩද නොමැති වීම.

- බන්ධනාගාරගත නේවාසිකයින් දෛනික අධිකරණ කටයුතු, වෛද්‍ය සායන හා වෙනත් බන්ධනාගාර සඳහා ආරක්ෂණයට ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් නොමැති වීම.

- බන්ධනාගාර නිලධාරීන් සඳහා අවස්ථා කිහිපයකදීම යෝජිත මෙතෙක් වැඩි නොකරන ලද වැටුප් වැඩි කිරිමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.එමෙන්ම ඔවුන්ගේ රාජකාරි ස්වභාවය හා බැඳුනු වගකීම් හා ආතතියට සරිලන පහසුකම් ලබා දීමට නොහැකි වීම. මේ හේතුවෙන් සැලකිය යුතු නිලධාරින් පිරිසක් සේවය හැරයාම. එමෙන්ම නිලධාරින් බොහොමයක් බැරැක්ක, නිල නිවාස ඉතාමත් දුර්වල තත්වයේ අවම පහසුකම් සහිතව පැවතීම. විශේෂයෙන් කොළඹ බන්ධනාගාර සංකීර්ණය විතැන් කිරිමට නියමිත හේතුවෙන් වසර ගනනාවක සිට ඊට අයත් නිල නිවාස, බැරැක්ක හා අභ්‍යන්තර මාර්ග ආදී යටිතලපහසුකම් සංවර්ධනයට ප්‍රතිපාදන සලසා ගැනීමට නොහැකිවීම.

- බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ දැනට අනුමත කාර්ය මණ්ඩලය 2013 වසරේ අනුමත කාර්ය මණ්ඩලය වන අතර එය එවකට පැවති නේවාසිකයින් ප්‍රමාණයට සාපේක්ෂව වේ. වර්තමානයේ පවතින සේවා පුළුල් කිරිම, කලාපීය විශෝධන සේවාවලට සාපේක්ෂව ලගා කරගත යුතු අත්‍යාවශ්‍ය අවශ්‍යතා, තර්ජන වල ප්‍රවණතා හා නේවාසිනයින් ප්‍රමාණයට සරිලන පරිදි සේවක සංඛ්‍යා අවශ්‍යතාව තාක්ෂණිකව විශ්ලේෂණය කර සංශෝධනයට අවශ්‍ය කටයුතු සිදුකර ගැනීම.

- බන්ධනාගාර දෙපාර්තමේන්තු පස් අවුරුදු සැලැස්ම තුල හඳුනා ගෙන පවතින සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඒකාබද්ධව සිදු කල යුතු බන්ධනාගාර සෞඛ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම. වෛද්‍ය, හෙද, ඖෂධ සංයෝජක කාර්ය මණ්ඩලය වැඩිකර ගැනීම හා බන්ධනාගාර ආයතනයකට අවම වශයෙන් එක් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු ලෙස එම කාර්ය මණ්ඩලයද පුළුල් කර ගැනීම.

- රැඳවියන්ගේ ආරක්ෂාවට පවතින විවිධාකාර තර්ජන කල්තියා හඳුනාගැනීම හා ඊට අවශ්‍ය ආරක්ෂක විධිවිධාන හා තාක්ෂණික යටිතල පහසුකම් සහිතව සංවිධානය වීම.

- බන්ධනාගාර ආයතන තුළට සංසරණය වන තහනම් ද්‍රව්‍ය අවම කිරීම හා ඒවා රැගෙන ඒමට භාවිතා කරන සංකීර්ණ හා විවිධ උපක්‍රම හසුකරගත හැකි වන අයුරින්වන තාක්ෂණික මෙවලම් වල හිඟතාව.

- අපරාධකරුවන් විසින් බන්ධනාගාර නිලධාරින්ට හා ඔවුන්ගේ පවුල්වලට එල්ලකරන තර්ජන. එමගින් බන්ධනාගාර පරිපාලනයට හා කළමණාකරනයට අපහසුතාවයන් ඇතිවීම.

- බන්ධනාගාර නිලධාරීන්ගේ ආකල්ප වැඩිදියුණු කිරීම හා අපරාධකරුවන්ගේ ග්‍රහනයට හසුනොවී සිය වෘත්තිමයභාවය ගොඩනැංවීමට අවශ්‍ය කටයුතු සිදුකිරිම.

ඉදිරි ඉලක්ක -

- පල්ලේකැලේ බන්ධනාගාරයේ ඉදිකිරීම් සම්පූර්ණයෙන්ම නිම කිරීමට අවශ්‍ය ඉතිරිව පවතින සිර ගොඩනැගිලි ඉදිකිරීම හා අනෙකුත් සේවාවන් සැපයීමට වන කාර්යන් සඳහා ඉදිරි වර්ෂයන්ගෙන් ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම හා 2028 වසරට පෙර සියළු ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම.

- වාරියපොල බන්ධනාගාරය පුළුල් කිරිමේ ව්‍යාපෘතියේ සැලසුම් හා නිර්මාණ කටයුතු ආරම්භ කිරීම හා එම බන්ධනාගාරයට අත්‍යාවශ්‍යව පවතින මුර අට්ටාල ඉදිකිරීම.

- වැලිකඩ හා කළුතර බන්ධනාගාර වල දැනට පවතින නුසුදුසු බැවින් භාවිතයෙන් අත් හල ගොඩනැගිලි අළුත්වැඩියාව සඳහා වාර්ෂිකව අය වැය මගින් අළුත්වැඩියා සඳහා වෙන්වන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන අතර ඊට අදාලව වෙනම ප්‍රතිපාදන වෙන්කර නේවාසික ජීවිතවල ආරක්ෂාවට තර්ජනයක්ව පවතින ඉතා අබලන් ගොඩනැගිලි නියමිත ප්‍රමිතීන්ට අළුත්වැඩියා කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාව සපුරා ගැනීම. කොළඹ බන්ධනාගාර ආයතන වල පවතින තදබදයට විකල්පයක් ලෙස වටරැක බන්ධනාගාරයේ ඉතිරි මායිම් තාප්ප කොටස සම්පූර්ණ කර කඩුවෙල, හෝමාගම අධිකරණ වලට යොමු කිරීමට නියමිත නේවාසිකයින් සඳහා එහි නේවාසික පහසුකම් ගොඩනැගීම.

- බන්ධනාගාර අඥාපනත හා ඊට අදාළ නීති සංශෝධනයන් සිදු කර අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමේ ක්‍රියාවලිය ඉටුකරවා ගැනීම.

- රැඳවියන්ගේ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරිම සඳහා අයවැය මගින් වෙන්වූ ප්‍රතිපාදන මගින් හඳුනාගත් ආයතන (කුරුවිට, පොලොන්නරුව, මීගමුව, වාරියපොළ) සඳහා විධිමත් මල අපවහන පද්ධතියක් සැලසුම් හා නිර්මාණය කර ඉදිකිරීම් සිදු කිරිමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.

- කොළඹ බන්ධනාගාර සංකීර්ණය විතැන් කිරිමට අවශ්‍ය ඉදිරි කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය හා අධිකරණ අමාත්‍යාංශය සමග ඒකාබද්ධව නැවත ආරම්භ කිරීමට කටයුතු කිරීම.

- බූස්ස බන්ධනාගාරයට අවශ්‍ය පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම හා පැරණි බන්ධනාගාර ගොඩනැගිලි නවීකරණය කිරීම.

- බන්ධනාගාර ආයතනවලට ඇතුළු වන නොයෙකුත් තහනම් ද්‍රව්‍ය හසුකරගැනිමට භාවිතා කරන සාම්ප්‍රදායික පුද්ගල පරික්ෂාව වෙනුවට තාක්ෂණ ක්‍රමෝපායන් ලෙස ආරක්ෂිත කැමරා ආවේක්ෂණ පද්ධති දුම්බර,ගාල්ල, අනුරාධපුර, මාතර, වාරියපොළ යන බන්ධනාගාර ආයතනවල ස්ථාපනයට කටයුතු කිරීම. එමෙන්ම පාර්සල් ස්කෑනර්, බොඩි ස්කෑනර්, දුරකථන සංඥා බාධක හා ඊට අදාළ උපාංග සෝදිසි කිරිමේ උපකරණ හා Walk through අත්‍යාවශ්‍ය බන්ධනාගාර ආයතන වෙත මිලදී ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීම.

- මාතර බන්ධනාගාර විතැන් කිරීමේ වැඩසටහනට අදාලව මාතර කොටුව තුල පවතින රිමාණ්ඩ් බන්ධනාගාරය කොටවිලවත්ත නව අධිකරණ සංකීර්ණයට යාබදව හෙක්ටයාර 3.1038ක භූමි ප්‍රමාණයක පිහිටි ඉඩම තුල ඉදිකිරීමට වන ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිමය එකඟතාව 2016 වර්ෂයේ හිමි වී ඇත. ඒ අනුව 2018.08.06 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව රු.මි.2950ක වැය ඇස්තමේන්තුවක් යටතේ 2019-2021ක මධ්‍ය කාලීන අයවැය රාමුව තුල ඉදිකර අවසන් කිරීමට අනුමැතිය හිමි වුවද 2019/2020/2021 අයවැය යටතේ ඉල්ලුම් කල ප්‍රතිපාදන වෙන් නොවීම. එබැවින් 2025 වසරේදී සැලසුම් හා නිර්මාණයට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර ගෙන ව්‍යාපෘතිය ආරම්භ කිරිමට ඉලක්ක කර ඇත.

- රැඳවි තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ජීවමිතික දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට හැකිවන පරිදි අදාළ උපකරණ හඳුනාගෙන ඊට අදාළව මෘදුකාංගය සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම. එමෙන්ම මහර බන්ධනාගාරයේ පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතුවලට සමගාමීව ජාලගත කිරීමට කටයුතු කිරීම.

- අතත්‍ය අධිකරණ (Virtual Courts) පහසුකම් දකුණු පළාතේ බන්ධනාගාර ආයතන වල හැර අනෙකුත් බන්ධනාගාර ආයතන සඳහාද ව්‍යාප්ත කිරීම.

- මාර්ගගතව වෛද්‍ය උපදේශණ සේවාව (Tele Medicine) බන්ධනාගාර ආයතන වල සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරිම හා කාර්යක්ෂම කිරිම උදෙසා හඳුන්වා දීම

- කාන්තා රැඳවියන් හටද සිය දණ්ඩනයේ අවසන් කාලය සමාජගත කිරීමට සුදුසු පරිසරයක් සහිතව ගත කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දීම.

- කාන්තා නේවාසිකයින් සඳහා වෘත්තීය පුහුණු අවස්ථාව විවිර කර දීමට අවශ්‍ය වැඩ පිළිවෙලක් සකස් කිරීම.

- තරුණ වරදකරුවන් සඳහා විශේෂ වූ පුනරුත්ථාපන වැඩ සටහනක් නිර්මාණය කිරීම හා ඒ යටතේ ඔවුන්ගේ වෘත්තීය නිපුණතා සංවර්ධනයට කටයුතු කිරීම. එමෙන්ම තරුණ කාන්තා වරදකරුවන්ද වෙන් කර රැඳවීම හා ඔවුන්ටද විශේෂ වූ පුනරුත්ථාපන වැඩ සටහනක් නිර්මාණය කිරීම.

- බන්ධනාගාර සේවාව වෘත්තීමය සේවාවක් බවට පත් කිරීමට සියළුම තනතුරු වලට අදාළ බඳවා ගැනිමේ පටිපාටි සඳහා වන අනුමැතින් ගෙන ඊට අදාළව සකස් කර ඇති සේවා ව්‍යවස්ථාව යාවත්කාලීන කර ඒ සඳහාද අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීම.

- මහර බන්ධනාගාර සිද්ධිය සම්බන්ධ පංච පුද්ගල කමිටු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

- බන්ධනාගාර දෙපාර්තමේන්තු පස් අවුරුදු සැලැස්මේ සඳහන් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි එහි මෙතෙක් ක්‍රියාවට නැංවීමට නොහැකි වූ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමත් හා දැනට ක්‍රියාත්මක තත්වයේ පවතින ක්‍රියාකාරකම්වල ප්‍රගතිය නියාමනය.

- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා බන්ධනාගාර පද්ධතිය අධ්‍යයනය මගින් හඳුනාගෙන පවතින ප්‍රධාන අවශ්‍යතා හා ඊට අදාල නිර්දේශ ක්‍රියාවට නැංවීම.

- බන්ධනාගාර දෙපාර්තමේන්තුව සම්බන්ධව සිදුකරන අධ්‍යනයන්ට අනුව විගණකාධිපතිතුමන් විසින් යොමු කරන ලද 2018 හා 2023 වර්ෂවලට අදාළ විශේෂ වාර්තාවන්හි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

**එච්.එම්.ඒ.එන්. උපුල්දෙණිය**
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

# බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින
# 2024.01.01 දින සිට 2024.12.31 දින
# දක්වා සිදු කරන ලද
# සුවිශේෂී කාර්යයන





## නේවාසිකයින්ගේ දරුවන් හට ශිෂ්‍යත්ව ප්‍රදානය





“සිරගතවුවන්ගේ දරුවන්ගේ මිතුරෝ” සංවිධානය මගින් වැලිකඩ බන්ධනාගාර පුනරුත්ථාපන අංශයේ සංවිධාන ශක්තියෙන් දිර්ඝකාලීන සිරදඬුවම් විඳින නේවාසිකයිගේ දරුවන් හට ශිෂ්‍යත්ව පිරිනැමීමේ උත්සවයක් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහතාගේ ප්‍රධානත්වයෙන් වැලිකඩ බන්ධනාගාර පරිශ්‍රයේදී සිදු කරන ලදි.



## නේවාසිකයින්ගේ සෞඛ්‍ය තත්වය ඉහල නැංවීමේ අරමුණින් ඇසේ සුද ඉවත් කිරීමේ අරමුණින් අක්ෂි ශල්‍ය කඳවුරක් පැවැත්වීම



බන්ධනාගාරගත නේවාසිකයින්ගේ සෞඛ්‍යය තත්වය ඉහල නැංවීමේ එක් අදියරක් ලෙස තෙවන වරටත් පවත්වන ලද ඇසේ සුද ඉවත් කිරීමේ අක්ෂි ශල්‍ය කඳවුරක්, වැඩබලන සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය සුදත් ධර්මරත්න මහතාගේ හා බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහතාගේ ප්‍රධානත්වයෙන් වැලිකඩ බන්ධනාගාර රෝහල් පරිශ්‍රයේදී පවත්වන ලදී.



## ඒකාබද්ධ සේවා නිලධාරීන් හා කොළඹ ආයතනයන්හි පුද්ගලික ලිපිගොණු සම්බන්ධව රාජකාරී සිදුකරන නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩමුළුවක්



බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ඒකාබද්ධ සේවා නිලධාරීන් හා කොළඹ ආයතනයන්හි පුද්ගලික ලිපි ගොනු සම්බන්ධයෙන් රාජකාරී කටයුතු කරන නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩමුළුවක් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ බන්ධනාගාර පුහුණු පාසලේදී පවත්වන ලදි.



## එක්සත් ජාතීන්ගේ කාර්යාලය මගින් නවීන අථ්‍ය අධිකරණයක් (Virtual Court) පරිත්‍යාග කිරීම







බන්ධනාගාරගත නේවාසිකයින් අධිකරණ වලට ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව හා කඩිනමින් ඉටු කිරීම සඳහාත්, ඇතිවන අපහසුතා මඟහරවා ගැනීමත් අරමුණු කර ගෙන මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය මගින් පරිත්‍යාග කල නවීන අථ්‍ය අධිකරණයක් (Virtual Court) අගුණකොලපැලැස්ස බන්ධනාගාරයේ ස්ථාපිත කරන ලදි.



## 26 වන සිරකරු දිනය වෙනුවෙන් වැඩසටහන් රාශියක්



බන්ධනාගාර නේවාසිකයින්ගේ සුභසාධන කටයුතු වඩාත් විධිමත් කරමින් ආරක්ෂාව,රැකවරණය ලබාදෙමින්, යහපත් පුරවැසියන් ලෙස පුනරුත්ථාපනය කර සමාජගත කිරීම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණයි.

ඒ බව සාක්ෂාත් කරමින් 2024.09.12 වන දිනට යෙදී තිබූ 26 වන සිරකරු දිනය නිමිත්තෙන් දිවයිනපුරා විසිරී ඇති බන්ධනාගාර ආයතන තුළ රැඳවියන්ගේ කායික, මානසික හා ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීමේ අරමුණින් සර්ව ආගමික වැඩසටහන්, සෞඛ්‍යය වැඩසටහන්, ක්‍රීඩා හා පෞරුෂත්ව වැඩසටහන්, පවුල් හමු වැඩසටහන් මෙන්ම මත්ද්‍රව්‍යය නිවාරණ වැඩසටහන් වැනි වැඩසටහන් රාශියක් සිරකරු සුභසාධක සංගමයේ ප්‍රාදේශීය උපකමිටු අනුග්‍රාහකත්වයෙන් පවත්වන ලදි.




## ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව බන්ධනාගාරගත කාන්තා නේවාසිකයන් සඳහා වැඩසටහන් රාශියක්

2024.03.08 වන දිනට යෙදුන ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව බන්ධනාගාරගත කාන්තා නේවාසිකයින් සඳහා ආකල්පමය වෙනසක් ඇති කිරීමේ අරමුණින් වැලිකඩ බන්ධනාගාර කාන්තා අංශය තුළ වැඩසටහන් රාශියක් සිදු කරන ලදි.



ඒ අනුව, වැලිකඩ බන්ධනාගාර කාන්තා අංශයේ රඳවා සිටින කාන්තා නේවාසිකයින් වෙනුවෙන් බන්ධනාගාර වික්ෂන මණ්ඩලය, ආසියානු අපරාධ නිවාරණ පදනම (ACPF) හා වැලිකඩ බන්ධනාගාර උපකමිටුව අනුග්‍රහය දායකත්වයෙන් වැලිකඩ බන්ධනාගාර පුනරුත්ථාපන අංශයේ සංවිධානයෙන් සිදු කරනු ලැබීය.

## 119 වන අභිමානවත් බන්ධනාගාර සංවත්සරය සැමරීම









ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව වර්ෂ 1905 ජූලි මස 16 වන දින ස්වාධින දෙපාර්තමේන්තුවක් ලෙස ආරම්භ කර වසර 119 ක අභිමානවත් සංවත්සරය සැමරීමට සමගාමීව බන්ධනාගාර සේවයේ යෙදී සිටියදී තම ජීවිතය රාජකාරිය වෙනුවෙන් පරිත්‍යාග කළ උදාර බන්ධනාගාර නිළධාරීන් 16 දෙනෙකු අනුස්මරණය කරමින් ඔවුන්වෙත පුෂ්පෝපහාර පැවැත්වීමේ උත්සවය වැලිකඩ බන්ධනාගාරය ඉදිරිපිට ඇති නිළධාරී අනුස්මරණ ස්මාරකය අසලදී පැවැත්වීමට හා බන්ධනාගාර දෙපාර්තමේන්තුවට විශිෂ්ඨ සේවාවක් කල උදාර බන්ධනාගාර නිලධාරීන් වෙනුවෙන් සේවා ඇගයිමේ උත්සවයක් අගුණකොලපැලැස්ස බන්ධනාගාර ශ්‍රවණාගාරයේදී අධිකරණ, බන්ධනාගාර කටයුතු, අණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයේ අතිරේක ලේකම් ආර්.එස්.හපුගස්වත්ත මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට කටයුතු කරන ලදී.





# 03

# 2024.12.31 දිනෙන් අවසන් ව වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය


3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 45

3.2. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 46

3.3. මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 47

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන 48

3.4.1. පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය 48

3.4.2. පොත්පත් වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශය 51

3.4.3. වාර්තා කිරීමේ පදනම 54

3.4.4. බැරකම් පිළිබඳ ප්‍රකාශය (I) 55

3.4.5. බැරකම් පිළිබඳ ප්‍රකාශය (II) 60

3.4.6. ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර වලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශය 60

3.4.7. අස්ථානගත වව්චර් පිළිබඳ ප්‍රකාශය 61

3.4.8. 2015.10.23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස් වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2024.12.31 දිනට තත්ව වාර්තාව 61

3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 62

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 62

3.7. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 63

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 63

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව 64

## 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

ඒසීඒ-එෆ්

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන - 2024 රු. | | සටහන | තත්‍ය 2024 රු. | 2023 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | 118,160,528 | | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| 71,000,000 | බදු නොවන ආදායම් සහ වෙනත් | 4 | 118,160,528 | 93,790,247 | ඒසීඒ-1 |
| 71,000,000 | **මුළු ආදයම් ලැබීම් (අ)** | | **118,160,528** | **93,790,247** | |
| - | **ආදයම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 15,998,840,000 | 11,264,837,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 57,934,417 | 27,506,291 | ඒසීඒ-4 |
| 250,000,000 | අත්තිකාරම් ගිණුම් | | 429,805,830 | 316,137,756 | ඒසීඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| 250,000,000 | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **16,486,580,247** | **11,608,481,047** | |
| - | **මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)** | | **16,604,740,774** | **11,702,271,294** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 152,379,830 | 64,971,476 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) - (ඈ)** | | **16,452,360,944** | **11,637,299,818** | |
| | **අඩු කළා: වියදම** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | ඒසීඒ2(ii) |
| 5,695,345,000 | වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 5,621,261,298 | 4,525,080,718 | ඒසීඒ2(ii) |
| 9,882,100,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 9,761,085,288 | 6,375,748,051 | ඒසීඒ2(ii) |
| 17,400,000 | සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම් | 7 | 17,351,323 | 19,528,390 | ඒසීඒ2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ2(ii) |
| **15,594,845,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **15,399,697,910** | **10,920,357,159** | |
| | **මූලධන වියදම්** | | | | |
| 190,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 10 | 180,535,386 | 231,116,618 | ඒසීඒ-2(ii) |
| 332,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 231,952,534 | 300,601,728 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 23,000,000 | හැකියා වර්ධනය | 14 | 22,708,957 | 4,473,418 | ඒසීඒ-2(ii) |
| 740,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 371,063,277 | 14,237,421 | ඒසීඒ-2(ii) |
| **1,285,000,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **806,260,155** | **550,429,185** | |
| | **තැන්පතු ගෙවීම්** | | 84,574,259 | 19,921,977 | ඒසීඒ-4 |
| 305,000,000 | **අත්තිකාරම් ගෙවීම්** | | 443,811,862 | 383,293,277 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම (ඌ)** | | **528,386,121** | **403,215,254** | |
| | **මුළු වියදම එ = (ඊ+උ+ඌ)** | | **16,734,344,185** | **11,874,001,598** | |
| **17,434,845,000** | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඒ = (ඉ-එ)** | | (281,983,241) | (236,701,780) | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | (282,570,016) | (236,701,780) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | 586,775 | - | ඒසීඒ-3 |
| | | | **(281,983,241)** | **(236,701,780)** | |

ඒසීඒ-පී

**2024 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන | තත්‍ය 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 14,875,213,347 | 11,189,480,019 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(අ) | 305,067,449 | 286,436,655 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 586,775 | - |
| **මුළු වත්කම්** | | **15,180,867,570** | **11,475,916,674** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 179,219,312 | 138,573,593 |
| දේපළ, පිරියත හා උපකරණ සංචිතය | | 14,875,213,347 | 11,189,480,019 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | 4,624,761 | - |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 121,223,376 | 147,863,062 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 586,775 | |
| **මුළු වගකීම්** | | **15,180,867,570** | **11,475,916,674** |

පිටු අංක 01 සිට 32 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුමේ පිටු අංක 33 සිට 63 දක්වා ඇතුලත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක: 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙක් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසඳීම් කර ඇති බවත්, ඒවා එම සංඛ්‍යා සමග එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුල පවතින බවත්, මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව, එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස්කම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ................................ | ................................ | ................................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | දිනය : 2025/02/27 |
| දිනය : 28/02/2025 | දිනය : 2025/02/27 | |
| ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන<br>ලේකම්<br>අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය<br>අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,<br>කොළඹ 10. | එච්.එම්.ටී.එන්. උපුල්දෙනිය<br>බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>බන්ධනාගාර මූලස්ථානය<br>කොළඹ 09. | ආර්.එම්.ඩී. ජයසිංහ<br>බන්ධනාගාර කොමසාරිස් (මුදල්)<br>බන්ධනාගාර මූලස්ථානය<br>කොළඹ 09. |

## 3.3 මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශනය

ඒසීඒ-සී

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහන | 2024 | 2023 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදයම් නොවන ලැබීම් | | 256,877,623 | 198,750,689 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතුකරන ලද ආදායම් | | 118,160,528 | 93,790,247 |
| අග්‍රිම ලැබීම් | | 15,998,840,000 | 11,264,837,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 430,412,289 | 315,218,684 |
| තැන්පතු ලැබීම් | | 57,934,417 | 27,506,291 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)** | | **16,862,224,856** | **11,900,102,911** |
| **අඩු කළා - මුදල් වැය කිරීම්:** | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 15,363,664,207 | 10,882,649,679 |
| සහනාධාර සහ මාරු කිරීම් | | 17,351,323 | 19,528,390 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 3,741,126 | 5,088,694 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 152,379,830 | 64,971,476 |
| අත්තිකාරම් ගෙවීම් | | 443,851,816 | 383,353,477 |
| තැන්පතු ගෙවීම් | | 84,574,259 | 19,921,977 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **5,791,274,679** | **11,375,513,693** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-( ආ)** | | **796,662,296** | **524,589,217** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | 1,048,733 | 7,114,099 |
| උපණය අය කර ගැනීම | | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | | **1,048,733** | **7,114,099** |
| **අඩු කළා - මුදල් වැය කිරීම්:** | | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් | | 797,124,254 | 531,703,316 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | | **797,125,254** | **531,703,316** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | | **(796,075,521)** | **(524,589,217)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)** | | **586,775** | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | | **-** | **-** |
| **අඩු කළා - මුදල් වැය කිරීම්:** | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) -(ඒ)** | | 586,775 | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | **586,775** | **-** |

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන

### 3.4.1 මූල්‍ය ප්‍රකාශ සටහන් - පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

**(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)**

**වියදම් ශීර්ෂ අංකය: 232**

**අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: බන්ධනාගාර දෙපාර්තමේන්තුව**

**වැඩසටහන් අංකය හා නාමය :**

(i) **වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය**

| අගය (රු.) | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු.) |
|---|---|---|---|
| 25,000.00 | අඩු | 28 | 287,724 |
| 25,000.01 | වැඩි | 53 | 6,302,536 |
| එකතුව | | 81 | 6,590,260 |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|---|
| 1 | - | - | - |
| 2 | - | - | - |
| 3 | - | - | - |
| 4 | - | - | - |
| | එකතුව | - | - |

(ii) **තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය**

| අගය (රු.) | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|
| 25,000.00 | අඩු | 21 | 308,900 |
| 25,000.01 | වැඩි | 126 | 99,172,401 |
| එකතුව | | 147 | 99,481,301 |

**(ii) අනුව කාල විශ්ලේෂණය**

| | | |
|---|---|---|
| වසර 5 ට අඩු | සිද්ධි සංඛ්‍යාව | **56** |
| | ගණන | **49,743,400** |
| වසර 5-10 | සිද්ධි සංඛ්‍යාව | **65** |
| | ගණන | **14,593,813** |
| වසර 10 ට වැඩි | සිද්ධි සංඛ්‍යාව | **26** |
| | ගණන | **35,144,088** |

| | අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය (වසර 05 ට අඩු) | අගය (රු) |
|---|---|---|
| 1 | කළුතර බන්ධනාගාරයට අයත් අංක :NA-6911 දරණ බස් රථයේ 2024.03.28 වන දින ආයතනයේ රථ ගාලේදී සිදුවූ අනතුර | 445,000 |
| 2 | මාතර බන්ධනාගාරයට අයත් අංක :GD-6272 දරණ බස් රථයේ 2024.03.28 වන දින බන්ධනාගාර තාප්පයේ වැදී සිදුවූ අනතුර | 61,900 |
| 3 | කුරුවිට බන්ධනාගාරයට අයත් අංක :NB-6211 දරණ බස් රථයේ 2024.04.20 වන දින අඹතලේ හංදියේදී සිදුවූ අනතුර | 32,400 |
| 4 | යාපනය බන්ධනාගාරයට අයත් අංක :GD-6615 දරණ බස් රථයේ 2024.05.13 වන දින නාරන්තැන්න ප්‍රදේශයේදී සිදුවූ අනතුර | 766,000 |
| 5 | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයට අයත් අංක :NC-0612 දරණ බස් රථයේ 2024.05.01 වන දින බන්ධනාගාර ගරාජය අසලදී සිදුවූ අනතුර | 50,100 |
| 6 | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයට අයත් අංක :NC-2664 දරණ වෑන් රථයේ 2024.05.02 වන දින ජාතික රෝහලේදී සිදුවූ අනතුර | 71,700 |
| 7 | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයට අයත් අංක :NA-8445 දරණ බස් රථයේ 2024.05.08 වන දින බන්ධනාගාර රථ ගාලේදී සිදුවූ අනතුර | 78,500 |
| 8 | අනුරාධපුර බන්ධනාගාරයට අයත් අංක :NC-0584 දරණ බස් රථයේ 2024.04.18 වන දින රබෑව කොතලාවල හංදිය අසලදී සිදුවූ අනතුර | 18,000 |
| 9 | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයට අයත් අංක :NC-1844 දරණ බස් රථයේ 2024.05.14 වන දින ලිප්ටන් වටරවුම ආසන්නයේදී සිදුවූ අනතුර | 34,500 |
| 10 | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයට අයත් අංක :NA-0889 දරණ බස් රථයේ 2024.05.24 වන දින ගල්කිස්ස අධිකරණ භූමියේදී සිදුවූ අනතුර | 67,400 |
| 11 | වැලිකඩ බන්ධනාගාරයට අයත් අංක :JN-6474 දරණ වෑන් රථයේ 2024.06.05 වන දින ආයතනය ඉදිරිපිටදී සිදුවූ අනතුර | 24,500 |
| 12 | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයට අයත් අංක :NC-2661 දරණ වෑන් රථයේ 2024.06.07 වන දින බන්ධනාගාර රථගාලේ සිදුවූ අනතුර | 12,200 |
| 13 | මහර බන්ධනාගාරයට අයත් අංක :GD-6587 දරණ බස් රථයේ 2024.06.14 වන දින ගම්පහ රෝහල් වටරවුමේදී සිදුවූ අනතුර | 21,000 |
| 14 | බන්ධනාගාර මූලස්ථානයට අයත් අංක :NB-3013 දරණ වෑන් රථයේ 2024.07.01 වන දින දෙමටගොඩ දුම්රියපල අසලදී සිදුවූ අනතුර | 16,200 |
| 15 | බදුල්ල බන්ධනාගාරයට අයත් අංක :HQ-5093 දරණ වෑන් රථයේ 2024.06.15 වන දින පොලිස් ජීප් රථයක් වැදීමෙන් සිදුවූ අනතුර | 113,500 |
| 16 | බන්ධනාගාර මූලස්ථානයට අයත් අංක :CAC-2602 දරණ කාර් රථයේ 2024.07.19 වන දින රාජගිරිය ගුවන් පාලම අසලදී සිදුවූ අනතුර | 34,700 |
| 17 | මාතර බන්ධනාගාරයට අයත් අංක :GD-6272 දරණ බස් රථයේ 2024.07.22 වන දින වල්ගම ලංකා බැංකුව අසලදී සිදුවූ අනතුර | 125,400 |
| 18 | බෝගම්බර බන්ධනාගාරයට අයත් අංක :GK-1047 දරණ බස් රථයේ 2024.08.12 වන දින මහියංගන නක්කළ ප්‍රදේශයේදී සිදුවූ අනතුර | 285,999 |
| 19 | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයට අයත් අංක :NC-2661 දරණ වෑන් රථයේ 2024.09.11 වන දින ජාතික රෝහල් පරිශ්‍රයේදී සිදුවූ අනතුර | 290,500 |
| 20 | බන්ධනාගාර මූලස්ථානයට අයත් අංක :PD-8741 දරණ කැබ් රථයේ 2024.10.03 වන දින දෙමටගොඩ මංසන්ධියේදී සිදුවූ අනතුර | 26,600 |
| 21 | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයට අයත් අංක :NC-2664 දරණ වෑන් රථයේ 2024.10.20 වන දින කොස්ගම ප්‍රදේශයේදී සිදුවූ අනතුර | 258,300 |
| 22 | අඹේපුස්ස බන්ධනාගාරයට අයත් අංක :PD-4394 දරණ කැබ් රථයේ 2024.11.04 වන දින අඹේපුස්ස බන්ධනාගාරයට පැමිණෙන මාර්ගයේදී සිදුවූ අනතුර | 45,000 |
| 23 | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයට අයත් අංක :NC-2661 දරණ වෑන් රථයේ 2024.11.03 වන දින ආයතන පරිශ්‍රයේදී සිදුවූ අනතුර | 69,400 |
| 24 | බදුල්ල බන්ධනාගාරයට අයත් අංක :NC-0583 දරණ බස් රථයේ 2024.11.09 වන දින බන්ධනාගාර රථගාලේදී සිදුවූ අනතුර | 196,650 |
| 25 | මැගසින් බන්ධනාගාරයට අයත් අංක :NC-0605 දරණ බස් රථයේ 2024.11.11 වන දින අහුංගල්ල ප්‍රදේශයේදී සිදුවූ අනතුර | 477,750 |
| 26 | මහර බන්ධනාගාරයට අයත් අංක :NC-1853 දරණ බස් රථයේ 2024.11.19 වන දින මහගල්කඩවලදී සිදුවූ අනතුර | 21,500 |
| 27 | අනුරාධපුර බන්ධනාගාරයට අයත් අංක :NA-8444 දරණ බස් රථයේ 2024.12.06 වන දින වව්නියාව බන්ධනාගාර පරිශ්‍රයේදී සිදුවූ අනතුර | 56,500 |
| 28 | මාතර බන්ධනාගාරයට අයත් අංක :NC-0582 දරණ බස් රථයේ 2024.12.29 වන දින මොරවක පෝරුපිටිය ප්‍රදේශයේදී සිදුවූ අනතුර | 57,500 |
| 29 | මැගසින් බන්ධනාගාරයේ අංක PF-7596 දරණ කැබ් රථය 2023.08.16 වන දින අධිවේගී මාර්ගයේ වත්තල පිටවීමේ ස්ථානයේදී සිදුවූ අනතුරින් සිදුවූ අලාභය | 5,000,000 |
| 30 | බන්ධනාගාර මූලස්ථානයේ අංක KA-6939 දරණ කාර් රථය 2023.08.16 වන දින අධිවේගී මාර්ගයේ වත්තල පිටවීමේ ස්ථානයේදී සිදුවූ අනතුරින් සිදුවූ අලාභය | 2,000,000 |
| 31 | ත්‍රිකුණාමල බන්ධනාගාරයේ අංක PF-7601 දරණ කැබ් රථය 2023.07.23 වන දින බන්ධනාගාරය ඉදිරිපිටදී සිදුවූ අනතුරින් සිදුවූ අලාභය | 78,929 |
| 32 | ගාල්ල බන්ධනාගාරයේ අංක NB-6212 බස් රථය 2023.05.04 වන දින සිදුවූ අනතුරින් සිදුවූ අලාභය | 1,116,080 |
| 33 | අනුරාධපුර බන්ධනාගාරයේ අංක 68-5533 දරණ කාර් රථය 2023.03.23 වන දින බන්ධනාගාරය ඉදිරිපිටදී සිදුවූ අනතුරින් සිදුවූ අලාභය | 225,500 |
| 34 | කළුතර බන්ධනාගාරයේ අංක PF-7611 දරණ කැබ් රථය 2023.01.23 වන දින කළුතර බස් නැවතුම අසලදී සිදුවූ අනතුරින් සිදුවූ අලාභය | 545,000 |
| 35 | බෝගම්බර බන්ධනාගාරයේ අංක 63-2914 දරණ බස් රථය 2022.01.13 මාතලේ උකුවෙල ප්‍රෙද්ශයේදී සිදුවූ අනතුරින් සිදුවූ අලාභය | 121,200 |
| 36 | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ අංක NB-6203 බස් රථය 2022.05.09 කොස්වත්ත ප්‍රෙද්ශයේදී කලහකාරී පිරිසක් විසින් පහර දීමෙන් සිදුවූ අලාභය | 916,000 |
| 37 | ගාල්ල බන්ධනාගාරයේ අංක JK-7789 දරණ බස් රථය 2022.09.01 ඩෙසියාවත්ත වැඩ කඳවුර අසලදී සිදුවූ අලාභය | 101,900 |
| 38 | යාපනය බන්ධනාගාරයේ අංක 61-6124 දරණ බස් රථය 2022.10.17 නැකැත්තේගම ප්‍රෙද්ශයේදී සිදුවූ අනතුරින් සිදුවූ අලාභය | 116,000 |
| 39 | බෝගම්බර බන්ධනාගාරයේ අංක 60-5987 දරණ බස් රථය 2022.11.04 බකමූණ ලග්ගල ප්‍රෙද්ශයේදී සිදුවූ අනතුරින් සිදුවූ අලාභය | 82,500 |
| 40 | කුරුවිට බන්ධනාගාරයේ අංක PF -7595 කැබ් රථය 2021.02.26 බලංගොඩ සිර මැදිරිය අසලදී අනතුරට පත්වීම | 25,087 |
| 41 | කුරුවිට බන්ධනාගාරයේ අංක NB- 6211 බස් රථය 2021.12.09 ඇඹිලිපිටිය පැල්මඩුල්ල මාර්ගයේ 100 කණුව අසලදී අනතුරට පත්වීම | 97,500 |

| | | |
|---|---|---|
| 42 | යාපනය බන්ධනාගාරයේ අංක GC-5245 බස් රථය 2021.07.28 ඕමන්ත පොලිස් මුර පොල අසලදී අනතුරින් සිදුවූ අලාභය | 36,715 |
| 43 | වීරවිල බන්ධනාගාරයේ අංක PA-3158 කැබ් රථය අනතුරට පත්වීම | 14,000 |
| 44 | ගාල්ල බන්ධනාගාරයේ අංක NC-0593 බස් රථය 2021.08.29 අහුංගල්ල ප්‍රෙද්ශයේදී අනතුරට පත්වීම | 204,535 |
| 45 | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ අංක NC-0603 බස් රථය 2021.05.25 කුරුණෑගල දඹුල්ල මාර්ගයේදී අනතුරට පත්වීම | 759,088 |
| 46 | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ අංක NC-5426 වැන් රථය 2021.11.22 සීගිරිය දිගම්පතන ප්‍රෙද්ශයේදී අනතුරට පත්වීම | 8,680,176 |
| 47 | කොළඹ රිමාණ්ඩ් බන්ධනාගාරයේ NC-2664 වැන් රථය 2020.02.10 බත්තරමුල්ල මහේස්ත්‍රත් අධිකරණය අසල | 44,100 |
| 48 | කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරයේ NC-0612 බස් රථය 2020.02.18 පාර්ලිමේන්තු පාරේදී අනතුරට ලක්වීම | 85,200 |
(ඌ) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ඇති ගිනිඅවිවල පිරිවැය, දුරකථන සංඥා බාධක (Jammer) පද්ධතියේ පිරිවැය සහ පිරිවැය රු.40,162,968ක් වූ බන්ධනාගාර ආයතන 23කට ලබාදී ඇති LGN පද්ධතිය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපළ, පිරියත හා උපකරණ යටතේ හඳුනාගෙන නොතිබීමෙන් එම වටිනාකමින් ඌණ ගණනය වී තිබුණි.

(එ) බන්ධනාගාර ආයතන 13ක අක්කර 166.7730ක් වූ ඉඩම්වල හිමිකම බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතුව පැවතිය ද වටිනාකම තක්සේරු නොකිරීම නිසා ගිණුම්ගතකර නොතිබීමෙන් එම ඉඩම් ප්‍රමාණයේ වටිනාකමට සමාන ප්‍රමාණයකින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ශුද්ධ වත්කම් ඌණ ගණනය වී තිබුණි.

**1.6.2 තැන්පතු ගිණුම් ශේෂ**

මූල්‍ය ප්‍රකාශනයෙහි ඒසීජ් - 4 ආකෘතිය අනුව 2024 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුම් 08ක දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය හා භාණ්ඩාගාර පොත් අනුව ශේෂය රු.16,078,508ක වෙනසක් විය.

5

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.6.3. **විගණනය සඳහා සාක්ෂි නොවීම**

සමාලෝචිත වර්ෂයේ කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති රු.170,560,476ක ලැබිය යුතු ශේෂයෙන් රු.78,161,394ක ශේෂ තහවුරුකර ගැනීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් නොවී ය.

2. **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මකකර නොතිබුණි.

| **ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව** | **ක්‍රියාත්මකකර නොතිබුණු නිර්දේශය** | **මෙම වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|
| 1.6.2.(අ) | පෙර වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල අවසන් ශේෂය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂ අතර වෙනසක් පැවතීම. | 1.6.1(ආ) |

3. **මූල්‍ය සමාලෝචනය**

3.1. **වියදම් කළමනාකරණය**

(අ) මූලධන වැය විෂයයන් 05ක් සඳහා සලසාගෙන තිබූ රු.865,000,000ක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් සියයට 47කට වැඩියෙන් එනම් රු.404,185,237ක ප්‍රතිපාදන ඉතිරිවී තිබූ අතර එම එක් එක් වැය විෂයයන්හි ඉතිරිවීම සියයට 12 සිට සියයට 70ක් දක්වා පරාසයක් තුළ පැවතුණි.

(ආ) මූලධන වැය විෂයයන් 02ක් සඳහා වෙන්කර තිබූ රු.150,000,000ක ප්‍රතිපාදනවලින් මුදල් රෙගුලාසි 66 යටතේ රු.38,000,000ක් වෙනත් වැය විෂයයන් සඳහා මාරුකිරීමෙන්

6

පසු රු.66,301,574ක් ඉතිරිව තිබූ අතර, එම වැය විෂයයන්හි ශුද්ධ ප්‍රතිපාදනය මත තවදුරටත් ඉතිරිවීම් සියයට 39 සිට 74ක් දක්වා පරාසයක් තුළ පැවතුණි.

(ඇ) වැය විෂයයන් 02ක් යටතේ සලසා තිබූ රු.6,250,000,000ක මුළු ප්‍රතිපාදනවලට අමතරව පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මගින් තවදුරටත් රු.1,548,000,000ක් ලබාදී තිබූ අතර, මෙම වැය විෂයයන් සඳහා සලසා තිබූ ප්‍රතිපාදනවලින් රු.35,200,000ක් මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකිරීමට කටයුතුකර තිබීම හේතුවෙන් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන අරමුණුගත කාර්යය සඳහා වැයකර නොතිබුණි.

3.2. **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී නොතිබුණි.

3.3. **නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීතිරීති හා රෙගුලාසියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| i. XIX පරිච්ඡේදයේ 5.2.3 ඡේදය | මෙම ඡේදය ප්‍රකාරව සාද නිවාස සඳහා කුලියක් සෑම පදිංචි නිලධාරියෙක්ගෙන්ම |

7

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | |
|---|---|---|
| | | අයකරගත යුතු වුව ද, පොළොන්නරුව බන්ධනාගාරයේ එම නිලධාරීන්ගෙන් අතීතයේ සිටම රු.30ක මුදලක් පමණක් වැටුපෙන් අයකරගෙන තිබුණි. |
| ii. | XIX පරිච්ඡේදයේ 5.8 ඡේදය | සාද නිවාස සඳහා කුලියක් සෑම පදිංචි නිලධාරියෙක්ගෙන්ම අයකරගත යුතු වුව ද, පොළොන්නරුව බන්ධනාගාරයේ එම නිලධාරීන්ගෙන් ජලය හා විදුලිය සඳහා යන වියදම් නිලධාරීන් විසින් ගෙවිය යුතු වුව ද, 2024 වර්ෂය සඳහා මෙම සාද නිවාස සඳහා රජයෙන් ගෙවා තිබූ විදුලි බිල රු.258,558ක් වන අතර, ජල බිල රු.415,310ක් විය. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ

| | | |
|---|---|---|
| i. | මුදල් රෙගුලාසි 104(03) ඡේදය | පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07කට වඩා ප්‍රමාදයක් සිදුවේ යැයි අපේක්ෂා කරන්නේ නම් නැතිවීම් හා පාඩුවීම් සම්බන්ධව ප්‍රාරම්භක වාර්තාවක් වහාම එවිය යුතු ය. නමුත් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2001 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ සිදු වී ඇති අලාභ හානි 89ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 104(03) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත්කර නොතිබුණි. |
| ii. | මුදල් රෙගුලාසි 104(04) ඡේදය | අලාභ හානි සිදු වූ දිනයේ සිට මාස 03ක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත්කර නොමැති අලාභ හානි 89කට අමතරව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2000 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ |

8

කාලපරිච්ඡේදය තුළ සිදුවී ඇති අලාභ හානි 39ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් ඉදිරිපත්කර නොතිබුණු අතර, ඒ අනුව අලාභයන් 128කට අදාළව පූර්ණ වාර්තා ඉදිරිපත්කර නොතිබුණි.

| | | |
|---|---|---|
| iii. | මුදල් රෙගුලාසි 371(5) ඡේදය | අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන්කර දින 10ක් තුළ අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුව ද, එපරිදි පියවා නොතිබීම නිසා බන්ධනාගාර මූලස්ථානයේ අවස්ථා 26කදී ලබාගත් රු.977,630ක අත්තිකාරම් මුදල්වලට අදාළව රු.77,938ක මුදලක් දින 11ත් 52ත් අතර කාලයක් තුළ අදාළ නිලධාරියා සතුව පැවතුණි. |
| iv. | මුදල් රෙගුලාසි 571 ඡේදය | තැන්පත් ගිණුම් 04කට අදාළ වර්ෂ 02 ඉක්මවූ රු.10,422,854ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. |
| v. | මුදල් රෙගුලාසි 756(6) ඡේදය | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කමිටුවලට අදාළව සියලුම ආයතනවල පොදු 47 වාර්තාවෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කිරීම පිළිබඳ වාර්තා 2025 මැයි 20 දින වන විටත් ඉදිරිපත්කර නොතිබුණි. |
| vi. | මුදල් රෙගුලාසි 1647(ඉ) ඡේදය | වාහන භාර නිලධාරීන් විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන පිළිබඳව ඒ ඒ වාහනයේ වර්ගය හා මෝස්තරය ද, ලියාපදිංචි කිරීමේ අංකය ද, තමන්ට භාරදුන් දිනය ද, පැවරු |

9

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | |
|---|---|---|
| | | දිනය හා ඒ පිළිබඳ විස්තර ද වෙනත් නිසි තොරතුරු ද දැක්වෙන ලැයිස්තුවක් තබාගත යුතු වුවත්, බන්ධනාගාර ආයතන 05ක් 2024 දෙසැම්බර් 31 දින වන විට එපරිදි කටයුතුකර නොතිබුණි. |
| (ඇ) | අංක 262/2017 හා 2017 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 4 ඡේදය හා 6 වන ඡේදය | 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම / මරණ පාරිතෝෂිතය ලබාදී ඇති නිලධාරින්ගෙන් අයවිය යුතුව තිබුණු ණය ශේෂයන් තම ආයතනවල අත්තිකාරම් "බී" ගිණුමේ ඇතුළත් නොවීමට ආයතන ප්‍රධානීන් වගබලාගත යුතු වුවත්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ශේෂය වන රු.2,285,609ක ප්‍රමාණයෙන් සියයට 61ක් එනම් රු.1,389,791ක ප්‍රමාණයක් වසරකට වඩා වැඩි ශේෂයන් වී තිබුණි. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති හා අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකට පසු මාස 12ක කාල සීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, 2024 දෙසැම්බර් 31 දින වන විට බන්ධනාගාර ආයතන 12ක වාහන 122ක් එපරිදි කටයුතුකර නොතිබුණි. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (ආ) ඡේදය | දැන්වීම් පළකිරීම ආර්ථික වශයෙන් අවාසි සහගත වන අඩු වටිනාකමකින් යුත් අයිතමයන් ප්‍රසම්පාදනය කිරීම සඳහා හෝ නිතර භාවිතා කරනු ලබන අයිතමයන් |

10

| | | |
|---|---|---|
| | | මිලදීගැනීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම කළ යුතු අතරම, මෙම ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් මෝටර් වාහන අලුත්වැඩියා කිරීම වැනි විශේෂ වර්ගවල භාණ්ඩ සහ සේවා සැපයීමට හැකි සැපයුම්කරුවන්ගේ නම් ඇතුළත් ලැයිස්තුවක් පිළියෙල කරනු ලැබිය යුතු නමුත්, 2024 දෙසැම්බර් 31 දින වන විට බන්ධනාගාර ආයතන 20ක ගරාජ් සහ සේවා සැපයුම්කරුවන් ලියාපදිංචිකර නොතිබුණි. |
| (ඊ) | බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 1992 ජූනි මස 08 දිනැති අංක 20/92 සහ 2022 නොවැම්බර් 08 දිනැති අංක කේ.01/විදේශ කටයුතු/2022 අභ්‍යන්තර චක්‍රලේඛය | විදේශ ජාතිකයෙකු බන්ධනාගාරගත කිරීමෙන් පසුව ඊට අදාළ වාර්තාවක් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් සහ එහි පිටපත් එම පුද්ගලයා (සිරකරු) අයත් වන රටේ තානාපති කාර්යාලයට සහ ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කළ යුතු වුවත්, සිරකරුවන් 26ක් සම්බන්ධයෙන් අදාළ වාර්තාවන් සමග දැනුවත් කිරීම් සිදුකළ බවට ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. |
| (උ) | බන්ධනාගාර දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග 511 හා 222 ඡේද | මෙම ව්‍යවස්ථාපිත බන්ධනාගාර නීතියෙහි ද සඳහන් පරිදි බන්ධනාගාරගත රැඳවියන් සඳහා දෛනිකව ආහාර ලබාදීමේදී එක් රැඳවියෙකු සඳහා නිකුත් කරන අමු හා වියළි සලාක ප්‍රමාණය, එක් සම්මත ප්‍රමාණයක් විය යුතු වුවත්, එක් එක් බන්ධනාගාර ආයතනවල එම ප්‍රමාණයන් විවිධ අගයන් ගෙන තිබුණි. |

11

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3.4. තැන්පතු

(අ) අංක 6000-0-0-006-0-081 දරන තැන්පත් ගිණුමේ 2024 දෙසැම්බර් 31 දිනට රු.3,722,705ක ශේෂයක් පැවතුණු අතර, මෙම තැන්පතු සිරකරුවන්ගේ පුද්ගලික බැංකු ගිණුමට බැරකිරීමට අදාළ මුදල් වන අතර, මෙම ශේෂයෙන් සියයට 45ක් එනම් රු.1,675,808ක ප්‍රමාණයක තැන්පතු වසර 02කට අධික කාලයක් පොදු තැන්පත් ගිණුමේ පැවතුණි.

(ආ) අංක 6000-0-0-1-16 දරන තැන්පත් ගිණුමේ 2024 දෙසැම්බර් 31 දිනට රු.6,860,070ක ශේෂයක් පැවතුණු අතර, මෙම තැන්පතු ඇප තැන්පත් තැබිය යුතු නිලධාරින්ගේ වැටුපෙන් අයකරනු ලබන ඇපමුදල් එම නිලධාරින්ගේ බැංකු ගිණුම් විවෘත කරන තෙක් රඳවාගන්නා මුදල් වන අතර, මුදල් රෙගුලාසි 885 ප්‍රකාරව විධිමත් පරිදි කටයුතු නොකර ඇති බැවින් මෙම ශේෂයෙන් සියයට 21ක් එනම් රු.1,418,010ක ප්‍රමාණයක් තැන්පතු වසර 02කට අධික කාලයක් තුළ පොදු තැන්පතු ගිණුමේ පැවතුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 දැක්ම හා මෙහෙවර

කාලීන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි රැඳවියන් පුනරුත්ථාපනයකර යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමට අවශ්‍ය සමාජ පසුබිම සැකසීම බන්ධනාගාරයේ ප්‍රධාන කාර්යයක් වන අතර, එහිදී අධ්‍යාපනය, කාර්යයක නිරත වීම වැනි අර්ථවත් ක්‍රියාකාරකම් සහ වෙනත් වැඩසටහන් වෙත රැඳවියන් යොමුකිරීම හා සාධනීය බන්ධනාගාර පරිසරයක් නිර්මාණයකර රැඳවියන්ගේ ශක්තිය නිර්මාණාත්මක වෘත්තීන් වෙත යොමුකිරීමෙන් පසුව සමාජගත කිරීම සඳහා සූදානම් කිරීමට සහයවීමක් ඇතිවන පරිදි පුනරුත්ථාපන කටයුතු පවත්වාගෙන යා යුතු වුව ද, බන්ධනාගාර තදබදය හමුවේ රැඳවියන් විධිමත් පරිදි පුනරුත්ථාපනය නොවුණි.

4.1.2 සැලැසුම් කිරීම

බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරී සැලැස්ම සකස්කිරීමේදී වර්ෂය තුළ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්ට අදාළව සත්‍ය ක්‍රියාකාරකම් හඳුනාගෙන පිරිවැය ඇස්තමේන්තු සකස්කර ඒ අනුව සැලසුම් සකස්නොකර ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන තක්සේරුකර ක්‍රියාකාරී සැලැස්ම සකස්කර තිබුණි. පසුව වර්ෂය තුළ සිදුකළ ක්‍රියාකාරකම්වලට සරිලන ආකාරයට වර්ෂය මැද සහ අවසානයේ ක්‍රියාකාරී සැලැස්ම

12

සංශෝධනයකර තිබුණි. විධිමත් අනුමැතිය ලද ක්‍රියාකාරී සැලැස්ම නිරන්තරයෙන් සංශෝධනයකර සකස්කිරීම නිසා, අස්ථිත්වය විසින් සිදු කරනු ලබන සියලුම කාර්යයන් (භාණ්ඩ, සේවා හා ව්‍යාපෘති) පූර්ණය කිරීමට යොදාගන්නා කළමනාකරණ මෙවලමක් වශයෙන් උපයෝගීකර ගැනීමට නොහැකිව තිබුණු අතර, සකසුරුවමින්, කාර්යක්ෂමව හා ඵලදායී පරිදි කාලානුරූපී ආකාරයට සැලසුම් සම්පාදනය කිරීමේ අපේක්ෂිත අරමුණු කරා ළඟාවීමට ද නොහැකි වී තිබුණි.

4.1.3 **කාර්යභාරයන් ඉටුනොකිරීම**

(අ) 2024 නොවැම්බර් 30 දිනට සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව එක් එක් ප්‍රාග්ධන වැය විෂයයන් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය හා 2024 වර්ෂය තුළ සිදුකරන ලද ප්‍රාග්ධන වියදම පරීක්ෂාවේදී වෙන්කිරීම් ඌණ උපයෝජිතව තිබූ අවස්ථා 05ක් පැවතුණි.

(ආ) 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ප්‍රාග්ධන වැය විෂයයන්හි සැලසුම් කරන ලද ක්‍රියාකාරකම්/ ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය පරීක්ෂාවේදී කාර්යසාධනය සියයට 0ක් වූ අවස්ථා 13ක් ද, සියයට 50කටත් වඩා අඩුව පැවති අවස්ථා 03ක් ද පැවතුණි.

4.1.4 **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම**

(අ) වැය විෂයය 2102 යටතේ මාංචු මිලදීගැනීම සඳහා රු.5,850,000ක් වෙන්කර තිබූ අතර, 2024 නොවැම්බර් මස සංශෝධනයට අනුව රු.5,805,600ක් වෙන්කර තිබුණි. එහෙත් එම මුදල් එම කාර්යය සඳහා උපයෝජනය නොකර වෙනත් කාර්යාල උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් යොදවා තිබුණි.

(ආ) වැය විෂයය 2102 යටතේ මාධ්‍ය අංශයේ උපකරණ මිලදීගැනීම වෙනුවෙන් මූලික තක්සේරුව ලෙස රු.3,750,000ක් වෙන්කර තිබූ අතර, එය නොවැම්බර් 30 සංශෝධනයෙන් රු.5,305,870ක් ලෙස වැඩිකර ගෙන තිබුණි. එහෙත් එම මුදල් අදාළ උපකරණ වෙනුවෙන් උපයෝජනය කරගෙන නොතිබුණි.

4.1.5 **අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබානොගැනීම**

(අ) පාර්සල් සහ බොඩි ස්කෑනර් යන්ත්‍ර මිලදීගැනීම

i. බන්ධනාගාර ආයතන 09ක් සඳහා පාර්සල් ස්කෑනර් මැෂින් 06ක් සහ බොඩි ස්කෑනර් මැෂින් 04ක් මිලදීගෙන තිබුණි. එම යන්ත්‍ර මිලදීගැනීම සඳහා අදාළ කාලය තුළ රු.123,762,000ක මුදලක් වැයකර තිබුණි. මිලදීගත් දින සිට 2022 වර්ෂය දක්වා අලුත්වැඩියා කටයුතු සඳහා රු.4,534,825ක මුදලක් ද නඩත්තු කටයුතු සඳහා රු.11,811,664ක් වශයෙන් එකතුව රු.140,108,489ක වියදමක් දරා

13

තිබුණ ද, 2024 දෙසැම්බර් 31 දිනය වන විටත් ආයතන 08ක පාර්සල් ස්කෑනර් යන්ත්‍ර 04ක් සහ බොඩි ස්කෑනර් යන්ත්‍ර 04ක් වසර 04ත් මාස 04ත් අතර කාලයක සිට අක්‍රියව පැවතුණි.

ii. කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය සතු බොඩි ස්කෑනර් යන්ත්‍රයේ අලුත්වැඩියාව සඳහා එහි දේශීය නියෝජිත ආයතනය විසින් 2020 සැප්තැම්බර් 04 වන දින රු.4,832,460ක ඇස්තමේන්තුවක් ලබාදී තිබූ අතර, 2022 ජූනි 09, 2023 මාර්තු 13 හා 2023 ජූලි 11 යන දිනයන්වලදී සේවා/ කාර්මික ශිල්පීන් පැමිණ බොඩි ස්කෑනර් යන්ත්‍රයේ කොටස් අලුත්වැඩියාව සඳහා ආයතනය වෙත රැගෙන ගොස් ඇති අතර, එම රැගෙන ගිය කොටස් නැවත කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය වෙත භාරදී නොතිබුණු බවත්, විගණිත දිනය වන විටත් මෙම යන්ත්‍රයේ රාමුව හා පිටත ආවරණය පමණක් කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය තුළ පැවතුණි.

iii. පාර්සල් සහ බොඩි ස්කෑනර් යන්ත්‍ර සේවා කිරීම සම්බන්ධව සේවා ගිවිසුම යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. ශ්‍රී ලංකා පරමාණු බලශක්ති නියාමන සභාවේ කාර්මික X - කිරණ යන්ත්‍ර භාවිතය / ළඟ තබාගැනීම වෙනුවෙන් අන්තර්කාල බලපත්‍ර ලබාගැනීම සඳහා මෙම යන්ත්‍ර ක්‍රමාංකනය (Calibration) කර තිබීම අවශ්‍යතාවක් වන බව නිරීක්ෂණය වූ අතර, මෙම යන්ත්‍ර සියල්ලම ක්‍රමාංකනය (Calibration) කිරීම, පෙර පැවති සේවා ගිවිසුමට අනුව පුද්ගලික සමාගම විසින් සිදුකරනු ලබන බැවින් මෙලෙස සේවා ගිවිසුමට එළඹ නොවීමෙන් මෙම අවශ්‍යතාවය සපුරාගැනීමට නොහැකි වී තිබුණි. මුදල් රෙගුලාසි 802(2) ප්‍රකාරව යන්ත්‍ර පිළිබඳ වගකීම් දරන නිලධාරීන් විසින් යන්ත්‍රවල භාරය, පාවිච්චිය හා නඩත්තුව යන කාර්යයන් විවිධ වූ පරිදි පරිපාලනය කළ යුතුවාක් මෙන් එම කාර්යයන්හිදී විධිමත් සැළකිල්ලක් ද දැක්විය යුතුව පැවතුණි.

iv. මෙම යන්ත්‍ර සැපයුම් ආයතනය විසින් පාර්සල් පරීක්ෂා කිරීමේ උපකරණ පරීක්ෂාව හා බොඩි ස්කෑනර් උපකරණ පරීක්ෂාව සඳහා 2014 වර්ෂයේදී නිලධාරීන් 12 දෙනෙකු ඇමෙරිකා එක්සත් ජනපදය සහ නෙදර්ලන්තයේ විදේශ පුහුණුවක් ලබාදීමට කටයුතුකර තිබුණ ද, එම නිලධාරීන් වෙනත් අංශවල සේවයේ යෙදීසිටීම නිසා මෙම යන්ත්‍රවල ක්‍රියාකාරීත්වය සඳහා සුවිශේෂී දායකත්වයක් ලබාදී නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජන ආයතනය (ICTA) විසින් රු.40,162,968ක් වටිනා ලංකා රාජ්‍ය අන්තර්ජාල පහසුකම් (LGN) 2023 වර්ෂයේදී බන්ධනාගාර ආයතන 23ක් වෙත පරිත්‍යාග වශයෙන් ලබාදී තිබූ අතර, බන්ධනාගාර

ආයතනවල එම සම්බන්ධතාවයට අදාළ මාසික අන්තර්ජාල සේවා වියදම් ද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය විසින් දරනු ලබයි. බන්ධනාගාර ආයතනවල පවතින ලංකා රාජ්‍ය අන්තර්ජාල (LGN) සම්බන්ධතාවයේ දෝෂ නැවත අලුත්වැඩියාකර භාවිතා කිරීමේ සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය වූ අතර, එමනිසා වඩා කාර්යක්ෂම සේවාවක් ලබාගැනීමේ අවම හැකියාවක් පැවතුණි. සීමා රහිත අඛණ්ඩ සැපයුමක් (Unlimited) ලබාදී තිබියදී ලංකා රාජ්‍ය අන්තර්ජාල (LGN) සම්බන්ධතාවයට අමතරව වෙනත් සැපයුම්කාර ආයතන වෙතින් අන්තර්ජාල පහසුකම් ලබාගෙන තිබුණි.

4.2 **ප්‍රසම්පාදනයන්**

(අ) වැලිකඩ බන්ධනාගාරයේ 63/1 සිට 63/8 දක්වා නිවාස අලුත්වැඩියා කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව 2023 නොවැම්බර් 14 දින පුද්ගලික ආයතනයක් වෙත රු.33,130,441ක මුළු වටිනාකමකට ප්‍රදානය කිරීමට ප්‍රසම්පාදන අනුමැතිය ලැබී තිබූ අතර, මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන්කර 2024 ජූලි 09 දින බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත නැවත භාරදී තිබූ අතර, එහි රජයේ නිවාස 08ක් නිලධාරීන් වෙත ලබාදී තිබූ බවත්, අලුත්වැඩියා කටයුතු විධිමත්ව සිදු නොවීම නිසා නැවත අලුත්වැඩියා කළ යුතු කාර්යයන් මෙම වාර්තාව දින දක්වා සිදුකර නොතිබුණි.

(ආ) කෑගල්ල බන්ධනාගාරයේ මායිම් තාප්පය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.16,568,824ක (වැට් රහිත) වටිනාකමකට අදාළ කොන්ත්‍රාත්කරු වෙත 2024 මැයි 25 දින ප්‍රදානයකර තිබූ අතර, ඉදිකිරීම් පරීක්ෂාවේදී 2024 නොවැම්බර් 18 දිනට තිබිය යුතු භෞතික ප්‍රගතිය සියයට 90.3ක් වුව ද, එදිනට සත්‍ය භෞතික ප්‍රගතිය සියයට 2ක් වී තිබුණි. ඉදිකිරීම් කොන්ත්‍රාත් සමාගමේ දුර්වලතා හේතුවෙන් ව්‍යාපෘතිය ඉදිකිරීම ප්‍රමාදවී පැවතුණු අතර, මෙම මායිම් තාප්පයේ අලුත්වැඩියාව කරන ස්ථානයට ආසන්නව මීටර් 10ක් ඇතුළත තවත් ස්ථාන දෙකකින් පුපුරායාම් 02ක් පමණ නිරීක්ෂණය වන අතර, එය අනාගතයේදී යළි අනතුරක් ඇතිවිය හැකි තත්ත්වයක් විය.

(ඇ) 2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත්කර නොමැති ප්‍රාග්ධන වැය විෂයයන් 03කට අදාළ ක්‍රියාකාරකම් 09ක් සඳහා රු.61,419,696ක වියදමින් සිදුකර තිබූ අතරම, 2024 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් එහෙත් සමාලෝචිත වර්ෂය තුළ සිදු කිරීමට අපොහොසත් වී ඇති ප්‍රාග්ධන වැය විෂයයන් 03කට අදාළ ක්‍රියාකාරකම් 07ක් වූ අතර, ඒ සඳහා රු.27,800,000 ක මුදලක් ඇස්තමේන්තුකර තිබුණි.

15

4.3. **වත්කම් කළමනාකරණය**

(අ) බන්ධනාගාර ආයතනවල කර්මාන්ත අංශයන්හි ඌණ උපයෝජිතව පවතින යන්ත්‍ර සහ උපකරණවල තොරතුරු පරීක්ෂාවේදී බන්ධනාගාර ආයතන 06ක යන්ත්‍ර/උපකරණ 21ක් ඌණ උපයෝජිතව පවතින බව හෙළිදරව් වූ අතර, එම යන්ත්‍ර/උපකරණ අලුත්වැඩියා කිරීමට හෝ ප්‍රශස්ථව භාවිතා කිරීමට හැකි බන්ධනාගාර ආයතනවලට ලබාදීමට හෝ කටයුතුකර නිෂ්පාදන ක්‍රියාවලියට දායකකර ගැනීමට පියවරගෙන නොතිබුණි.

(ආ) බන්ධනාගාර කර්මාන්ත අංශයන්වල අක්‍රියව පවතින යන්ත්‍ර සහ උපකරණ පිළිබඳව තොරතුරු පරීක්ෂාවේදී බන්ධනාගාර ආයතන 08ක යන්ත්‍ර සහ උපකරණ 50ක් අක්‍රියව පවතින බවත්, එහි යන්ත්‍ර සහ උපකරණ 04ක් අලුත්වැඩියාව කළ හැකි වුව ද, ඒ සඳහා විධිමත් පියවරගෙන නොතිබුණු බවත්, අපහරණය කළ යුතු යන්ත්‍ර අපහරණය කිරීමට අවශ්‍ය විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත් හෙළිදරව් විය.

(ඇ) පොළොන්නරුව, අගුණකොළපැලැස්ස, මහර, පල්ලෙකැලේ එළිමහන් සිරකඳවුර, බෝගම්බර, වටරැක, බූස්ස, වීරවිල, දළුපත, කළුතර, යාපනය, මඩකලපුව, පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය හා වැලිකඩ යන බන්ධනාගාර ආයතන 14 විසින් 2024 දෙසැම්බර් 31 දිනට භාවිතා කරනු ලබන වාහන 39ක වටිනාකම තක්සේරුකර නොතිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 802 ප්‍රකාරව වාහන පහසුකම් සපයනු ලබන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඒවා පමණට වැඩි නොවන බව හා නිෂ්කාර්යව නොතිබෙන බවටත් වගබලා ගැනීමට පියවරගත යුතු වුව ද, බන්ධනාගාර ආයතන 15ක වාහන 29ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් භාවිතයෙන් ඉවත්කර තිබුණි.

(ඉ) බන්ධනාගාර ආයතන 21ක් සතුව පවතින භාවිතයටගත නොහැකිව අපහරණය සඳහා නිර්දේශ වී අවුරුදු 05ක කාලයක් ගතවී ඇතත්, 2024 දෙසැම්බර් 31 දින වන විටත් අපහරණ කටයුතු සිදුකර නොතිබෙන වාහන 33ක් පැවතුණි.

(ඊ) බන්ධනාගාර ආයතන 31කට අදාළව එහි නිලධාරීන්ට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධව යටිතල පහසුකම් අවශ්‍යතා 286ක ප්‍රමාණයක් 2024 දෙසැම්බර් 31 දින වන විට හඳුනාගෙන ඇති නමුත්, ඒවා ක්‍රියාත්මක කිරීමට හා සංවර්ධනය කිරීමට විධිමත් පරිදි කටයුතුකර නොතිබුණි.

(උ) පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව හා ජාතික නීති පද්ධති, රෙගුලාසි හෝ වෙනත් මාර්ගෝපදේශ පදනම් කරගත් ප්‍රමිතීන්ට අනුකූලව මානසික හා ශාරීරික යෝග්‍යතාවයට ගැළපෙන ආකාරයට ඉඩපහසුකම් සහිතව යම් බන්ධනාගාරයක රැඳවියෙකු රැඳවිය යුතු

16

වුව ද, බන්ධනාගාර ආයතන 31ක නේවාසිකයන්ට අදාළව අවශ්‍ය යටිතල පහසුකම් අවශ්‍යතා 228ක ප්‍රමාණයක් හඳුනාගෙන ඇති නමුත්, ඒවා ක්‍රියාත්මක කිරීමට හා සංවර්ධනය කිරීමට විධිමත් පරිදි කටයුතුකර නොතිබුණු බවත්, ඒවා අතරින් වැඩිම නේවාසික යටිතල පහසුකම් ප්‍රමාණයක් අවශ්‍යවනුයේ වැලිකඩ බන්ධනාගාරය වෙත බවත් තහවුරු විය.

(ඍ) 2013 වර්ෂයේදී පුනරුත්ථාපන හා බන්ධනාගාර අමාත්‍යාංශය විසින් විධිමත් පවරාදීමකින් තොරව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ දළුපොත තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය වෙත ලබාදී තිබූ අංක PA – 7034 දරන කැබ් රථයට අදාළව කිසිදු ලියකියවිල්ලක් ලබානොදීම නිසා 2013 වර්ෂයේ සිදුකර ගැනීමට හැකිව තිබූ අලුත්වැඩියාවක් සිදුකර ගැනීමට නොහැකිවීම හේතුවෙන් මෙම කැබ් රථය 2013 වර්ෂයේ සිට මේ දක්වා ධාවනය නොකර තිබූ අතර, 2024 වර්ෂයේදී අපහරණය සඳහා නිර්දේශකර තිබුණි.

(එ) අධිකරණය මගින් රාජසන්තකකර බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති වාහන 36ක් බන්ධනාගාර ආයතන 18ක් තුළ 2024 දෙසැම්බර් 31 දින වන විට රඳවා තබාගෙන ඇති බවත්, ඉන් වාහන 08ක් පමණක්, වර්තමානයේදී ධාවනය වන අතර, ඉතිරි වාහන 28ක ප්‍රමාණය ධාවනයෙන් ඉවත්කර ඇති බවත් හෙළිදරව් විය.

(ඒ) බන්ධනාගාර ආයතනවල ඉඩම් කැබලි 49ක අක්කර 357.8139ක් වූ ඉඩම් ප්‍රමාණයක හිමිකම පවරාගැනීම සිදුකර නොතිබුණ ද, මෙම ඉඩම් බන්ධනාගාර, සිරමැදිරි, එළිමහන් සිරකඳවුරු, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා ගොවිපොළවල් වශයෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණි.

(ඔ) බන්ධනාගාර තදබදය අවම කිරීම සඳහා බොරැල්ලේ පිහිටි වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය (බන්ධනාගාර මූලස්ථානය, වැලිකඩ බන්ධනාගාරය, කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය, බන්ධනාගාර රෝහල, කාන්තා අංශය හා මැගසින් බන්ධනාගාරය) හොරණ මිල්ලෑව ප්‍රදේශයේ ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක් සැලසුම්කර තිබූ අතර, හෙක්ටයාර් 16.436ක් පමණ වන මෙම ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට 2022 නොවැම්බර් 16 දින නිදහස් දීමනා ක්‍රමයක් මගින් පවරාගෙන තිබුණ ද, හොරණ මිල්ලෑව ප්‍රදේශයේ පිහිටි ඉඩම බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත පවරාදී නොතිබුණි. 2024 ජනවාරි 11 දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව අනුව බොරැල්ල පිහිටි ඉඩමේ වටිනාකම රු.31,844,850,000ක් වූ අතර, හිමිකම පවරා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ගිණුම්ගතකර නොතිබුණි. කොළඹ පිහිටි ප්‍රධාන බන්ධනාගාර

17

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ඉදිකිරීම සිදුනොකිරීම තුළින් බන්ධනාගාර තදබදය නිසා පෙරටත් වඩා ගැටලු රාශියකට බන්ධනාගාර දෙපාර්තමේන්තුව වර්තමානයේ මුහුණදී තිබුණි.

4.4. **පාඩු හා හානි**

(අ) වසර 10කට වඩා වැඩි කාලයක සිට පැවත එන වාහන අනතුරු 22ක් ඇතුලු සිද්ධීන් 26කට අදාළ අලාභය රු.35,144,088ක් ද, වසර 05 සිට 10 අතර කාලයක සිට පැවත එන වාහන අනතුරු 65කට අදාළ අලාභය රු.14,593,813ක්ද, වර්ෂ 05කට වඩා අඩු කාලයක සිට පැවත එන වාහන අනතුරු 55ක් ඇතුළුව සිද්ධීන් 56ක් සම්බන්ධ අලාභය රු.49,743,400ක් විය.

(ආ) 2021 නොවැම්බර් 22 වන දින NC-5426 දරන වැන්රථය අනතුරකට ලක්ව තිබූ අතර, නියෝජිත සමාගම මගින් වාහනයේ අලුත්වැඩියාව සඳහා රු.8,656,243ක ඇස්තමේන්තුවක් ඉදිරිපත්කර තිබුණි. නියමිත කාලසීමාව තුළදී අලුත්වැඩියාව නිමකර පරීක්ෂණය සඳහා ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති බැවින්, අදාළ රක්ෂණ සමාගම මෙම රක්ෂණ හිමිකමේ ඉදිරි කටයුතු සිදුකිරීමට නොහැකි බව දන්වා තිබුණි. පසුව මෙම වාහනය සඳහා රු.500,000ක උපරිම මුදලක් රක්ෂණ ආයතනය අනුමතකර තිබූ අතර, අලුත්වැඩියා සිදුකිරීම 2025 අප්‍රේල් 30 දින වන විට පෞද්ගලික ආයතනයක් මගින් සිදුකරනු ලබන බවත්, අලුත්වැඩියා කිරීමේ වියදම රු.4,300,000ක් වන බවත්, ඒ අනුව මෙම වාහන අනතුර මගින් සිදු වූ හානිය පූර්ණ ලෙස රක්ෂණ ආයතනය මගින් ප්‍රතිපූරණයකර ගැනීමට වගකිවයුතු නිලධාරීන් කටයුතුකර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 109(1) (අ) අනුව හානියෙන් අයකරගත යුතු උපරිම වටිනාකම සහ අයකර ගැනීමට තීරණය කරන මුදලත් අතර යම් වෙනසක් ඇතොත් ඒ වෙනස පොතෙන් අස්කර දැමීමට විධිවිධාන සලසා ඇති අතර, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2024 මූල්‍ය ප්‍රකාශනවල පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශනයේ (ඇමුණුම II)හි වර්ෂය තුළ මුදල් රෙගුලාසි 109 යටතේ වන පොතෙන් කපාහැරීම හා අයකර ගැනීම පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් අනතුරු 53කට අදාළ රු.4,134,753ක අලාභ වටිනාකම් සඳහා අධිභාර හා රක්ෂණ මගින් අයකරගෙන ඇති රු.3,681,782ක අයවීම් පිළිබඳ තොරතුරු සටහන්කර නොතිබුණි.

4.5. **විගණන විමසුම්වලට පිළිතුරු ලබානොදීම**

දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 19ක් සඳහා 2025 මැයි 29 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි.

18

4.6 කළමනාකරණ දුර්වලතා

(අ) නිලධාරීන්ට රජයේ නිවාස ලබාදීම හා නිවාස කුලී අයකිරීම

i. කිසියම් රජයේ නිවාසයක් ඉදිකිරීමේදී ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 2.3.1 උපවගන්තිය මගින් හඳුන්වාදී ඇති ආදර්ශ සැලසුම් අනුව ඉදිකිරීම්කර ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 3 වන වගන්තිය ප්‍රකාරව ඒ ඒ ශ්‍රේණියට හෝ තනතුරට අදාළව නිවාස ශ්‍රේණිගත කළ යුතු වුවත්, එපරිදි සැලසුම්කර ඉදිකිරීම සහ ශ්‍රේණිගත කිරීම සිදුකර නොතිබුණි.

ii. ද්විතීක මට්ටමේ තනතුරු සඳහා වෙන්කරන ලද රජයේ නිවාස තෘතියික මට්ටමේ තනතුරු දරන නිලධාරීන් සඳහා ලබාදීම හේතුවෙන් ද්විතීක මට්ටමේ තනතුරු දරන නිලධාරීන්ට නිවාස ලබාගැනීමේදී ගැටළුවලට මුහුණදීමට සිදු වී තිබුණි.

iii. නියාමකයන් සහ සැරයන්වරුන් සඳහා වෙන්කර ඇති B ගොඩනැගිල්ල සහ C සහ D මහල් නිවාස ද කාලීනව අලුත්වැඩියා නොකිරීම හේතුවෙන් පරිහානියට පත්වෙමින් පවතින බවත්, නියාමකයන් සහ සැරයන්වරුන්ගේ පේළි නිවාස සංකීර්ණය අබලන්ව ඉතා අනාරක්ෂිත තත්ත්වයක පවතින බවත්, එහි අවට පරිසරය ද ඉතාමත් අයහපත් තත්ත්වයක පවතින බැවින්, එම නිවාස මිනිස් වාසය සඳහා නුසුදුසු බවත්, ජේලර්වරුන් සඳහා වෙන්කර ඇති ඉතා පැරණි නිවාස කඩිනමින් අලුත්වැඩියා කළ යුතුව තිබුණි.

(ආ) රටවල් 15ක් සඳහා සිරකරුවන් මාරුකිරීමේ ගිවිසුම්වලට එළඹ නොමැති බැවින්, එම රටවල් වෙත අදාළ සිරකරුවන් භාරදීමේ ගැටළුවක් මතු වී ඇති අතර, 2024 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාරගතව සිටින විදේශ සිරකරුවන් 170 දෙනෙකුට අදාළ වන ඒ ඒ රටවල්වල ආහාර රටාවට ගැළපෙන ආකාරයට ආහාරපාන වර්ග ලබාදිය යුතු වීමත්, ඒ සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදුව ඇත. විදේශ සිරකරුවන් සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් සැපයීම හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අභියෝගයක්ව පවතින බවත්, බන්ධනාගාර ආයතනවල රැඳවිය හැකි රැඳවි ධාරිතාවය ඉහළ ගොස් ඇති පසුබිමක විදේශ සිරකරුවන් අදාළ රටවල් වෙත භාරදීම තුළින් එම සංඛ්‍යාවෙන් හෝ බන්ධනාගාර තදබදය අඩුකරගත හැකිව පැවතුණි.

(ඇ) බන්ධනාගාර ආයතන 21ක මළඅපවාහන ප්‍රතිකාරක පද්ධති (Treatment Plant) සහ මළඅපවාහන පද්ධති (Sewerage System) පරීක්ෂාවේදී පහත කරුණු හෙළිදරව් විය.

19

i. බන්ධනාගාර ආයතන 05ක මළ අපවාහන ප්‍රතිකාරක පද්ධති (Treatment Plant) පැවතිය ද, බෝගම්බර සහ බූස්ස යන බන්ධනාගාර දෙකෙහි පමණක් එම පද්ධති ක්‍රියාකාරීව පවතින බවත්, බූස්ස බන්ධනාගාරයේ මළඅපවාහන ප්‍රතිකාරක පද්ධතිය 2001 වර්ෂයේදී ඉදිකර ඇති බැවින්, එම යන්ත්‍රසූත්‍ර සහ නළ පද්ධතිය නවීකරණය කිරීම අවශ්‍යවන අතර, පොළොන්නරුව, අගුණකොළපැලැස්ස, යාපනය යන බන්ධනාගාර ආයතනවල සහ බෝගම්බර බන්ධනාගාර නිලධාරීන්ගේ නිලනිවාස හා බැරැක්ක ආශ්‍රිත මළඅපවාහන ප්‍රතිකාරක පද්ධති ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති බවත්, අගුණකොළපැලැස්ස බන්ධනාගාරයේ මළඅපවාහන ප්‍රතිකාරක පද්ධතිය නිසිඅයුරින් ක්‍රියාත්මක නොවීමත් මළ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය නොකර මුදාහැරීම නිසා පාරසරික හා සමාජීය ගැටලු රාශියක් ඇතිව තිබුණි. මෙම පද්ධතිවල යන්ත්‍රසූත්‍ර හා භූගත නළ පද්ධති නිසි ලෙස ක්‍රියාත්මක නොවීම මගින් අපිරිසිදු ජලය සෘජුවම බාහිර පරිසරයට බැහැරවීම ආදී ගැටළු හේතුවෙන් සිදුවන පාරසරික හානිය වළක්වා ගැනීම සඳහා මේ දක්වා තිරසර ක්‍රියාමාර්ගයක් ලබාගෙන නොතිබුණි.

ii. කෑගල්ල, අනුරාධපුරය, මොණරාගල, වාරියපොල, නව මැගසින්, කොළඹ රිමාන්ඩ් හා වැලිකඩ යන බන්ධනාගාර ආයතනවල මළඅපවහන පද්ධතිවල ගලි වළවල් කඩාවැටීම භූගත නළ මාර්ග කැඩී යාම, මළඅපවාහන පද්ධතිය ප්‍රමාණවත් නොවීම නිසා නිරතුරුව උතුරා යාම හේතුවෙන් පාරසරික හා සමාජීය ගැටළු රාශියක් සිදුව තිබුණි.

iii. මළඅපවාහන ප්‍රතිකාරක පද්ධතිය සහ මළඅපවාහන පද්ධති පවතින බොහෝ බන්ධනාගාර ආයතනවලින් විශාල පරිසර හානියක් සිදුවන බවත්, ඒ සඳහා ස්ථිර විධිමත් විසඳුමක් මේ දක්වා ලැබී නොතිබුණි.

(ඇ) වැලිකඩ බන්ධනාගාර කර්මාන්ත අංශයේ ස්ථාපිතකර ඇති බෑග් නිෂ්පාදන ව්‍යාපෘතිය පරීක්ෂාවේදී පහත කරුණු හෙළිදරව් විය.

i. බන්ධනාගාර දෙපාර්තමේන්තුව සහ බෑග් නිෂ්පාදනය කරනු ලබන පෞද්ගලික සමාගම අතර 2023 අප්‍රේල් 25 දින අත්සන් කරන ලද ගිවිසුමට අනුකූලව කටයුතු නොකර පැරණි ගිවිසුම අනුව සිරකරු වේතන ගෙවීම නිසා සිරකරුවන්ට, රජයට හා සිරකරු සුභසාධක අරමුදලට පිළිවෙලින් රු.1,281,440ක් හා රු.2,667,944ක් අඩුවෙන් ගෙවීම් සිදුකර තිබුණි.

ii. බන්ධනාගාර දෙපාර්තමේන්තුව සහ බෑග් නිෂ්පාදන පුද්ගලික සමාගම සමඟ ඇති කරගෙන ඇති නව ගිවිසුමේ 23 ඡේදය ප්‍රකාරව රජයේ ආදායමට සහ සිරකරු සුභසාධක අරමුදලට ගෙවිය යුතු මුදල වෙන් වෙන් වශයෙන් වූ චෙක්පත් දෙකක් මගින් පුනරුත්ථාපන අංශය වෙත ඊළඟ මස 15 වන දින හෝ එදිනට පෙර ඉදිරිපත් කළ යුතු වුව ද, එසේ නියමිත දිනයේදී ගෙවීම් කිරීමට අපොහොසත් වුවහොත් නව ගිවිසුමෙහි 25 ඡේදය ප්‍රකාරව රජයේ ගාස්තුව වශයෙන් සියයට 10ක ප්‍රමාද ගාස්තුවක් රජයට ගෙවිය යුතු වන අතර, එය දින 07ක උපරිමයකට යටත් විය යුතු වුව ද, 2025 ජනවාරි සිට මැයි දක්වා ගෙවීම් පරීක්ෂාවේ දී දින 19ත් 88ත් අතර කාල ප්‍රමාදයක් පැවතිය ද, ප්‍රමාද ගාස්තු ගෙවා නොතිබුණි.

iii. නේවාසිකයින් නිදහස් වීමෙන් පසු මෙම කර්මාන්තයට අදාළ වෘත්තීයන්හි නියැලීමට පහසු වන පරිදි ආයතනයෙන් විධිමත් සහතිකපත්‍රයක් ලබාදීමට දෙපාර්තමේන්තුව මගින් කටයුතුකර නොතිබුණි.

(ඉ) රට තුළ කවර හෝ අධිකරණයක අධිකාරී බලය යටතේ බන්ධනාගාරගත කරන ලද හෝ රිමාන්ඩ් භාරයට පත් කරන ලද, සෑම තරාතිරමකටම අයත් රැඳවියන්ගේ ආරක්ෂාව හා රැකවරණය බන්ධනාගාර නීතිරීතිවලට අනුකූලව සැලසීම හා රැඳවියන් පුනරුත්ථාපනය කර යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්යභාරයක් බවත්, දඬුවම් කාලය අවසන්වීමට පෙර නීත්‍යානුකූල නොවන ආකාරයෙන් පැනගිය/ මිදීගිය සිරකරුවන් හෝ සැකකරුවන් සංඛ්‍යාව පසුගිය වසර 06ක කාලපරිච්ඡේදය තුළ 995ක් ද, නැවත අත්අඩංගුවට නොගත් සංඛ්‍යාව 554ක් ද විය.

(ඊ) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ CCTV කැමරා සම්බන්ධ පරීක්ෂාවේදී පහත කරුණු හෙළිදරව් විය.

i. 2024 ජුනි 31 දින වන විට බන්ධනාගාර ආයතන 14ක CCTV කැමරා 792ක් සවිකර තිබූ අතර, ඉන් කැමරා 458ක් පමණක් ක්‍රියාකාරී තත්ත්වයේ පවතින අතර, කැමරා 334ක් එනම් සියයට 42ක් අක්‍රියව පැවතුණි. විගණනයට ලබාදී ඇති තොරතුරු අනුව අක්‍රිය වූ CCTV කැමරා වසර දෙකකට අධික කාලයක සිට අක්‍රියව පවතින බව හෙළිදරව්වීමෙන්, බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් CCTV කැමරා සවිකිරීමේ ප්‍රධාන අරමුණ සාක්ෂාත්කර ගැනීම අභියෝගයක්ව පැවතුණි.

ii. 2023 ජුනි 09 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නියෝග අනුව සිරකරුවන්ට ආරක්ෂාව හා රැකවරණය සලසමින් ඔවුන් පුනරුත්ථාපනයකර සමාජගත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ විශේෂ විගණන

21

වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම සමඟ ඉදිරිපත් කර තිබූ බන්ධනාගාර ආයතන සඳහා අවශ්‍ය නවීන තාක්ෂණ ආරක්ෂක උපකරණ ලබාගැනීමේ ව්‍යාපෘති යෝජනාවෙහි සඳහන් පරිදි මෙම සියලු ආරක්ෂක උපකරණ නඩත්තුව හා මෙහෙයවීම සඳහා සුදුසු තාක්ෂණික දැනුමකින් යුත් තාක්ෂණික ප්‍රධානියෙක් සහ තාක්ෂණික ශිල්පීන්ගෙන් සමන්විත තාක්ෂණික ඒකකයක් ඇති කිරීම අත්‍යාවශ්‍ය වන බව කමිටු යෝජනාවක් ලෙස ඉදිරිපත්කර තිබුණු ද, ඒ සඳහා විධිමත් පියවරගෙන නොතිබුණි.

(ඍ) බන්ධනාගාර ආයතන 18ක් තුළින් 2024 පළමු මාස 07 තුළ දුම්කොළ, හෙරොයින්, අයිස්, ගංජා, හැෂ් සහ මත්පෙති අත්අඩංගුවට ගෙන ඇති අතර, මෙම තහනම් මත්ද්‍රව්‍ය බන්ධනාගාර රැඳවියන් වෙත ලැබීම වැළැක්වීම සඳහා විධිමත් පියවරගෙන නොමැති අතර, එම තත්ත්වය විධිමත් පුනරුත්ථාපන ක්‍රියාවලියට බාධාවක් වී පැවතුණි.

(ඎ) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කර්මාන්ත අංශය සංවර්ධනය පරීක්ෂාවේදී පහත කරුණු හෙළිදරව් විය.

i. බන්ධනාගාර ආයතනවල කර්මාන්ත අංශයන්හි සේවයේ නියුතු නිලධාරීන්ට ආරක්ෂිත මෙවලම් ප්‍රමාණවත් පරිදි නොමැති වීම, නව තාක්ෂණික ක්‍රම සහ යන්ත්‍ර උපකරණ නොමැති වීම, ස්ථාන මාරුවීම් හා උසස්වීම් සම්බන්ධ ගැටළු, සියලුම වෘත්තිය උපදේශකවරු/කෘෂිඋපදේශකවරු සිටිය යුතු වැටුප් තලයේ පිහිටුවා නොමැති වීම, අදාළ ක්ෂේත්‍රයට අනුව වෘත්තිය පුහුණු සැසි නොපැවැත්වීම, තනතුරු පුරප්පාඩු සඳහා බඳවාගැනීම් සිදුනොකිරීම, වෘත්තීය පුහුණු කටයුතු කරගෙන යාම සඳහා ඉඩපහසුකම් සහිත ගොඩනැගිලි හා අමුද්‍රව්‍ය තොග ප්‍රමාණවත් පරිදි පවත්වාගෙන නොයාම, කර්මාන්ත වැඩ මූලික තනතුරෙන් ඉහළට තනතුරක් නොමැති වීම, පිටත වැඩ සඳහා සිරකරුවන් රැගෙන යාමට ප්‍රමාණවත් නිලධාරීන් නොමැති වීම සහ රාජකාරි සිදුකිරීමේදී ඉලක්කගත සැලසුමක් නොමැති වීම වැනි වෘත්තීය ගැටලු පැවතුණි.

ii. පවතින ප්‍රතිපාදන ගැටලු, ප්‍රමාණවත් සිරකරුවන් නොයෙදවීම හා අමුද්‍රව්‍ය හිඟ වීම ආදී කරුණු හේතුවෙන් 2024 සැප්තැම්බර් 02 දින සිට 06 දින දක්වා වූ දින 05ක කාලපරිච්ඡේදය තුළ බන්ධනාගාර ආයතන 15ක කර්මාන්ත අංශ 62ක සේවය සඳහා යෙදවිය හැකි සිරකරුවන් සංඛ්‍යාව 11,434ක් වුව ද, සේවයේ යෙදවූ සිරකරුවන් සංඛ්‍යාව 6,013ක් වීම තුළින් කර්මාන්ත අංශයේ සේවය සඳහා සිරකරුවන් 5,421ක් යොදවා නොතිබුණි.

22

iii. බන්ධනාගාර ආයතන 08ක බ්ලොක් ගල් නිෂ්පාදනය, කම්මල් අංශය, වඩු කර්මාන්තය, ලී ඉරුම් අංශය, වාහන සේවා අංශය, බේකරි අංශය කොහු ඉදල් අංශය සහ මල් පෝච්චි අංශය යන කර්මාන්ත අංශයන් අක්‍රීය වී ඇති තත්ත්වයක් හෙළිදරව් විය. එම ආයතන විසින් හඳුනාගෙන තිබූ හේතු සඳහා අවශ්‍ය පිළියම් යොදා එම කර්මාන්ත නිෂ්පාදන අංශ යළි ඇති කිරීමට විධිමත් පියවරගෙන නොතිබුණි.

iv. බන්ධනාගාර ආයතනවල කර්මාන්ත නිෂ්පාදන අලෙවි කිරීම සඳහා යොදා ඇති ක්‍රමවේදයන් පරීක්ෂාවේදී බූස්ස, කොළඹ රිමාන්ඩ්, බදුල්ල, ගාල්ල, කුරුවිට හා අඟුණකොළපැලැස්ස යන බන්ධනාගාර ආයතනවල නිෂ්පාදන අලෙවි කිරීම සඳහා එම බන්ධනාගාර තුළ අලෙවිසැල් පිහිටා නොමැති බවත්, අලෙවිසැල් පිහිටුවා ඇති බෝගම්බර, වටරැක, අනුරාධපුරය, පල්ලෙකැලේ, වැලිකඩ, වීරවිල හා තල්දෙන යන බන්ධනාගාර ආයතනවල එම අලෙවිසැල්වල ඉඩකඩ ප්‍රමාණවත්ව නොපැවතුණි.

v. බන්ධනාගාර ආයතනවල එක් එක් කර්මාන්ත අංශයන්ට අවශ්‍ය යන්ත්‍ර හා උපකරණවල ඌණතා පැවති අතර, එම ආයතනයන්හි ප්‍රශස්ථ නිෂ්පාදන ක්‍රියාවලියට දායක වීම සඳහා බන්ධනාගාර ආයතන 10ක යන්ත්‍ර හා උපකරණ 227ක අවශ්‍යතාවයක් පවතින බව අනාවරණය විය.

vi. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වන කාලීන අවශ්‍යතාවයට ගැළපෙන පරිදි රැඳවියන් පුනරුත්ථාපනයකර යහපත් පුරවැසියන් ලෙස සමාජගතවීමට අවශ්‍ය පසුබිම් සැකසීම සඳහා බන්ධනාගාර ආයතනවල පවතින කර්මාන්ත අංශයන්හි වෘත්තීය පුහුණුව ලබා පුනරුත්ථාපනය වන සිරකරුවන් සඳහා එම පුහුණුවෙන් පසු NVQ සහතිකපත්‍ර ලබාදීමේ විධිමත් වැඩපිළිවෙලක් පවත්වා ගැනීම තුළින් එම සිරකරුවන් සමාජගත වීමේදී ස්වාධීන රැකියාවකට යොමුවීමේ අවස්ථාවක් පවතින බවත්, එමගින් සිරකරුවන් නැවත බන්ධනාගාරගත වීම වැළැක්වීම තුළින් වාර්ෂිකව වැය වන මුදල් ඉතිරිකර ගනිමින් මෙම සිරකරුවන් රටට වැඩදායී පුද්ගලයින් බවට පත්කර ගැනීමට හැකියාව ලැබෙනු ඇති බවත්, ඒ සඳහා විධිමත් පොදු වැඩපිළිවෙලක් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ආරම්භකර නොතිබුණි.

(එ) රැඳවියන් බැලීමට එන පුද්ගලයින් විසින් බැහැර කරන ප්ලාස්ටික් බෝතල් විකිණීමට ක්‍රමවේදයක් නොමැති අතර, ඉතිරි වන පොල්කටු අඟුරු බවට පත්කිරීම, පොල්කටු විකිණීමෙන් ආදායමක් ලබාගත හැකි වුව ද, බන්ධනාගාර ආයතන 06ක් පමණක් එවැනි

23

ක්‍රමවේදයක් ඇතිකරගෙන ඇති බවත්, බන්ධනාගාර ආයතනවලින් ඉවත් වන ඉඳුල් සහ අනෙකුත් අපද්‍රව්‍ය භාවිතයෙන් කොම්පෝස්ට් පොහොර සෑදීමේ ව්‍යාපෘතියක් ආරම්භකර අමතර අලෙවි අදායමක් ලබාගත හැකි වුව ද, බන්ධනාගාර ආයතන 04ක් හැර අනෙකුත් බන්ධනාගාරවල එවැනි ක්‍රමවේදයක් නොතිබුණි.

(ඒ) බන්ධනාගාර මගින් ළමා සැකකරුවන් ළමා නිවාස වෙත යැවීමට සිදුවන අවස්ථා සහ රෝහල් ආරක්ෂණ හා අධිකරණ නියෝග මත වෙනත් අධිකරණ වෙත පසුදිනම ඉදිරිපත් කිරීමට (AR) නියෝගකර ලබාදෙන එක් රැඳවියෙකු හෝ දෙතුන් දෙනෙකු පමණක් ඊට අදාළ බන්ධනාගාර හෝ අදාළ අධිකරණ වෙත රැගෙන යායුතු අවස්ථාවලදී බන්ධනාගාර බස් රථ යොදාගැනීමට සිදුවීම, ප්‍රවාහන වියදම් අධික තත්ත්වයක් පවතින බවත්, මෙම ආරක්ෂණ රාජකාරි සඳහා ඉන්ධන පිරිවැය අඩු වාහනයක් (වෑන් රථයක්) යොදා ගැනීමත්, පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව ළමා සැකකරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමත් මගින් ඉන්ධන පිරිවැය අඩුකරගත හැකිවේ. පොළොන්නරුව බන්ධනාගාරය විසින් 2024 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල වරකට කිලෝමීටර් 150 හා ඊට වැඩි දුරක් ආරක්ෂණ රාජකාරි සඳහා බස් රථ යොදාගත් අවස්ථා 25කදී කිලෝමීටර් 6,737ක් සඳහා ඉන්ධන පිරිවැය ලෙස රු.432,604ක වියදමක් දරා තිබුණි.

(ඔ) 2019 මාර්තු 29 දින සහ 2023 ජුනි 09 දින පැවති රාජ්‍ය ගිණුම්කාරක සභාව මගින් ලබා දෙන ලද නියෝග ප්‍රකාරව 1877 අංක 16 දරන බන්ධනාගාර ආඥාපනත වෙනුවට නව පනතක් සකස්කිරීමේ කටයුතු ද 2024 දෙසැම්බර් 31 දින දක්වා අවසන්කර නොතිබුණි.

(ඕ) 1974 ජුනි 07 දිනැති බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අංක 634 චක්‍රලේඛයට අනුව වසර 02ක් හෝ ඊට වැඩි කාලයක් දඬුවම් ලබා දඬුවමින් වසරකට අඩුකාලයක් ගෙවීමට ඇති සිරකරුවන් වැඩසහන ක්‍රමය යටතේ ආයතනවල සේවයේ යෙදීමට අවස්ථාව ලබාදී තිබුණ ද, 2024 වර්ෂය තුළ බන්ධනාගාර ආයතන 02කින් රැඳවියන් 162ක් රජයේ ආයතන 03ක් වෙත පමණක් සේවයේ යොදවා ඉපයූ ආදායමෙන් රු.278,572ක් රජයේ ආදායමට ද, රු.1,392,860ක් සිරවේතන ලෙස සිරකරුට ද, රු.139,286ක් සිරකරු සුභසාධක අරමුදලට ද බැරකර තිබුණි. තව ද, කෙටිකාලීන ක්‍රමය යටතේ අවුරුදු එකක් හෝ ඊට අඩු කාලයක් සඳහා සිරගත වූවන් ද සේවයේ යෙදවීමට අවස්ථාව ලබාදී තිබුණ ද, එම ක්‍රමය ක්‍රියාත්මකකර නොතිබුණි. සියලුම බන්ධනාගාර ඒකාබද්ධව රජයේ හා පෞද්ගලික අංශයේ ආයතනවල ද රැඳවියන් සේවයේ යෙදවීමෙන් බන්ධනාගාර තදබදය අවම කිරීම මෙන්ම රැඳවියන් පුනරුත්ථාපන ක්‍රමයක් ලෙස ද උපයෝගීකර

ගැනීමේ හැකියාව පැවතුණ ද මෙම ක්‍රම දෙක යටතේ සිරකරුවන් විධිමත් පරිදි පිටත සේවයේ යොදවා නොතිබුණි.

(ක) 2024 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර දෙපාර්තමේන්තුව තුළ සිර/සැක අනුමත ධාරිතාව 10,395ක් වුව ද, එදිනට තථ්‍ය ධාරිතාවය 28,278ක් වීමෙන් රැඳවියන් 17,883ක් ධාරිතාවය ඉක්මවා බන්ධනාගාර පද්ධතිය තුළ රඳවා තිබූ අතර, එය සියයට 272ක ඉහළ යාමක් ලෙස පැවතුණි. තව ද, 2025 මැයි 29 දින වන විටත් කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය තුළ රැඳවිය හැකි රැඳවි ධාරිතාව 465ක් වුව ද, එදිනට තථ්‍ය ධාරිතාව 2,206ක් වීමෙන් රැඳවියන් 1,741ක් ධාරිතාවය ඉක්මවා රඳවා තිබූ අතර, එය සියයට 474ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ග) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ වාහන උපයෝජනය පරීක්ෂාවේදී පහත කරුණු හෙළිදරව් විය.

i. 2024 දෙසැම්බර් 31 දින වන විට බන්ධනාගාර ආයතන 07ක වාහන 08ක් තෙවන පාර්ශවයේ රක්ෂණයක් හෝ සිදුනොකර ධාවනයේ යොදවා තිබුණි.

ii. විගණනය විසින් සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව බන්ධනාගාර ආයතන 11ක වාහන 26ක් දැනට භාවිතා කරන නමුත්, 2024 දෙසැම්බර් 31 දින වන විට වායු විමෝචන සහතිකය ලබාගෙන නොතිබුණි.

iii. අනුරාධපුර, යාපනය, වැලිකඩ, මොණරාගල, කුරුවිට, මාතර සහ වීරවිල යන බන්ධනාගාර ආයතන 07ක වාහන 20ක මයිලෝ මීටර 2024 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබුණි.

iv. බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් රජයේ වෙනත් ආයතන සතු මෝටර් වාහන 14ක් පරිහරණය කරන අතර, මෙම මෝටර් වාහන 2025 අප්‍රේල් 28 දින දක්වා පවරාගෙන නොතිබුණි.

(ජ) මත්ද්‍රව්‍ය වැරදි වැඩිවීම රටේ අනෙකුත් අපරාධ ක්‍රියාකාරකම් වැඩිවීමට සෘජුවම බලපාන අතර, මත්ද්‍රව්‍ය වැරදිකරුවන්ගෙන් බොහෝමයක් මත්ද්‍රව්‍ය භාවිතය, සන්තකයේ තබා ගැනීම, මිලදීගැනීම, විකිණීම සමබන්ධයෙන් බන්ධනාගාරගත වුවන් වේ. ඔවුන් කවර හෝ ආකාරයකින් අවශ්‍ය මත්ද්‍රව්‍ය ප්‍රමාණය ලබාගැනීමට කරන උත්සාහයන් වැළැක්වීමට බන්ධනාගාර නිලධාරීන්ට වැඩි අවධානයක් යොමුකිරීමට සිදුවන නිසා බන්ධනාගාර ප්‍රධාන අරමුණු කරා ළඟාවීමට, බන්ධනාගාරයේ ආරක්ෂාව, නිලධාරීන්ගේ ආරක්ෂාව හා ක්‍රියාකාරීත්වයට බාධාවක් වී ඇත. ලංකාවේ 2024 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය

වැරදි මත සිරගතවූවන් සංඛ්‍යාව 31,314ක් වූ අතර, සැකකරුවන් සංඛ්‍යාව 67,117ක් විය. 2024 වර්ෂය තුළ බන්ධනාගාරය වෙත සෘජු ඇතුළත් කිරීම්වලින් සියයට 65.5ක් මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධ රැඳවියන් විය.

(ට) විෂ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය සඳහා පුනරුත්ථාපන කාර්යාංශය මගින් පවත්වාගෙන යනු ලබන කන්දකාඩු, සේනපුර හා වව්නියාව ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවල 1,120 ක් පුනරුත්ථාපනය කළ හැකි වුව ද, 2024 දෙසැම්බර් 31 දිනට ධාරිතා උපයෝජනය 262ක් විය. ඒ අනුව තවදුරටත් 858 දෙනෙක් සඳහා මෙම පුනරුත්ථාපන මධ්‍යස්ථානවල පහසුකම් පැවතුණ ද, එම මධ්‍යස්ථාන ඌණ උපයෝජිතව පැවතුණි. තව ද, 2024 වර්ෂය තුළ මෙම මධ්‍යස්ථාන 03 සඳහා යොමුකළ ගණන 642ක් තරම් අඩු ප්‍රමාණයක් වූ අතර, බන්ධනාගාර තදබදයට පිළියමක් ලෙස මෙන්ම මත්ද්‍රව්‍යවලට අබ්බැහි වූ රැඳවියන් පුනරුත්ථාපනයකර සමාජගත කිරීමේ හැකියාව ද සලසා සෘජුවම මෙම මධ්‍යස්ථාන වෙත අධිකරණයෙන් යොමුකිරීම වෙනුවෙන් අවශ්‍ය පසුබිම බන්ධනාගාර දෙපාර්තමේන්තුව, අධිකරණ සේවා කොමිසම, අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය එකතුව සිදුකිරීමේ අවශ්‍යතාවයක් පැවතියද එම ආයතන එපරිදි කටයුතුකර නොතිබුණි.

(ඩ) සිරකරුවන් විධිමත් පරිදි පුනරුත්ථාපනය කිරීමට නොහැකි වූ විට ඔවුන් නැවත නැවත බන්ධනාගාරගත වන අතර, ඉන් වැඩි පිරිසක් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් නිසා ඔවුන් සඳහා නිසි ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක නොවීම තුළින් නැවතත් මත්ද්‍රව්‍ය භාවිතාකර සිරගතවීම සිදු වේ. 2024 වර්ෂය තුළ බන්ධනාගාර වෙත සෘජු ඇතුළත් කිරීම් තුළින් නැවත නැවත සිරගත වූවන් සංඛ්‍යාව 34,488 ක් වන අතර, ඔවුන් හඳුනාගැනීමට විධිමත් ක්‍රමවේදයක් පවා බන්ධනාගාරය සතුව නොමැතිවීමත්, දැනට නැවත නැවත සිරගත වන සිරකරුවන් හඳුනාගනු ලබන්නේ එම සිරකරුවන් විසින්ම ලබා දෙන වාචික තොරතුරු මත වේ.

(ණ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම් පරීක්ෂාවේදී පහත කරුණු හෙළිදරව් විය.

i. අත්තිකාරම් "බී" ගිණුමේ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2024 ජනවාරි 01 දිනට අයවිය යුතු කේවල ශේෂවල මුළු වටිනාකම රු.209,504,062ක් විය. එයින් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ගේ අයවිය යුතු ණයශේෂය හැර නිලධාරීන් 231 දෙනෙකුගෙන් අයකරගත යුතු හිඟහිටි ණයශේෂය රු.10,782,944ක් වූ අතර, එයින් නිලධාරීන් 106 දෙනෙකුගේ රු.4,572,791ක හිඟහිටි ණයශේෂයක් 2024 වර්ෂය තුළ අයකරගෙන තිබුණු අතර, 2024 වර්ෂයේදී නිලධාරීන් 71 දෙනෙකුගේ රු.3,548,024ක වටිනාකමක් හිඟහිටි ණයශේෂයයට

26

අලුතින් ඒකතු වී ඇත. ඒ අනුව වර්ෂය අවසන් වන විට තවදුරටත් නිලධාරීන් 196 දෙනෙකුගෙන් රු.9,758,177ක හිඟහිටි ණයශේෂයක් අයකරගත යුතුව තිබුණි.

ii. සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කේවල ශේෂවල මුළු වටිනාකම රු.240,005,072ක් විය. එයින් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ගේ අයවිය යුතු ණයශේෂය හැර සමාලෝචිත වර්ෂයේ අවසානයේ අයවිය යුතු ණයශේෂය රු. 10,170,334ක් වූ අතර, මෙම ශේෂයේ වර්ෂයකට වඩා වැඩි හිඟහිට ණයශේෂවල වටිනාකම රු.6, 985,090ක් විය.

iii. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමට අදාළව 2023 වර්ෂයේදී ඉදිරිපත් කළ වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේ වසර 3කට වඩා වැඩි කාලයක සිට පැවත එන එහෙත් අයකරගත යුතු පාර්ශවය නිශ්චිතව හඳුනාගෙන නොමැති රු.401,153ක ණයශේෂයක් එම මූල්‍ය ප්‍රකාශන විගණනයේදී හඳුනාගෙන තිබුණි. පසුගිය වර්ෂයන්හිදී හඳුනාගෙන නොමැති එහෙත් වර්ෂ 5 ඉක්මවන ලද රු.11,004ක ශේෂයක් ද 2024 වර්ෂයේ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමට ඇතුළත් තිබුණි.

(ත) එක්සත් ජාතීන්ගේ අවම ප්‍රමිතීන් අනුව ස්ත්‍රී/ පුරුෂභාවය, වයස, අපරාධයේ ස්වභාවය, නීතිමය අවශ්‍යතා හා ප්‍රතිකාරමය අවශ්‍යතා අනුව සිරකරුවන් වර්ගීකරණයකර වෙන වෙනම රැඳවීම අත්‍යාවශ්‍ය මූලධර්මයක් ලෙස සඳහන් වන අතර, බන්ධනාගාර ආඥාපනතේ 54 ඡේදයට අදාළව 1956 වර්ෂයේදී සිදු කරන ලද සංශෝධනයන් හි 177 හා 178 ඡේදයට අනුව බන්ධනාගාරයේ ඉඩපහසුකම් ඇති ආකාරයට එක් එක් වර්ගයට අයත් සිරකරුවන් වෙන වෙනම රඳවා තබා ගත යුතු වුව ද, දැනට ආයතන තුළ පවතින අධික තදබදය හේතුවෙන් බන්ධනාගාර ආයතන 18ක එසේ වර්ග කිරීමකින් තොරව රැඳවියන් රඳවා තිබුණි.

(ද) 2024 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර ආයතන 27ක සුළු දඩමුදල් ගෙවා ගැනීමට නොහැකිව බන්ධනාගාරගත වී ඇති සිරකරුවන් සංඛ්‍යාව 3,258ක් බව හෙළිදරව් වූ අතර, පවතින බන්ධනාගාර තදබදයට මෙම තත්ත්වය හේතුවක් වී තිබුණි.

(න) අධිකරණ මගින් බන්ධනාගාරගතකර ඇති සැකකරුවන්ට අදාළව පොලිසිය විසින් රසපරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන නඩු භාණ්ඩවලට අදාළව රසපරීක්ෂක වාර්තා ඉදිරිපත් නොවීම නිසා 2024 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර ආයතන 20ක සැකකරුවන් 9,560 දෙනෙක් රඳවා තිබුණි.

27

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ප) බන්ධනාගාර ආයතන 10ක අභියාචනා ඉදිරිපත් කළ දිනයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා පරීක්ෂණ අවසන්කර නොමැති අභියාචනා සංඛ්‍යාව 333ක් විය.

(බ) ඇපමුදල් ගෙවීමට නොහැකි සැකකරුවන් බන්ධනාගාරගත කරන අතර, එම සැකකරුවන් ඇපමුදල් ගෙවා නිදහස් කිරීමේ නියෝගය ලද වහාම ඔවුන් නිදහස් කළ යුතු ය. එහෙත් බන්ධනාගාර ආයතන 11ක 2024 වර්ෂය තුළ ඇපමුදල් ගෙවූ දිනයෙන් පසුදිනෙක අවස්ථා 9,091කදී සැකකරුවන් නිදහස්කර තිබුණි.

(ම) දඩමුදල් ගෙවීමට නොහැකි වරදකරුවන් සිරගත කරන අතර, එම සිරකරුවන්ගේ දඩ මුදල් ගෙවා නිදහස් කිරීමේ නියෝගය ලද වහාම ඔවුන් සිරදඬුවමින් නිදහස් කළ යුතු ය. නමුත් බන්ධනාගාර ආයතන 17ක 2024 වර්ෂය තුළ නිදහස් කිරීමේ නියෝගය ලද දිනයේම සිරදඬුවමින් මුදාහැර නොතිබුණු අවස්ථා 2,278ක් විය.

(ය) බන්ධනාගාර ආයතන 21කට අදාළව බන්ධනාගාරගත වී ඇති රැඳවියන් වෙනුවෙන් අධිකරණය මගින් ඇප නියම වී තිබුණ ද අදාළ රැඳවියන් හට ඇප කොන්දේසි සපුරාලිමට නොහැකිවීම ඇප තැබීමට ඥාතීන් ඉදිරිපත් නොවීම, මුදල් නොමැතිකම වැනි හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට බන්ධනාගාරගත වී සිටින රැඳවියන් සංඛ්‍යාව 1,252ක් වන අතර, එයින් ඇප නියම වී වසර එකට වඩා වැඩි රැඳවියන් 55ක් විය.

(ර) බන්ධනාගාර ආයතන 20ක් තුළින් 2024 දෙසැම්බර් 31 දිනට අත් අඩංගුවට ගන්නා ලද ජංගම දුරකථන 3,738ක්, බැටරි 3,229ක්, චාජර් 524ක් හා සිම්පත් 2,999ක් වන අතර, මෙම උපකරණ බන්ධනාගාර රැඳවියන් අතට පත්නොවීමට විධිමත් පියවරගත යුතු බවත්, රැඳවියන් අතර පත්වීම හේතුවෙන් විවිධ නීතිවිරෝධී ක්‍රියාවන් සිදු වන බවත් හෙළිදරව් විය.

(ල) අගුණකොළපැලැස්ස පුහුණු පාසලේ 2024 ජුනි සිට නොවැම්බර් දක්වා කාලය තුළ පැවැත් වූ පුහුණු සැසි 11කට සහභාගි වූ නිලධාරීන්ගේ සංඛ්‍යාවට වඩා වැඩි නිලධාරීන් සංඛ්‍යාවක් සඳහා ආහාරපාන ලබාදීම වෙනුවෙන් රු.203,495ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ව) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වන සුභසාධන ආපනශාලා සහ අලෙවිසැල්වල සේවය කිරීම සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් අනුයුක්ත කර තිබූ අතර, ඔවුන් වෙත වැටුප්, අතිකාල හා අනෙකුත් දීමනා ගෙවනු ලබන අතර, ජල හා විදුලිය වෙනුවෙන් ද වැය වන වියදම බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් දරනු ලබයි. මීට අමතරව සෑම ආපනශාලාවක් සඳහාම සිරශ්‍රමය ද යොදාගෙන තිබුණි. නමුත් මෙම සුභසාධන ආපනශාලා සහ අලෙවිසැල් පවත්වාගෙන යාම වෙනුවෙන් ලැබිය යුතු කුලී ආදායම් හඳුනාගෙන එම ආදායම් මුදල් රෙගුලාසි 83 ප්‍රකාරව රජයේ ආදායම් ශීර්ෂ අංක

28

05හි ආදායම් සංකේත අංක 20-02-01-01 යටතේ බදුකුලී ආදායම් ලෙස රජයේ ආදායමට බැරකිරීමට කටයුතු කළ යුතු වුව ද, බූස්ස, මඩකලපුව, තල්දෙන, වීරවිල, වව්නියාව, බන්ධනාගාර මූලස්ථානය හා හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය යන බන්ධනාගාර ආයතනවල ඇති සුහසාධක ආපනශාලාවලින් බදුකුලී ආදායම් රජයේ ආදායමට බැරකර නොතිබුණි. මෙම සුහසාධන ආපනශාලා සහ අලෙවිසැල්වලට 2024 වර්ෂය තුළ අනුයුක්ත බන්ධනාගාර නිලධාරීන් වෙනුවෙන් වැටුප්, අතිකාල හා වෙනත් දීමනා වශයෙන් රු.12,944,077ක මුදලක් බන්ධනාගාර දෙපාර්තමේන්තුව ගෙවා තිබුණි.

(ස) බන්ධනාගාර ආයතන 16ක 2024 දෙසැම්බර් 31 දින වන විට ගිනිඅවි 239ක් අක්‍රිය වී තිබුණු අතර, බන්ධනාගාර ආයතන 09ක තිබූ ගිණිඅවි 70ක්, මැගසින් 51ක් හා පතුරොම් 1,021ක් විමර්ශණ කටයුතු සඳහා අධිකරණ හා පොලිස් ස්ථානවෙත භාරදී අවුරුදු 02ත් අවුරුදු 30ත් අතර කාලපරාසයක් ගත වී තිබුණ ද, 2025 අප්‍රේල් 28 දින දක්වා විධිමත් පරිදි නැවත ලබාගෙන නොතිබුණි. ගිනිඅවි අක්‍රිය වී පැවතීම හා විවිධ විමර්ෂණ සඳහා අධිකරණ හා පොලිස් භාරයේ පැවතීම හේතුවෙන් ආයතනයේ අධිකරණ රාජකාරී, විශේෂ රෝහල් රාජකාරී, ආරක්ෂණ රාජකාරී හා යම් කලහකාරී අවස්ථාවකදී එය පාලනය කිරීමට සම්බන්ධ වීමේ දී බන්ධනාගාර නිලධාරීන්ට යම් ගැටළුකාරී තත්ත්වයක් මතුවිය හැකිව තිබුණි.

(හ) බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමේ රාජ්‍ය අංශයට සිදුකරන ලද විකුණුම් වෙනුවෙන් ලැබිය යුතු රු.170,560,476ක ශේෂයෙන් වසර 20කට වඩා පැරණි රු.3,000,924ක් හා වසර 5 – 20ත් අතර රු.23,020,150ක ලැබිය යුතු ශේෂය මුදල් රෙගුලාසි 502(ආ) ප්‍රකාරව අප්‍රමාදව අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

5. **යහපාලනය**

5.1 **විගණන හා කළමනාකරණ කමිටුව**

බන්ධනාගාර සුහසාධක අලෙවිසැල් හා ආපනශාලා සඳහා විධිමත් නියාමනයක් ඇතිවන පරිදි මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස්කිරීම පිළිබඳව අමාත්‍යාංශය හා බන්ධනාගාර විගණන හා කළමනාකරණ කමිටුවලදී සාකච්ඡා සිදුකළ ද, එම මාර්ගෝපදේශ සංග්‍රහය සකස්කර විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

29

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්තකාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා අනුමත නිලධාරීන් ගණන 7,872ක් වූ අතර, තථ්‍ය වශයෙන් සේවයේ නියුක්ත නිලධාරීන් ගණන 6,082කි. ඒ අනුව එක් එක් තනතුරු 4හි සියයට 20 වඩා නිලධාරීන් පුරප්පාඩු සංඛ්‍යාවක් සහිතව දෙපාර්තමේන්තුවේ කටයුතු කරයි.

(ආ) අනුමත කාර්යමණ්ඩලය තුළ එක් එක් තනතුරුවලට අදාළව නිලධාරීන් 1,810කට වැඩි ප්‍රමාණයක් පුරප්පාඩුව පැවතීම මත රැකියා පීඩනය හා රැකියාවේ අතෘප්තකර බව ඔවුන්ගේ කාර්යසාධනය හා ආයතනයේ කාර්යසාධනය කෙරෙහි බලපා තිබුණි.

(ඇ) 2024 දෙසැම්බර් 31 දිනට අදාළව බඳවා ගැනීමේ පටිපාටියේ ඇතුළත් තනතුරු 24ක් සම්බන්ධයෙන් පූර්ණ වශයෙන් පුරප්පාඩු 77ක් සඳහා නිළධාරීන් බඳවාගෙන නොතිබුණි.

(ඈ) දෛනිකව බන්ධනාගාරගත වන සිර/සැක ප්‍රමාණය අධිකවීමෙන් 2024 දෙසැම්බර් 31 දිනට එම ප්‍රමාණය 28,278ක් වී තිබුණි. ඒ අනුව රැඳවියන් හා ඍජුව සම්බන්ධ වන ජේලර්, පුනරුත්ථාපන නිලධාරී, සැරයන් හා නියාමක තනතුරුවල පුරප්පාඩු 1,376ක් විය. එය සමස්ථ නිලධාරී පුරප්පාඩු ගණනින් සියයට 76ක් පමණ වේ.

(ඉ) 2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ තථ්‍ය කාර්ය මණ්ඩලය තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ වෛද්‍ය නිලධාරීන් 17 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.

(ඊ) බන්ධනාගාර ආයතන අනුව අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පරීක්ෂාවේදී බන්ධනාගාර ආයතන 25ක නිලධාරීන් අතිරික්තයක් පවතී. ඉන් ප්‍රධාන වශයෙන් බන්ධනාගාර මූලස්ථානයේ නිලධාරීන් 54 දෙනෙක්, මාතර බන්ධනාගාරයේ නිලධාරීන් 24 දෙනෙක්, බූස්ස බන්ධනාගාරයේ නිලධාරීන් 20 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.

(උ) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ තනතුරු සඳහා වූ කාර්යමණ්ඩලය 2013 වර්ෂයේදී අනුමතකර ඇති අතර, එය එවකට දෙපාර්තමේන්තු නිලධාරී අවශ්‍යතාවය හා රැඳවියන් ප්‍රමාණයට සාපේක්ෂව ප්‍රමාණවත් වුව ද, දෛනිකව අධිකරණය මගින් බන්ධනාගාරගත කරනු ලබන සිර හා සැක ප්‍රමාණය විශාල සංඛ්‍යාවක් වීම මත අනුමත කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවන අතර, එය වර්තමාන අවශ්‍යතාවයන්ට ගැළපෙන ලෙස විශ්ලේෂණය කොට සංශෝධනයකර නොතිබුණි.

30

(ඍ) සහකාර බන්ධනාගාර අධිකාරී (කාන්තා), සහකාර බන්ධනාගාර අධිකාරී පුනරුත්ථාපන (කාන්තා), උපදේශක නිලධාරී සහ ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර යන තනතුරු සඳහා 2025 මැයි 08 දින වන විටත් අනුමත කළ බඳවාගැනීමේ පටිපාටියක් නොතිබුණි.

(එ) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ තනතුරු 18ක් සම්බන්ධයෙන් වූ බඳවාගැනීමේ හා උසස්කිරීමේ පටිපාටීන් අනුමත වී වසර 10ක් හෝ ඊට වැඩි කාලයක් ගතව ඇති අතර, ඉන් තනතුරු 15ක් සම්බන්ධයෙන් වූ නව බඳවාගැනීමේ පටිපාටීන් ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ මත අමාත්‍යාංශය වෙත ඉදිරිපත්කර ඇතත්, මෙතෙක් රාජ්‍ය සේවා කොමිෂමේ අනුමැතිය හිමිවී නොතිබුණි.

(ඒ) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික හා මාණ්ඩලික නොවන තනතුරුවල සේවය කරන නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය ඇතුළත් විධිමත් ස්ථාන මාරු පටිපාටියක් සකස්කර නොතිබුණි.

(ඔ) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ස්ථිර තනතුරක් වන බන්ධනාගාර නියාමක තනතුරේ නිලධාරියෙකු බන්ධනාගාර මූලස්ථානයේ සිට 2014 මාර්තු 10 දින සිට සහ මෝටර් රියදුරෙකු 2020 ඔක්තෝබර් 22 දින සිට අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වෙත තාවකාලිකව මුදාහැර තිබුණි. එම නිලධාරීන් වෙනුවෙන් 2025 මාර්තු මාසය දක්වා වැටුප්, අතිකාල හා නිලඇඳුම් දීමනා වෙනුවෙන් රු.9,040,909ක මුදලක් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් දරා තිබුණු අතර, නැවත බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත මුදාහැර නොතිබුණි. තව ද, එම වියදම් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය මගින් ප්‍රතිපූර්ණය කිරීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව කටයුතුකර නොතිබුණු බවත්, නිලඇඳුම් භාවිතා නොකළ ද එම දීමනා ගෙවා තිබුණි.

(ඕ) බන්ධනාගාර ආයතනයන්හි කර්මාන්ත අංශවල 2024 දෙසැම්බර් 31 දිනට වෘත්තීය උපදේශක, කර්මාන්ත පරිපාලක, කෘෂි උපදේශක, වැඩ මූලික හා මෝටර් කාර්මික වැනි තනතුරුවල වර්තමානයේ නිලධාරීන් 90දෙනෙකු රාජකාරී කරනු ලැබුව ද, එම ආයතනවල අනුමත කාර්ය මණ්ඩලය එදිනට 217ක් වීමෙන් නිලධාරීන් 127ක ඌණතාවක් පැවතීම හේතුවෙන් ඉදිකිරීම්, කර්මාන්ත, වැඩබිම්වල කාර්යක්ෂමතාවය, ව්‍යාපෘතිවල ඵලදායීත්වය හා ගුණාත්මකභාවය පහළ මට්ටමක පැවතුණි. ඉහත තනතුරු දරන නිලධාරීන් වෙනුවට බන්ධනාගාර නියාමක, සැරයන් සහ II පෙළ ජේලර් තනතුරුවල නිලධාරීන් 41ක් දෙනෙකු බන්ධනාගාර ආයතන 12ක කර්මාන්ත අංශයන්ට අදාළ රාජකාරී කටයුතුවල නියැලෙන බව හෙළිදරව් වූ අතර, වර්තමානයේ පවතින නිලධාරී හිඟය තවදුරටත් වර්ධනය වීමට එය හේතුවක් වී තිබුණි. කර්මාන්ත අංශයට සම්බන්ධ එම නිලධාරීන් බඳවාගැනීමට දීර්ඝ කාලයක සිට කටයුතු නොකිරීම තුළින්

31

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

අනාගතයේදී බන්ධනාගාර කර්මාන්ත අංශය අක්‍රිය වී සිරකරු ශ්‍රමය ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයක් හා විධිමත් පුනරුත්ථාපනයක් සිදුනොවන තත්ත්වයක් පැවතුණි.

(ක) දෙපාර්තමේන්තුගත තනතුරු 04කට පමණක් අදාළ වන පුහුණු වැඩසටහන් සඳහා වූ මාර්ගෝපදේශයක් යොදාගන්නා අතර, දෙපාර්තමේන්තුගත තනතුරු 07ක් සඳහා පුහුණු වැඩසටහන් සම්බන්ධ මාර්ගෝපදේශයන් භාවිතාකර නොතිබුණි. තව ද එම මාර්ගෝපදේශයන් යාවත්කාලීන කිරීම ආසන්න වසර 07ක් තුළ සිදුකර නොමැති අතර, ඒ සියලුම මාර්ගෝපදේශයන් සඳහා නිත්‍යානුකූල අනුමැතියක් ද නොතිබුණි.

(ග) සිරකරුවන් කළමනාකරණය කිරීමේදී හා අනෙකුත් ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක වීමේදී බන්ධනාගාර නිලධාරීන්ට ගිනිඅවි පුහුණුව ලබාදීම අත්‍යාවශ්‍ය වුවත්, සෘජුවම සිරකරුවන් සමඟ සම්බන්ධ වන සහ ගිනිඅවි පුහුණුව ලැබිය යුතු බන්ධනාගාර නිලධාරීන්/ නිලධාරිනියන් 1,171 දෙනෙකුට පමණක් 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වූ කාලය තුළ ගිනිඅවි පුහුණුව ලබාදීම සිදුකර තිබූ අතර, නිලධාරීන් 4,024කට පමණ අදාළ ගිනිඅවි පුහුණුව ලබාදී නොතිබුණි.

(ජ) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළව ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ සඳහන් වරදවල් සම්බන්ධව විනය පරීක්ෂණ 142ක් ද 2023 හා 2024 වර්ෂවලට අදාළව එම පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ සඳහන් විනය පරීක්ෂණ 47ක් පැවතුණි.

යූ.එන්.අලුත්ගේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට(වැ.බ)

32




# 04

# කාර්යසාධන දර්ශක


4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 99

## 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| අනු අංකය | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100%- 90% | 75%-89% | 50%- 74% |
| 1 | පල්ලේකැලේ බන්ධනාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය (කොන්ත්‍රාත් අංක - 11) | 99.7 | | |
| 2 | බන්ධනාගාර ආයතන අළුත්වැඩියාව සඳහා වෙන්වූ ප්‍රතිපාදන උපයෝජනය | 97.78 | | |
| 3 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතු වාහන අළුත්වැඩියාව සඳහා වෙන්වූ ප්‍රතිපාදන උපයෝජනය | 95.55 | | |
| 4 | රැඳවි පුහුණුව සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන භාවිතය හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 98.43 | | |
| 5 | රැඳවියන්ගේ තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ භෞතික ප්‍රගතිය | | | 60.65 |
| 6 | රැඳවියන්ගේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම | | | 51.5 |
| 7 | පල්ලන්සේන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානයේ ගොඩනැගිලි ඉදිකිරීම | 98.5 | | |

# 05

# තිරසර සංවර්ධන අරමුණ [SDG] සපුරා ගැනීමේ කාර්යසාධනය




5.1. හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණ 103

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න 104

5.2.1. ඉලක්ක 16.2 සපුරා ගැනීමේ අභියෝග 104

5.2.2. ඉලක්ක 16.6 ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 107

## 5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණ

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%- 100% |
| 16. තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී හා පරිපූර්ණ සමාජයක් ඇති කිරීමට, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සැම මට්ටමකම ඵලදායී වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩ නැගීම. | 16.2 සියලු දෙනාටම නීතියේ සාධාරණත්වය ලබා ගැනීමට හැකිවීම සහ ජාතික හා අන්තර්ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍ය ප්‍රවර්ධනය කිරීම. | 16.3.2 සමස්ථ සිරකරුවන් සංඛ්‍යාවෙන් දඬුවම් නියම නොකල රැඳවියන් ප්‍රමාණය. | | 67.15 | |
| | 16.6 සියලුම මට්ටම් වලදී ඵලදායී වගවීමෙන් යුක්ත සහ විනිවිද භාවයෙන් යුත් ආයතන පිහිටුවීම. | 16.6.1 අයවැය මගින් අනුමත ප්‍රතිපාදන ප්‍රමාණයෙන් රාජ්‍ය වියදම් අංශයට දැක්වූ දායකත්වය | | | 95.88 |

## 5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

### 5.2.1 ඉලක්ක 16.2 සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

තිරසාර සංවර්ධන ඉලක්ක යටතේ බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් අත්පත් කර ගත යුතු ජයග්‍රහණ දර්ශක ලෙස සෘජුවම හඳුනාගෙන පවතින්නේ 16.3.2. යටතේ දක්වා ඇති සමස්ථ බන්ධනාගාරගත රැඳවියන් සංඛ්‍යාවෙන් දඬුවම් නියම නොකල රැඳවියන් ප්‍රමාණය යන දර්ශකය වේ. එම දර්ශකය පාදක වර්ෂය වන 2015 වසරට සාපේක්ෂව පසුගිය වසර 09 ක් තුළ ව්‍යාප්තව ඇති ආකාරය පහත වගුව මගින් නිරූපනය වේ.

සිරකරුවන් හා සැකකරුවන් ගහනය අතර පරතරය විශාල වීම මගින් අපරාධ යුක්ති ක්‍රමයේ විශ්වාසනීයත්වයට යම් බාධාවක් ඇති බව සමාජයට නිරූපනය වේ. මෙම පරතරය අඩුකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේ සම්බන්ධ මනාව අධ්‍යයනයකින් අදාළ සියළුම පාර්ශව වල නිරන්තර සහභාගීත්වයෙන් මේ වන විටත් ආරම්භ කර ඇත.

2015-2024 කාල පරිච්ඡේදය තුළ තිරසාර සංවර්ධන ඉලක්ක දර්ශක 16.3.2 හි ව්‍යාප්තිය




දත්ත මූලාශ්‍රය - 2015 -2024 වර්ෂය දක්වා දෙසැම්බර් 31 දිනට වන අළුයම විවෘතයේ සංඛ්‍යාලේඛණ
මෙම වගුව අදාළ වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට අළුයම විවෘතයේ සංඛ්‍යාලේඛණ මත පදනම්ව නිරූපනය කර ඇති අතර තිරසාර සංවර්ධන සභාව විසින් දක්වා ඇති පරිදි මෙම දර්ශකයේ ගෝලීය අර්ථදැක්වීමට අනුව සෑම වසරකම දෙසැම්බර් 31 යන දිනට සිටින රැඳවියන් ප්‍රමාණය යන අන්තර්ජාතික නිර්නායකය පාදක කරගනිමින් දර්ශකයේ අගය ගණනය කර ඇත.

දඬුවම් නියම නොකළ සිරකරුවන් යනු නීතියෙන් වරදකරුවන් බවට පත් නොවූ සැකකරුවන් පිරිසයි. ශ්‍රී ලංකා බන්ධනාගාර සංඛ්‍යාලේඛණ හා දත්ත -2024 කෙටුම්පතට අනුව 2024 වසරේ වාර්ෂික සිර හා සැක ඇතුලත් වීම් 179,170 ක් වාර්තා වී ඇති අතර ඒ අතුරින් 47,697 ක් සිරකරුවන්ද 131,473ක් සැකකරුවන්ද වේ. එනම් සමස්ථ වාර්ෂික ඇතුලත්වීම් අතුරින් 73.3%ක් සැකකරුවන්ය. ඒ අනුව 2020 වසරේ 1:5 ලෙස හා 2021 වසරේ 1:4 හා 2022 වසරේ දීද 1:4 මෙන්ම 2023 වසරේ දී 1:3 ලෙස පැවති වාර්ෂික සිර:සැක අනුපාතය 2024 වසරේදී 1 : 3 ක් ලෙසම පැවති බව නිරීක්ෂණය වේ.

එමෙන්ම, මෙම සැකකරු ගහනය පාලනය බන්ධනාගාර දෙපාර්තමේන්තු පරිපාලනයෙන් බැහැර වූ පහත කරුණු මතද පදනම්ව ඇත.

1. නොවිසඳුණු නඩු ප්‍රමාණය ඉහළ යාම හා දිගින් දිගට නඩු කල් යෑම.
2. ඇතැම් අවස්ථාවන් වල රජයේ රස පරීක්ෂක වාර්තා වල ප්‍රමාදය.
3. ඇප තැන්පත් කරගත නොහැකි වීම.
4. ඇප පනත නිසි ලෙස ක්‍රියාත්මක නොවීම.
5. මත්ද්‍රව්‍ය වැරදිවලට රිමාණ්ඩ් බන්ධනාගාරගත වන නේවාසිකයින් ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතීම.

එමෙන්ම, බන්ධනාගාරගත සැකකරුවන් පිරිස දිනෙන් දින ඉහළ යාම බන්ධනාගාර දෙපාර්තමේන්තුව හමුවේ පවතින ප්‍රධානතම අභියෝගයකි. 2024 වර්ෂයට අදාළ ශ්‍රී ලංකා බන්ධනාගාර සංඛ්‍යා ලේඛණ කෙටුම්පතට අනුව බන්ධනාගාර තුළ රැඳවීමට හැකියාව පවතින සමස්ථ රැඳවුම 10,395 ක් වේ. පවතින අධික සැකකරු ගහනය හමුවේ 286.6% ක තදබදයක් සමස්ථයක් ලෙස බන්ධනාගාර පද්ධතිය තුළ අදාළ දෛනික මධ්‍යනය බන්ධනාගාරගත රැඳවියන්ට සාපේක්ෂව පෙන්නුම් කරයි.




දත්ත මූලාශ්‍රය - බන්ධනාගාර සංඛ්‍යාලේඛණ වාර්තාව 2024(කෙටුම්පත)

තවද, බොහොමයක් බන්ධනාගාර ආයතන ඉපැරණි ඒවා වන අතර ඒවායේ ඇතැම් ගොඩනැගිලි ඉතාමත් අබලන්ව රැඳවියන් රැඳවීමට නුසුදුසු බවින් අත් හැර ඇත. නගරබද අධිකරණ ආශ්‍රිතව බන්ධනාගාර ස්ථාපනය හා එම ආයතන පුළුල් කිරීමට ප්‍රමාණවත් පරිදි ඉඩකඩ භූමියේ නොමැතිවීම මත රැඳවියන් වෙත අවම ප්‍රමිතීන්ට අනුකූලව නේවාසික පහසුකම් ලබාදීම හා පවතින රැඳවි ගහනයට අනුරූපව සනීපාරක්ෂක පහසුකම් හා අනෙකුත් සේවා සැපයීමද දැවැන්ත අභියෝගයක්ව පවතී. එමෙන්ම පසුගිය කාලපරිච්ඡේදය තුළ බන්ධනාගාර පරිපාලනය මුහුණදුන් කොවිඩ්-19 වසංගත තත්වය හා සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද යටතේ බන්ධනාගාර දෛනික කටයුතු කළමනාකරණයට ද මෙම රිමාණ්ඩ් රැඳවියන් ප්‍රමාණය විශාල අභියෝගයක් විය.

මෙම ගැටළුව පුළුල් ලෙස බන්ධනාගාර දෙපාර්තමේන්තු පස් අවුරුදු සැලැස්ම තුළ හඳුනාගෙන එය කතිකාවට භාජනය කර හඳුනාගත් ක්‍රියාමාර්ග කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගුකාලීන ලෙස අදාල සියළුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ සඳහා දැනටමත් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නංවා ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

- දීර්ඝ කාලීනව රිමාණ්ඩ් බන්ධනාගාරගතව සිටින සැකකරුවන් සම්බන්ධ අධිකරණ කටයුතු වල පවතින ප්‍රමාදයන් වලක්වා ගැනීමට අදාළ තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කිරීම.
- රස පරීක්ෂක වාර්තා ප්‍රමාදය නිසා දීර්ඝ කාලයක් රිමාණ්ඩ් බන්ධනාගාරගතව සිටින නේවාසිකයින්ගේ නඩු අංක සහිත ලේඛණ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර එම වාර්තා කඩිනම් කර ලබා දෙන ලෙසට ඉල්ලුම් කර ඇති අතර ඒ අනුව එම දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර ඇත.
- දින නියම නොවූ නඩු සඳහා දින ලබා ගැනිමට හෝ ඉදිරි ක්‍රියාමාර්ග ගැනිම සඳහා අදාල වාර්තා නියමිත අධිකරණ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරිම.
- ඇප තැන්පත් කර ගත නොහැකිව සිටින නේවාසිකයින් පිළිබඳ වාර්තා අධිකරණ අමාත්‍යාංශය හා අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ලබා දීම.

රිමාණ්ඩ් බන්ධනාගාරගත කිරීමට විකල්පයක් ලෙස කලාපීය රටවල් බොහොමයකම භාවිතා වන නිවාස අඩස්සිය හා ප්‍රදේශ සීමා කිරීම් සම්බන්ධ ව්‍යාපෘති යෝජනාවක් අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

ඇප කොන්දේසි සැපිරිය නොහැකි රිමාණ්ඩ් රැඳවියන් සඳහා විකල්ප ඇප කොන්දේසි පැනවීමට ගරු මහේස්ත්‍රාත්වරුන් වෙත යෝජනා කිරීම.

රිමාණ්ඩ් බන්ධනාගාර ගත නොකොට ඇප ලබා දිය හැකි චෝදනා හා පුනරුත්ථාපනයට යොමු කල හැකි චෝදනා (උදා - රථවාහන වැරදි , මත්ද්‍රව්‍ය සුළු ප්‍රමාණයක් භාවිතයට තබා ගැනීම වැනි) සම්බන්ධව අවශ්‍ය කටයුතු කරන ලෙසට පොලිස්පතිතුමා දැනුවත් කිරීම.

ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ දීර්ඝකාලීනව රිමාණ්ඩ් බන්ධනාගාරගතව රඳවා සිටින රැඳවියන් සම්බන්ධ තොරතුරු අතිගරු ජනාධිපතිතුමන් විසින් පත් කරන ලද ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත සංශෝධනයට පත් කල කමිටුව වෙත ලබා දීම හා එමගින් නඩු කටයුතු කඩිනම් කිරීමට කටයුතු කිරීම, චෝදනා රහිත අයට චෝදනා ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම හෝ ඇප මත හෝ නිදහස් කිරීමට කටයුතු කිරීම.

විෂ වර්ග, අබිං සහ අන්තරායදායකර ඖෂධ වර්ග පිළිබඳ ආඥා පනතේ 54 වගන්තිය යටතේ රිමාණ්ඩ් බන්ධනාගාරගතව සිටින මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධ නේවාසිකයින්ගෙන් 78 වගන්තිය යටතේ චෝදනා පත්‍ර සංශෝධනයටත් ඒ යටතේ අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට පවතින හැකියාව සොයා බැලීම සඳහාත් අවශ්‍ය වන වාර්තා අධිකරණ අමාත්‍යාංශය, අධිකරණ සේවා කොමිෂන් සභාව හා පොලිස් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ නේවාසිකයින් රිමාණ්ඩ් බන්ධනාගාර ගත නොකොට ප්‍රතිකාර හා පුනරුත්ථාපනයට අවශ්‍ය පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් වීරවිල ස්ථාපනයටත් ඊට අදාල නෛතික ප්‍රතිපාදන සලසා ගැනීමටත් අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම. 2021 වසරේ නේවාසිකයින් 350 කින් මෙම මධ්‍යස්ථානය ආරම්භ කරන ලදී. එමෙන්ම අම දිවි රිද්ම වැඩ සටහන යටතේ බන්ධනාගාර වැඩ කඳවුරු 07ක මත්ද්‍රව්‍යට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනයට අවශ්‍ය කටයුතු සලසන ලදී. එමගින් මත්ද්‍රව්‍ය සම්බන්ධව රිමාණ්ඩ් බන්ධනාගාරගත නේවාසිකයින් ප්‍රමාණය අඩු කිරීමටත් ඵලදායී පුනරුත්ථාපනයක් ලබා දීමටත් අපේක්ෂිතය.

විෂ මත්ද්‍රව්‍ය හා අන්තරායකර ඖෂධ භාවිතය වැලැක්වීම සඳහා වන කාර්ය සාධක බලකායක් ගරු. අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුම ක්‍රම ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමන්, ගරු. මහජන ආරක්ෂක අමාත්‍යතුමන් ගේ මූලිකත්වයෙන් හා නාවුක හමුදාපතිතුමන්ගේ සහභාගීත්වයෙන් මීට අදාළ අධිකරණ අමාත්‍යාංශය, සෞඛ්‍ය, ආරක්ෂක,අධ්‍යාපන, නීතිපති හා පොලිස් ආදී වශයෙන් සියළුම පාර්ශවකරුවන්ගේ සමාජිකත්වයෙන් ස්ථාපනය කර ඇත. එමගින් මත්ද්‍රව්‍ය භාවිතය කරන්නන් බන්ධනාගාරගත වීම හා ඒ ආශ්‍රිතව පැන නැගී ඇති බන්ධනාගාර තදබදය පිළිබඳවද ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා සලකා බැලීමට නියමිතය.

මෙම දෙපාර්තමේන්තුවට පාලනය කළ නොහැකි කරුණු ප්‍රමාණයක් මත මෙම රිමාණ්ඩ් රැඳවියන් ඉහළ යාම සිදුවීම හේතුවෙන් ඉහත තිරසාර සංවර්ධන අරමුණු සාක්ශාත් කර ගැනීමේ මෙම දෙපාර්තමේන්තු දත්ත හා බැදී පවතින දර්ශකයේ අපේක්ෂිත ප්‍රගතිය අත්පත් කර ගත නොහැකි වීමට හේතු වී ඇත. අධිකරණ අමාත්‍යාංශය තිරසාර සංවර්ධන සභාව හා එක්ව ඉලක්ක 16 ට අදාළ ජයග්‍රහන දර්ශක අත්පත් කර ගැනීමට හැකි වන සේ දැනට පවතින අභියෝගයන් හඳුනාගෙන ඊට අදාළ කටයුතු නියමිත දිශානතිය සඳහා යොමු කරවීමට කමිටු පත් කර ඇති අතර ඒ සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තු නියෝජනය විසින් 16.3.2 ඉලක්ක අත්පත් කර ගැනීමට අදාළ සියළු තොරතුරු,ක්‍රියාකාරකම් හා වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. එමෙන්ම ඉලක්ක 16.3ට අදාළව ක්‍රියාකාරී සැලැස්මක් සකසා අධිකරණ අමාත්‍යාංශය හා එය යටතේ පවතින ආයතන මට්ටමින් ක්‍රියාත්මක කරමින් පවතී.

මෙම ක්‍රියාකාරී සැලැස්ම යටතේ අධිකරණ අමාත්‍යාංශය හා බන්ධනාගාර දෙපාර්තමේන්තුව මට්ටමින් පහත ක්‍රියාකාරකම් 2024 වසරේදී ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

I. නාගරික ප්‍රදේශ වල පවතින පැරණි බන්ධනාගාර නාගරික පරිසරයෙන් බැහැරව අන්තර්ජාතික අවම සම්මතයන්ට අනුකූලව ඉදිකිරීම - මේ යටතේ කොළඹ බන්ධනාගාර

සංකීර්ණය හොරණ මිල්ලෑව ප්‍රදේශයට විතැන් කිරීමට අදාළ සැලසුම් හා නිර්මාණ කටයුතු සිදුකර ඇත.

II. විශෝධන සේවය ලෙස බන්ධනාගාර සේවය පත්කර එම සේවයේ වෘත්තීයභාවය ගොඩනැංවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම හා විශෝධන සේවා ව්‍යවස්ථාව සැකසීම.

III. ඊ බන්ධනාගාර සංකල්පය හඳුන්වා දීම - මේ යටතේ දකුණු පළාත් බන්ධනාගාර ආයතන කිහිපයක Virtual Courts පහසුකම ඇති කිරීම.

IV. රස පරීක්ෂක වාර්තා කඩිනම් කිරීම සඳහා වන අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතා සපුරා දීම.

V. අමදිවි රිද්ම නමින් බන්ධනාගාරගත වන මත් ද්‍රව්‍යට ඇබ්බැහි නේවාසිකයින් සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථාන බන්ධනාගාර වැඩ කඳවුරු ආශ්‍රිතව ස්ථාපනය කර ඊට අදාළ වැඩ පිළිවෙල ක්‍රියාවට නැංවීම.

VI. බන්ධනාගාර ගත කිරීම අත්‍යාවශ්‍ය නොවන රැඳවි ගහනය පාලනය සඳහා වන විකල්ප දඬුවම් ක්‍රම හඳුන්වා දීම. මේ යටතේ නිවාස අඩස්සි ක්‍රමවේදය ශ්‍රී ලංකාවටද හඳුන්වාදීමට ඇති හැකියාව හා එය කෙසේ අදාළ කර ගත හැකිද යන්න පිළිබඳ ගරු. අධිකරණ, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා ව්‍යවස්ථා කටයුතු අමාත්‍යතුමන් විසින් පත් කරන ලද කමිටුව විසින් අධ්‍යනය කර ලබා දෙන ලද වාර්තාව සඳහා අවශ්‍ය නීති සම්පාදනයට නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව ඇත. ඒ අනුව ඒ පිළිබඳ ඉදිරිකටයුතු සිදුකෙරේ.

VII. පුනරුත්ථාපන හා නිපුණතා සංවර්ධන වැඩසටහන් බන්ධනාගාරගත රිමාණ්ඩ් රැඳවියන් සඳහාද ලබා දීමට කටයුතු කිරීම.

VIII. බන්ධනාගාර ගත රැඳවියන්ගේ තොරතුරු කළමණාකරන පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

IX. නීති ආධාර වැඩ සටහන් බන්ධනාගාර ආයතන මට්ටමින් ක්‍රියාත්මක කිරීම.

X. එක්සත් ජාතීන්ගේ සම්මත රීතීන් යටතේ වන සිරභාරයේ රඳවා තබා නොගෙන ක්‍රියාත්මක කල හැකි (ටෝකියෝ රීතීන්) දඬුවම් නියම කිරීම් සම්බන්ධව පත් කරන ලද කමිටු අධ්‍යනයන් ආරම්භ කිරීම.

XI. බන්ධනාගාර රීතීන් හා දණ්ඩන ප්‍රතිපත්තීන් සංශෝධනය කිරීමට අදාළ කටයුතු ක්‍රියාත්මක කිරීම.

### 5.2.2 ඉලක්ක 16.6 සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා 2024 වර්ෂය වෙනුවෙන් අයවැය මගින් මි.16,881.35ක ප්‍රතිපාදන (පුනරාවර්තන වියදම් සඳහා මි.15,596.35 ක් හා ප්‍රාග්ධන වියදම් සඳහා මි.1,285.00 ලෙස) වෙන් වූ අතර වර්ෂයේ සමස්ථ වියදම මි.16,187.33 දරා ඇත. (පුනරාවර්තන වියදම් සඳහා මි.15,381.60ක් හා ප්‍රාග්ධන වියදම් සඳහා මි.805.73 ලෙස) ඒ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා ඒ යටතේ පවතින ආයතන විසින් අනුමත ප්‍රතිපාදන ප්‍රමාණයෙන් 95.88% උපයෝජනයට කටයුතු කර ඇත.

**බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා 2024 වර්ෂය වෙනුවෙන් අයවැය මගින් රු.මි. 16,881.35 ක ප්‍රතිපාදන වෙන් වූ අතර, වර්ෂයේ සමස්ථ වියදම රු.මි. 16,187.33 ක් දරා ඇත.**

**ඒ අනුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා ඒ යටතේ පවතින ආයතන විසින් අනුමත ප්‍රතිපාදන ප්‍රමාණයෙන් 95.88% උපයෝජනයට කටයුතු කර ඇත.**





# 06

# මානව සම්පත් පැතිකඩ


6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 111

6.2. සේවක සංඛ්‍යා කළමනාකරණය (කරුණු දැක්වීම) 111

6.3. මානව සම්පත් සංවර්ධනය 112

6.4. ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන් දක්වන දායකත්වය 114

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත තනතුරු සංඛ්‍යාව | තථ්‍ය නිලධාරීන් සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 142 | 100 | 59 | 17 |
| තෘතීයික | 148 | 117 | 31 | - |
| ද්විතියික | 7163 | 5549 | 1617 | 03 |
| ප්‍රාථමික | 419 | 316 | 103 | - |
| **එකතුව** | **7872** | **6082** | **1810** | **20** |

## 6.2 සේවක සංඛ්‍යා කළමනාකරණය (කරුණු දැක්වීම)

බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය මූලික වශයෙන් 2013.09.24 දිනැති ලිපිය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇත. එම කාර්ය මණ්ඩලය පුරෝකථනය කර ඇත්තේ එම කාල වකවානුවට අනුරූපව දත්ත පදනම් කර ගෙන වේ. බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා නිලධාරීන් 7872ක් අනුමතව ඇතත් මේ වන විට නිලධාරීන් 1800කට අධික පුරප්පාඩු සංඛ්‍යාවක් පවතින අතර, මේ වන විට පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ඇතැම් තනතුරුවලට බඳවා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. දෛනිකව අධිකරණ මඟින් බන්ධනාගාර ගත කරනු ලබන සිර / සැක ප්‍රමාණය විශාල සංඛ්‍යාවක් වන බැවින් බන්ධනාගාර ආයතන තුළ රඳවා තැබිය හැකි ධාරිතාවය ඉක්මවා රැඳවියන් රඳවා තබා ගැනීමට සිදුවේ. එවැනි පසුබිමක දැනට වසර කීපයකට පෙර සකස්කරන ලද අනුමත කාර්ය මණ්ඩලය තුළද පුරප්පාඩු පැවතීම, නිලධාරි හිඟතාවය නිසා ඇතැම් අවස්ථාවලදී දින කිහිපයක් අඛණ්ඩ සේවයේ යෙදීමට සිදුවීම, අත්‍යාවශ්‍ය රාජකාරි ස්ථානවලට පවා යෙදවීමට නිලධාරීන් නොමැතිවීම, ආවරණය කල නොහැකි තරම් වූ රාජකාරි ප්‍රමාණයක් එක් නිලධාරියකුට පැවරීමට සිදුවීම වැනි හේතු නිසා නිලධාරි දැඩි රැකියා පීඩනයකට හා රැකියා අතෘප්තකර භාවයකට පත්වේ. මෙම කරුණු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය උදෙසා අයහපත් අයුරින් බලපානු ලබන අතර ආයතනයේ කාර්ය සාධනයේ පසුබෑමට දැඩිව බලපානු ලබයි.

බන්ධනාගාර නියාමක නිලධාරීන් 347 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇති අතර, මේ වන විට නිලධාරීන් 144 දෙනෙකු බඳවාගෙන මූලික පුහුණු කටයුතු සිදු කරමින් පවතී.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන නිලධාරි සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| ආධුනික රියදුරු නිලධාරි පුහුණු පාඨමාලාව | 06 | දින 14 | 291,706.25 | - | දේශීය | රියදුරන් සඳහා අවශ්‍ය මූලික දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබාදීම. |
| උසස්වීම් ලද සැරයන් නිලධාරි පුහුණු පාඨමාලාව | 35 | දින 21 | 268,830.00 | - | දේශීය | සැරයන් තනතුර සඳහා අවශ්‍ය මූලික දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබාදීම |
| උසස්වීම් ලද IIපෙල ජේලර් නිලධාරි පුහුණු පාඨමාලාව | 15 | දින 30 | 272,592.00 | - | දේශීය | II පෙල ජේලර් තනතුර සඳහා අවශ්‍ය මූලික දැනුම, ප්‍රායෝගික හා ගිණි අවි පුහුණුව ලබාදීම |
| උසස්වීම් ලද Iපෙල ජේලර් නිලධාරි පුහුණු පාඨමාලාව | 36 | දින 21 | 1,556,398.00 | - | දේශීය | I පෙල ජේලර් තනතුර සඳහා අවශ්‍ය මූලික දැනුම, ප්‍රායෝගික හා ගිණි අවි පුහුණුව ලබාදීම |
| උසස්වීම් ලද සහකාර අධිකාරි පුහුණු පාඨමාලාව | 16 | දින 14 | 821,548.00 | - | දේශීය | සහකාර බන්ධනාගා අධිකාරි තනතුර සඳහා අවශ්‍ය මූලික දැනුම, ප්‍රායෝගික හා ගිණි අවි පුහුණුව ලබාදීම. |
| සංඛ්‍යා දත්ත සකස් කිරීමේ නිලධාරින් සඳහා පුහුණුව | 60 | දින 21 | 57,630.00 | - | දේශීය | රාජකාරි කිරීමේ දී අවශ්‍ය මූලික දැනුම ලබාදීම |
| මෝටර් රථ රියදුරු නිලධාරින් සඳහා පුහුණු වැඩමුළුව | 75 | දින 02 | 249,930.00 | - | දේශීය | රාජකාරි කිරීමේ දී අවශ්‍ය මූලික දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබාදීම |
| උසස්වීම් ලද සහකාර බන්ධ.අධිකාරි (වැ.ආ.) නිලධාරින් සඳහා පුහුණුව | 10 | දින 03 | 126,272.00 | - | දේශීය | රාජකාරි කිරීමේ දී අවශ්‍ය මූලික දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබාදීම |
| සංවර්ධන නිලධාරින් හා කළමණාකරණ සේවා නිලධාරින් සඳහා පුහුණුව | 100 | දින 01 බැගින් පාඨමාලා 03 | 203,925.00 | - | දේශීය | රාජකාරි කිරීමේ දී අවශ්‍ය මූලික දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබාදීම |
| කර්මාන්ත අංශ නිලධාරින් සඳහා පුහුණුව | 110 | දින 03 බැගින් පාඨමාලා 02 | 740,125.00 | - | දේශීය | රාජකාරි කිරීමේ දී අවශ්‍ය මූලික දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබාදීම මූලික ගැටළු සාකච්ඡා කිරීම |

| වැඩසටහනේ නම | පුහුණු කරන නිලධාරි සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| නියාමක නිලධාරින් සඳහා ධාරිතා සංවර්ධන පුහුණුව | 876 | දින 03 බැගින් පාඨමාලා 11 | 5,945,070.00 | - | දේශීය | රාජකාරි කිරීමේදී අවශ්‍ය මූලික දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබාදීම |
| IIපෙල ජේලර් නිලධාරින් සඳහා ධාරිතා සංවර්ධන පුහුණුව | 188 | දින 04 වැඩමුළු 02, දින 03 වැඩමුළු 01 | 1,570,170.00 | - | දේශීය | රාජකාරි කිරීමේදී අවශ්‍ය මූලික දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබාදීම |
| කෘෂිකර්ම අංශ නිලධාරින් සඳහා පුහුණුව | 50 | දින 03 | 231,590.00 | - | දේශීය | රාජකාරි කිරීමේදී අවශ්‍ය මූලික දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබාදීම |
| සැරයන් නිලධාරින් සඳහා ධාරිතා සංවර්ධන පුහුණුව | 255 | දින 03 | 1,797,810.00 | - | දේශීය | රාජකාරි කිරීමේදී අවශ්‍ය මූලික දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබාදීම |
| පුනරුත්ථාපන නිලධාරින් සඳහා පැවැත්වූ උපදේශණය සම්බන්ධ පුහුණුව | 100 | දින 03 | 658,780.00 | - | දේශීය | රාජකාරි කිරීමේදී අවශ්‍ය මූලික දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබාදීම |
| කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨය - | 04 | වසර 03 | 472,500.00 | - | දේශීය | ජේලර් නිලධාරීන්ගේ පරිසාධන මට්ටම ඉහළ නැංවීම |
| ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධ පුහුණුව | 04 | දින 10 | 80,000.00 | - | දේශීය | රාජකාරි කිරීමේ දී අවශ්‍ය මූලික දැනුම හා ප්‍රායෝගික පුහුණුව ලබාදීම |
| සමාජ වැඩ ශාස්ත්‍රපති උපාධිය | 12 | වසර 01 | 500,000.00 | - | දේශීය | සහකාර බන්ධනාගාර අධිකාරිවරුන්ගේ පරිසාධන මට්ටම ඉහළ නැංවීම |
| කැළණිය විශ්ව විද්‍යාලය - විශෝධනය හා පුනරුත්ථාපනය ඩිප්ලෝමාව | 39 | වසර 01 | 1,560,000.00 | - | දේශීය | නිලධාරීන්ගේ පරිසාධන මට්ටම ඉහළ නැංවීම |
| කැළණිය විශ්ව විද්‍යාලය - විශෝධනය හා පුනරුත්ථාපනය උසස් ඩිප්ලෝමාව | 40 | වසර 01 | 2,000,000.00 | - | දේශීය | නිලධාරීන්ගේ පරිසාධන මට්ටම ඉහළ නැංවීම |
| පරිගණක දෘඩාංග පාඨමාලාව | 24 | මාස 03 | 528,000.00 | - | දේශීය | නිලධාරීන්ගේ පරිසාධන මට්ටම ඉහළ නැංවීම |

| වැඩසටහනේ නම | පුහුණු කරන නිලධාරි සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු.) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| මාණ්ඩලික ලිපිකරු අංශ නිලධාරින් සඳහා පැවැත්වූ පුහුණු වැඩමුළුව | 80 | දින 03 | 541,955.00 | - | දේශීය | නිලධාරීන්ගේ පරිසාධන මට්ටම ඉහළ නැංවීම |
| කම්කරු,මුරකරු,කා.සේ.සේ. නිලධාරින් වෙනුවෙන් ධාරිතා සංවර්ධන පුහුණු වැඩමුළුව | 59 | දින 03 | 459,705.00 | - | දේශීය | නිලධාරීන්ගේ පරිසාධන මට්ටම ඉහළ නැංවීම |
| රියදුරු නිලධාරින් සඳහා දමිළ භාෂා පුහුණුව | 30 | මාස 03 | 80,000.00 | - | දේශීය | නිලධාරීන්ගේ පරිසාධන මට්ටම ඉහළ නැංවීම |
| වෙනත් බාහිර පුහුණු පාඨමාලා | - | - | 965,400.00 | - | දේශීය | අවශ්‍යතාවය මත බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය පරිදි සිදු කරනු ලැබේ. |
| ජාත්‍යන්තර විශෝධන හා බන්ධනාගාර සංගමයේ රැස්වීම සඳහා සහභාගිවීම | 02 | 2024.09.01- 2024.09.06 | - | 543,250.00 | විදේශීය - සිංගප්පූරුව | විශෝධනය හා සිරකරුවන් පුනරුත්ථාපනය පිළිබඳ ජාත්‍යන්තර සම්මුතීන් පිළිබඳ නිලධාරීන් නව දැනුමෙන් යාවත්කාලීන කිරීම |
| ආසියානු සහ පැසිෆික් සම්මන්ත්‍රණ පරිපාලකයින්ගේ වැඩමුළුව සඳහා සහභාගිවීම (APCA) | 01 | 2024.11.17- 2024.11.21 | - | 186,000.00 | විදේශීය - හොංකොං | බන්ධනාගාර පරිපාලනය පිළිබඳ යාවත්කාලීන වූ නව ජාත්‍යන්තර දැනුම හා අත්දැකීම් ලබා ගැනීම. |

## 6.4 ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන් දක්වන දායකත්වය

සියළුම ශ්‍රේණීන් හි නිලධාරීන් ආවරණය වන පරිදි ඔවුන්ගේ දැනුම, ආකල්ප, හා කුසලතා වර්ධනය කිරීම වෙනුවෙන් හා ඔවුන්ගේ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුම පුළුල් කිරීමේ අරමුණින් යුක්තව වැඩි පුහුණු වැඩසටහන් ප්‍රමාණයක් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව, පුහුණු වැඩමුළු තුළින් ඒකාකාරී රාජකාරී ජීවිතයක් ගත කරනු ලබන නිලධාරීන්ගේ මානසික සංවර්ධනය ඇතිකිරීම හා වෘත්තීය ජීවිතයට දක්වන කැමැත්ත ඉහළයෑම තුළින් නිලධාරීන්ගේ පරිසාධන මට්ටම ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකියාව ලැබේ. ඒ අනුව එම නිලධාරීන්ගේ රාජකාරී කාර්යක්ෂමතාවය වැඩිවීම තුළින් ආයතනයන් තුල වැඩි සේවයක් සපුරා ගැනීමට හැකියාව ලැබේ. ඒ තුළින් ආයතනයන්හි කාර්ය සාධන මට්ටමද ඉහළ නැංවීමට හැකියාව ලැබේ.



# 07

# අනුකූලතා වාර්තාව

7.1. අනුකූලතා වාර්තාව 117

## 7.1 අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **01** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල වේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | ගිණුම් නොපැවතීම | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | | |
| 1.6 | වෙනත් | අනුකූල නොවේ | | |
| **02** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලී නකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීමපිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **04** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරිම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **05** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | දෙපාර්තමේන්තුව තුල බන්ධනාගාර ආයතන 30ක් පවතින බැවින්, අදාළ තොරතුරු කැඳවීමෙන් පසු පිළිතුරු සකස් කළ යුතුය. එබැවින් විගණන විමසුම් සඳහා නියමිත දිනට පිළිතුරු ලබාදීමේ අපහසුතාවයක් පවතී | විගණනය විසින් දන්වන දිනට විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට කටයුතු කිරීම |
| **06** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූ ලවේ | | |
| **07** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| **08** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **09** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.2 | වාහන ගර්භිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | උසාවි මඟින් ලබාදී ඇති වාහන නියමිත පරිදි පවරා ගැනීමේ ගැටළු පවතින බැවින්, අපහරණය කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ගතවේ. | අපහරණය කල යුතු බවට හඳුනාගෙන ඇති වාහන නියමිත පරිදි පවරාගෙන අපහරණ කටයුතු සිදු කරමින් පවතී. |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | අක්‍රීය ගිණුම් නොමැත | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | වැඩ තහනම් සහ සේවය හැරගිය නිලධාරීන්ගේ ඇප අවශ්‍යතාවය නොමැතිව ලබාදී ඇති ණය අයකර ගැනීමට නොහැකිවී තිබීම. | වර්ෂයකට වැඩි හිඟ ණය ශේෂ නිරවුල් කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් මඟින් දැනුවත් කිරීම. පොලිස් පැමිණිලි සිදු කිරීම, පෞද්ගලික ලිපි මඟින් දැනුවත් කිරීම හා ඇපකරුවන්ගෙන හිඟ ණය අයකර ගැනීම යන ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇත. |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල නොවේ | තැන්පති ගිණුම්වල රජයේ ආදායමට බැර කිරීමට නොහැකි තත්වයේ ශේෂයන් පැවතීම නිසා රජයේ ආදායමට බැර නොකළ වසර 02ක් ඉක්මවූ ශේෂයන් පැවතීම. | තැන්පත් ගිණුම්වල වර්ෂ 02ක් ඉක්මවූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කරන ලෙස බන්ධනාගාර අධිකාරිවරුන්ට උපදෙස් ලබාදී ඇත. |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | ස්ථාන මාරු මණ්ඩල රැස්වීම වැනි අවස්ථාවලදී රැස්වන බැවින් අවසාන රැස්වීම අවස්ථාවද අවසන්වූ පසුව අග්‍රිම නිරවුල් කිරීම සිදු කරන බැවින්, එවැනි අවස්ථාවලදී මාසයකට අධික කාලයක් ගත වීමට සිදුවේ. | නිලධාරීන් තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීමේ දී අදාළ කාර්ය නිම වූ වහාම එය පියවීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදී ඇත. |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19** | මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල නොවේ | සෑම නිලධාරියකුම ආවරණය වන පරිදි පුහුණු අවස්ථා නොලැබේ. | සෑම නිලධාරියකුම ආවරණය වන පරිදි පුහුණු අවස්ථා ඇතුලත්වන ලෙස මානව සම්පත් සැලැස්ම සකස් කිරීමට උපදෙස් ලබාදී ඇත. |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |